# චිත්‍ර කලාව

# 10 ශ්‍රේණිය

## ගුරු මාර්ගෝපදේශය

(2015 සිට ක්‍රියාත්මක වේ)



සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk

# චිත්‍ර කලාව

## ගුරු මාර්ගෝපදේශය

## 10 ශ්‍රේණිය

**(2015 සිට ක්‍රියාත්මක වේ.)**

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk
info@nie.lk

මුද්‍රණය සහ බෙදාහැරීම අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**චිත්‍ර කලාව**

**10 ශ්‍රේණිය**

**ගුරු මාර්ගෝපදේශය**

**ප්‍රථම මුද්‍රණය 2014**

© ජාතික අධ්‍යාපන ආයතනය

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

**වෙබ් අඩවිය** : www.nie.lk
**විද්‍යුත් තැපෑල** : info@nie.lk

*මුද්‍රණය* :

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
මහරගම, නාවින්න, තරංජී ප්‍රින්ට්ස් හි
මුද්‍රණය කොට ප්‍රකාශයට පත් කරන ලදි.

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2015 වර්ෂයේ දී හය වන සහ දහ වන ශ්‍රේණි සඳහා හඳුන්වා දීම කළ යුතු ව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනා ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කරන ලදි. විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම් වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිත කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කරගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනා දී අංශයන් සඳහා අවශ්‍ය වන්නා වූ මාර්ගෝපදේශයන් ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පංති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශයන් උපකාර වනු ඇත. සිසුන්ගේ නිපුණතාවන් වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමය.

මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතනයේ සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයන් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**අධ්‍යක්ෂ ජනරාල්**

**ජාතික අධ්‍යාපන ආයතනය**

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත්කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුමයි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශ, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂය මාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන්හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස්කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගැයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත්විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

## පෙරවදන

සමාජ ප්‍රගමනයෙහිලා මහඟු මෙහෙවරක නියැලෙන්නන් අතර ගුරුවරු ප්‍රමුඛ වෙති. ස්වකීය ජීවිතය සකස් කර ගැනීම සඳහා දරුවන්ට මග පෙන්වන්නෝ ගුරුවරු ය.

2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක කෙරෙන නව විෂය නිර්දේශයට අදාළ ඉගැන්වීම් කටයුතු සාර්ථක කර ගැනීම සඳහා ගුරුවරුන්ට පහසුකම් සැපයීමේ අරමුණින් මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ මුද්‍රණය කර බෙදාහැරීමට අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව කටයුතු කරයි. ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදිත මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය, දරුවන්ට මනා ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කර දීමට අවශ්‍ය මග පෙන්වීම ගුරුවරුන් වන ඔබ වෙත ලබා දෙනු ඇතැයි යන්න මාගේ විශ්වාසයයි.

මේ ප්‍රයත්නය යථාර්ථයක් වන්නේ මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පරිශීලනයෙන් ලබන පරිචය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා යොදා ගැනීමට දරන උත්සාහය මත ය. ඒ සඳ කාර්යය සඳහා කැප වී සිටින ඔබට මාගේ ගෞරවය පිරිනමමි.

**තිස්ස හේවාවිතාන**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්,
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව,
ඉසුරුපාය,
බත්තරමුල්ල.
2014.08.06

# විෂය හැඳින්වීම

අපේ මාතෘභූමියටත්, සංස්කෘතියටත්, සොබාදහම හා සමස්ත ජීව, අජීව විශ්ව ධාතුවටත් හිතකාමී පුරවැසියකු නිර්මාණය කිරීමේ පුළුල් ජාතික පරමාර්ථයෙන් පාසල් පද්ධතිය තුළ දරුවන්ට ඉගෙනීමට ලැබෙන සුවිශේෂතම විෂයය සෞන්දර්ය විෂය යි. එය ජාතික අධ්‍යාපන ආයතනයේ සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව ලෙස අප විසින් හඳුනාගන්නා ලද පහත දැක්වෙන සෞන්දර්ය විෂයයේ ජාතික දැක්ම කියැවීමෙන් ඔබට මැනවින් අවබෝධ වනු ඇත.

සෞන්දර්යයෙන් සංස්කෘතිකමය ලැදියා පුබුදුවා, එමගින් නිර්මාණශීලී බව, සංවේදීතාව, දරා ගැනීම, ශ්‍රී ලාංකේය අනන්‍යතාව හා දේශානුරාගය වඩවා මාතෘ භූමිය කෙරෙහි සංවේදී වූ දරු කැලක් හා සමාජයක් බිහි කිරීම.

("To sensitize students and the community through aesthetics to the Mother Land, endowed with cultural pride, creativity, sSensitivity, tolerance, partriotism and a sense of national identity")

දේශය ගොඩනැංවීමේ දී විශ්වය සමග යහ සබඳතා පවත්වා ගනිමින් පෙරට යන අනාගත පුරවැසියා කෙසේ විය යුතු ද යන්න ගැඹුරින් විමසා බැලීමත් සමග මෙතෙක් පැවති සෞන්දර්ය විෂයයේ ජාතික දැක්ම අතික්‍රමණය කොට මෙම 2015 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණය දෙස නවමු දෘෂ්ටියක් හෙළා ඇති බව එනයින් ම ඔබට පැහැදිලි වනු ඇත.

උසස් රසඥතා ඥානයකින් යුතු මානව හිතවාදී චින්තනයෙහි හෙබි ක්‍රියාශීලී සමාජානුයෝගී පුරවැසියකු ලෙස වැඩ ලෝකයට පිවිසීමට සෞන්දර්ය අධ්‍යාපනයෙන් ලබන ආධ්‍යාත්මික හා ශාරීරික ප්‍රබෝධය ඉවහල් කර ගැනීම අද්‍යතන සමාජ අවශ්‍යතාවකි.

සෞන්දර්ය අධ්‍යාපනයෙන් දරුවකු තුළ සොඳුරු මෙන් ම නිර්මාණශීලී හැකියාවන් හා චින්තනය ප්‍රවර්ධනය කිරීම ද විනය ගරුක, සදාචාරවත් අභිමානවත් පුරවැසියකු තැනීමේ වගකීම ඉටු කිරීම ද දෙවැනි වන්නේ ආගමෙන් මිනිසාට සැලසෙන සේවාවට පමණි.

එබැවින් විද්‍යා, ගණිත, වාණිජ, තාක්ෂණ හා භාෂා විෂයයන්ගෙන් ඥානනය වන මිනිස් සත්ත්වයාට මිනිස් ගුණ උරුම කරදෙන සෞන්දර්ය අධ්‍යාපනික විෂයයන් ඉගෙනීම එදාටත් වඩා අදට සහ හෙටට අත්‍යවශ්‍ය ම බැව් තරයේ ම කිව යුතු ව ඇත.

මෙම විෂයමාලා ප්‍රතිසංස්කරණයත් සමග අභිනවයෙන් 6 ශ්‍රේණියට පැමිණෙන දරුවන් නවමු චින්තනයක් ඇති අළුත් පරපුරක් ලෙස තැනුම උදෙසා පළමු ක්‍රියාකාරකමින් ම ස්වයං පෙලඹවීමක් ඇති වන පරිදි කැමැත්ත හා විශ්වාසය ගුරුවරයා විසින් දිනා ගත යුතු ය. ඒ සඳහා ටිබෙට් ජාතික එස්. මහින්ද හිමියන් අතින් විරචිත "ප්‍රාර්ථනාව" නම් වූ කුඩා ළමා ගීයක් දරුවාගේ ජීවන ප්‍රතිඥාවක් ලෙස දිනපතා පාඩම ඇරඹුමට පෙර ගැයුමට අප යෝජනා කරමු.

| | | | |
|---|---|---|---|
| ස ස ස - | ස ස ස - | රි රි රි - | රි රි රි - |
| හො ඳ දේ ऽ | හි ත මී ऽ | හි තු දේ ऽ | කි ය මී ऽ |
| ස රි ස රි | ස ස රි - | රි ස රි ස | ස ස ස - |
| කි යු දේ ऽ | ක ර මී ऽ | ක ර මි න් | හැ දෙ මී ऽ |

මෙම ප්‍රවේශයත් සමඟ ඇරඹෙන සෞන්දර්යයේ වින්දනාත්මක ඉගෙනුම ජාතික, සංස්කෘතික අනන්‍යතා හා විවිධ සම්ප්‍රදායයන් ස්පර්ශ කරමින් විශ්ව චින්තනයක් කරා දරුවාගේ දැනුම, හැකියා හා ආකල්ප පුළුල් කර ගැනීමට හැකි වන පරිදි විෂය කරුණු මෙහිදී අධ්‍යාපනික හා මනෝ විද්‍යාත්මක පදනමින් යුතු ව ක්‍රමික ව පෙළ ගස්වා ඇත.

එහි දී නායකත්වය, සහභාගිත්වය, ඉදිරිපත් වීම, සුහදත්වය, සාමූහිකත්වය, ඇගැයීම, සවන්දීම, පිළිගැනීම, බෙදාහදා ගැනීම, අන්‍යයන්ට ගරු කිරීම ආදී ආකල්ප සෑම සිසුවකු තුළ ම වර්ධනයට අවස්ථාව සැලසෙන පරිදි අප විසින් යෝජිත ක්‍රියාකාරකම් තවදුරටත් සංවර්ධනය කරමින් ඉගෙනුම් ඉගැන්වීම් පරිසරය සකසා ගැනීමට ගුරුවරයා වශයෙන් ඔබට ද ඉඩකඩ ඇත.

තවද දෛනික ජීවිතයේ දී මුහුණ දෙන විවිධ ගැටලුවලට සාර්ථක ව මුහුණ දී තර්කානුකූල ව හා නිර්මාණාත්මක ව චින්තනය මෙහෙයවා ඒවා විසඳාගැනීමට අවශ්‍ය පුද්ගල ශක්‍යතා වර්ධනය කිරීමට ද අප විසින් වත්මන් පරපුරට දායකත්වය සැපයිය යුතු ව ඇත.

එබැවින් ගුරු භවතුන් ලෙස ඔබ මෙම ගුරු මාර්ගෝපදේශය පෙරට වඩා හොඳින් පරිශීලනය කරන්නේ නම් ඔබගේ ද චින්තනයට අලුත් ආලෝකයක් හා ප්‍රබෝධයක් ලැබෙනු ඇත. ඒ ආලෝක කිරණ ජාතියේ දරු කැල මත පතිත ව ඔවුන් ද ඉමහත් ප්‍රබෝධයෙන් මෙම විෂයය ඉගෙනීමට යොමු වනු නො අනුමාන ය.

එසේ ම කායික හා මානසික සමබරතාවෙන් හෙබි සෞඛ්‍ය සම්පන්න මෙන් ම නීරෝගී දිවිපෙවතක් ගත කිරීමට අවශ්‍ය පුද්ගල ශක්‍යතා සංවර්ධනය කිරීම හා යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩනංවා ගනිමින් ජාතික හා ජාත්‍යන්තර තලයේ නොසැළී කටයුතු කිරීමට විචාරශීලී මනසකින් හෙබි පුද්ගලයකු බිහි කිරීමට වගවීම සෞන්දර්ය අධ්‍යාපන විෂය භාර ව කටයුතු කරන ඔබ අප සැමගේ වගකීම වේ.

ඒ සඳහා 2015 වසරේ සිට 6 ශ්‍රේණියෙන් ඇරඹී ක්‍රියාත්මක වන මෙම නව ප්‍රතිසංස්කරණය දරුවන් හරහා අපි සැම නවමු ලොවකට පිවිසීමේ වැදගත් අවස්ථාවක් ලෙස දකිමින් උද්යෝගයෙන් හා අධිෂ්ඨානයෙන් වඩාත් ඵලදායි සේවාවක් සැලසීමට කැප වෙමු.

**අධ්‍යක්ෂ (සෞන්දර්ය)**
**ජාතික අධ්‍යාපන ආයතනය**

## විෂයමාලා කමිටුව

| | | |
|---|---|---|
| **උපදේශකත්වය හා අනුමැතිය** | : | ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **විෂය සම්බන්ධීකරණය** | : | එම්.ජී.ඒ.කේ.යූ.බණ්ඩාර මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| | : | ඥානසිරි බී.ගමගේ මයා - කථිකාචාර්ය<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |

**විෂය විශේෂඥ උපදෙස්**

| | | |
|---|---|---|
| මහාචාර්ය සුසිරිපාල මාලිම්බඩ | : | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය |
| මහාචාර්ය රම්‍යවර්ධන පොඩිනිලමේ | : | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය |
| ආචාර්ය ටී. සනාතනන් | : | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, යාපනය විශ්වවිද්‍යාලය |
| පි. අභිලන් මයා | : | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, යාපනය විශ්වවිද්‍යාලය |

**ලේඛක මණ්ඩලය**

**අභ්‍යන්තර සම්පත් දායකත්වය**

| | | |
|---|---|---|
| එම්. ජී. ඒ. කේ. යූ. බණ්ඩාර මයා | : | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| ඥානසිරි බී.ගමගේ මයා | : | කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| රවීන්ද්‍ර තේනුවර මයා | : | කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| චමරි තපස්වරගේ මිය | : | සහකාර කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| මනෝරා ප්‍රේමතිලක මිය | : | සහකාර කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |

**බාහිර සම්පත් දායකත්වය**

| | | |
|---|---|---|
| ආචාර්ය උපාලි රංජිත් රණවක | : | කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, බුලත්සිංහල |
| ඩී. එම්. කුමාරි දිසානායක මිය | : | චිත්‍ර කලා ආචාරිනී, ශ්‍රී සුමංගල සිරි මහ විද්‍යාලය |
| එච්. එම්. එස්. පි. එච්. බණ්ඩාර මයා | : | චිත්‍ර කලා ආචාර්ය, ශාන්ත සිල්වෙස්තර විද්‍යාලය,මහනුවර |
| එච්. එන් අනුර ප්‍රියන්ත මයා | : | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, ශ්‍රී ජපුර |
| එස්. ඒ. හර්ෂා මනෝජනී මිය | : | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, හෝමාගම |
| එච්. ඒ සංජීවි මංජරී මිය | : | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, කොළඹ |
| එන්. රාජන් මයා | : | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, තෙන්මරච්චි |
| එම් ඊලමුරුගන් මිය | : | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, වලිහාමම් |

| | | |
|---|---|---|
| **භාෂා සංස්කරණය** | : | රුවිනි සිතිජා ජයකොඩි මිය, සිංහල භාෂා දෙපා.<br>මනෝරා ප්‍රේමතිකලක මිය, සෞන්දර්ය අධ්‍යාපන දෙපා. |
| **පිටකවර නිර්මාණය** | : | රවීන්ද්‍ර තේනුවර මයා, සෞන්දර්ය අධ්‍යාපන දෙපා. |
| **පරිගණක යතුරු ලියනය** | : | ඊ.ලක්ෂමී පෙරේරා මිය, සෞන්දර්ය අධ්‍යාපන දෙපා. |
| **විවිධ සහාය** | : | ඊ. එම්. වික්‍රමනායක මිය සෞන්දර්ය අධ්‍යාපන දෙපා.<br>ප්‍රේමරත්න පෙරේරා මයා සෞන්දර්ය අධ්‍යාපන දෙපා. |

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

මෙම ගුරු මාර්ගෝපදේශය, වර්ෂ 2015 සිට ක්‍රියාත්මක කිරීමට නියමිත චිත්‍ර කලාව 10 ශ්‍රේණිය විෂය නිර්දේශය පදනම් කරගෙන සම්පාදනය කර ඇත. පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා මෙය ඔබ අතට පත්කෙරේ. මෙම පොත පරිශීලනයේ දී පහත කරුණු පිළිබඳ ව ඔබගේ විශේෂ අවධානය යොමු කරන්න.

- පාසලේ වාර්ෂික වැඩ සැලසුමට අනුකූල වන සේ කාලය කළමණාකරණය කරගන්න.

- ප්‍රධාන නිපුණතා 07 ක් යටතේ පෙළගස්වා ඇති අන්තර්ගතයෙහි 1.0 සිට 5.0 දක්වා වන ප්‍රායෝගික නිපුණතාවන්හි නිපුණතා මට්ටම් සඳහා ආදර්ශ ක්‍රියාකාරකමක් ඇතුළත් කර ඇත. එම නිපුණතා මට්ටම්වලට අදාළ ව යෝජනා කර ඇති මාතෘකා හෝ සුදුසු වෙනත් මාතෘකා පදනම් කරගෙන අනෙකුත් ක්‍රියාකාරකම් නිර්මාණය කරගන්න.

- 6.0 හා 7.0 නිපුණාතා සඳහා ක්‍රියාකාරකම් සැලසුමු කර ඇතත්, සුදුසු නිර්මාණශීලී ක්‍රමවේද භාවිත කර, අදාළ විෂය කරුණු සාක්ෂාත් වන සේ ක්‍රියාකාරකම් වෙනස් කර ගැනීමට ඔබට නිදහස ඇත.

- යෝජිත මෙන් ම සම්පාදනය කර ගන්නා ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ දී පහත කරුණු පිළිබඳ ව සැලකිලිමත් වන්න.

  I සෞන්දර්ය හෝ වෙනත් විෂය සමෝධානික රසවත් ඉදිරිපත් කිරීම් මඟින් ප්‍රබෝධාත්මක ආරම්භයක් ලබාගෙන සිසුන් පාඩමට ඇදබැඳ ගැනීම හා පෙර දැනුම විමසීමට පොළඹවා ගැනීම ඔස්සේ ක්‍රියාකාරකමට පිවිසිය යුතු ය.

  II සිසුන්ගේ ශක්‍යතා හඳුනාගෙන නිර්මාණශීලී ඉගෙනුම් ක්‍රම භාවිත කර, ප්‍රතිපෝෂණ හා ඉදිරිපෝෂණ ලබාදෙමින් ක්‍රියාකාරකම අවසානයක් කරා ගෙනයාමෙන් අපේක්ෂිත ඉගෙනුම් පල වෙත ළඟා විය හැකි ය.

  III ඉදිරිපත් කිරීම්, ඇගයීම්, සමාලෝචනය, පසු වැඩ පැවරීම, ඇතුළත් ව සමස්ත පාඩම නිමා කිරීම.

- ගුරු මාර්ගෝපදේශය මගපෙන්වීමක් පමණි. විෂයබද්ධ ග්‍රන්ථ, අන්තර්ජාලය, වැනි මාධ්‍ය පරිශීලනය කිරීමෙන් ගුරුවරයා මෙන් ම ශිෂ්‍යයා ද දැනුමෙන් හා අවබෝධයෙන් සන්නද්ධ වීමෙන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් සාර්ථක කරගත හැකි වේ.

- හඳුන්වා දී ඇති සියලුම නිපුණතා පුද්ගල පෞරුෂ සංවර්ධනය පදනම් කරගෙන ගොඩනගා ඇති බැවින් එම නිපුණතා 07 ම අනිවාර්යයෙන් ම ක්‍රියාත්මක කළ යුතු ය.

  පහත වගුව අනුව ක්‍රියාකාරකම් වාර තුනට බෙදාගත හැකි ය.

| 1 වාරය | | | 2 වාරය | | | | 3 වාරය | |
|---|---|---|---|---|---|---|---|---|
| ක්‍රියාකාරකම් අංකය | | | ක්‍රියාකාරකම් අංකය | | | | ක්‍රියාකාරකම් අංකය | |
| 1.1.1 | 3.1.1 | 7.1.1 | 1.13 | 3.1.2 | 6.2.1 | 7.2.3 | 1.1.5 | 3.2.2 |
| 1.1.2 | 4.1.1 | 7.1.2 | 1.1.4 | 3.1.3 | 6.2.2 | | 1.1.2 | 4.2.1 |
| 2.1.1 | 5.1.1 | 7.1.3 | 1.2.1 | 4.1.2 | 6.3.3 | | 2.2.4 | 6.1.4 |
| 2.1.2 | 6.1.1 | 7.2.1 | 2.2.1 | 4.1.3 | 7.1.3 | | 2.2.5 | 6.1.5 |
| | 6.1.2 | 7.2.2 | 2.2.2 | 5.2.1 | 7.2.1 | | 2.2.6 | 6.1.6 |
| | | 7.2.3 | 2.2.3 | 6.1.3 | 7.2.2 | | 3.2.1 | 7.2.4 |
| | | | | | | | | 7.3.1 |

# පටුන


| | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවුඩය | iv |
| අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් තුමාගේ පණිවුඩය | v |
| හැඳින්වීම | vi-vii |
| විෂයමාලා කමිටුව | viii |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | ix |
| විෂය නිර්දේශය | xi-xxv |
| ඉගෙනුම් ඉගෙන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 01-109 |

# විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටමව | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 පරිසරය ආශ්‍රිත තේමා යටතේ චිත්‍ර සංරචනය කරයි. | 1.1 මානව හා සත්ත්ව රූප ඇතුළත් පරිසරය පුළුල් ව අධ්‍යයනය කර චිත්‍ර සංරචනය කරයි. | ■ පරිසරය හා බැඳුණු මානව හා සත්ත්ව ක්‍රියාකාරකම්<br>■ විවිධ පරිසර ස්වභාව<br>■ චිත්‍ර සංරචනය කිරීමේ මූලික සිද්ධාන්ත භාවිතය<br>• පරිමාණය හා පරිමාව<br>• පර්යාලෝකය<br>• ත්‍රිමාන ලක්ෂණ<br>• සමබරතාව<br>• හැඟීම් ප්‍රකාශනය<br>• නිර්මාණශීලී නිමාව<br>■ වර්ණ භාවිත කිරීමේ විවිධ ශිල්ප ක්‍රම<br>■ විවිධ නිර්මාණ ශෛලීන් | • චිත්‍ර කලා සිද්ධාන්ත භාවිත කර මානව හා සත්ත්ව රූප ඇතුළත් චිත්‍ර සංරචනය කරයි.<br>• මහනුවර යුගයේ උඩරට සම්ප්‍රදායික කලා ලක්ෂණ භාවිත කරමින් නව නිර්මාණාත්මක චිත්‍ර සංරචනය කරයි. | 16 |
| | 1.2 මහනුවර යුගයේ උඩරට සම්ප්‍රදායේ සිතුවම් හි සම්ප්‍රදායික කලා ලක්ෂණ ඇසුරෙන් චිත්‍ර සංරචනය කරයි. | ■ සම්ප්‍රදායික චිත්‍ර සම්පිණ්ඩනය කිරීමේ සිද්ධාන්ත භාවිතය<br>• පරිමාණය හා පරිමාව<br>• ද්විමාන ලක්ෂණ<br>• සමබරතාව<br>• ප්‍රකාශන ශක්තිය<br>• නිර්මාණශීලී නිමාව<br>■ රේඛා භාවිතය<br>■ රූප භාවිතය<br>■ වර්ණ භාවිතය හා ශිල්ප ක්‍රම (පෝස්ටර්/ පැස්ටල් වර්ණ)<br>■ තලය භාවිතය | | |

| නිපුණතාව | නිපුණතා මට්ටමව | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 2.0 පරිසරයේ පවත්නා වස්තු සම්පිණ්ඩනාත්මකව චිත්‍රණය කරයි. | 2.1 විවිධ ස්වභාවික හා නිර්මිත වස්තු නිරීක්ෂණය කර දළ සටහන් අඳියි. | ■ විවිධ ස්වභාවික හා නිර්මිත වස්තු රේඛා ආශ්‍රිත අධ්‍යයනය<br>• රේඛාවේ විවිධතා<br>• එළිය හා අඳුර<br>• ත්‍රිමාන ලක්ෂණ | • ද්‍රව්‍ය සම්පිණ්ඩනයේ ගති ස්වභාවය හොඳින් නිරීක්ෂණය කර දළ සැලසුම් අඳියි.<br>• තලයට ගැළපෙන සේ පරිමාණානුකූලව හා පර්යාලෝක ලක්ෂණ නිවැරදි භාවිතයෙන් ද්‍රව්‍ය සමූහය සංරචනය කරයි. | 16 |
| | 2.2 ස්වභාවික හා නිර්මිත වස්තු සම්පිණ්ඩනාත්මකව චිත්‍රණය කරයි. | ■ සංරචනය කිරීමේ මූලික සිද්ධාන්ත භාවිතය<br>• පරිමාණය හා පරිමාව<br>• පර්යාලෝකය<br>• ත්‍රිමාන ලක්ෂණ හා එළිය අඳුර<br>• සමබරතාව<br>■ තලය භාවිතය<br>■ මතුපිට ස්වභාවය (වයනය)<br>■ වර්ණ භාවිතය හා ශිල්ප ක්‍රම<br>• දියසායම්<br>• පැස්ටල්<br>• මිශ්‍ර මාධ්‍ය | • විවිධ වර්ණ මාධ්‍යවලට උචිත ශිල්ප ක්‍රම භාවිතයෙන් වස්තූන්ගේ ත්‍රිමාන ලක්ෂණ හා ගති ස්වභාවන් මතුවන සේ වර්ණ කරයි.<br>• වර්ණ කිරීමේ ස්වාධීන රටා/ශෛලී ප්‍රශස්ත ලෙස භාවිත කරයි.<br>• සෛද්ධාන්තික විෂය කරුණු ප්‍රායෝගිකව හා නිවැරදිව භාවිත කරමින් නිර්මාණකරණයේ නියැලෙයි.<br>• සම්මත ඇගයීම් නිර්ණායක මත පිහිටා නිර්මාණ ඇගයීමට හා රසවින්දනයට යොමු වෙයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටමව | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0 පාරිහාරික අවශ්‍යතා සඳහා මෝස්තර නිර්මාණකරණයේ යෙදෙයි. | 3.1 නව සැලසුම් සංකල්ප භාවිත කර පාරිහාරික අවශ්‍යතා සඳහා නිර්මාණ කරයි. | ■ පාරිහාරික අවශ්‍යතා<br>■ මෝස්තර සිද්ධාන්ත<br>• සමබරතාවය<br>• රිද්මය<br>• ඒකත්වය<br>■ සැලසුම් සංකල්ප<br>■ නිර්මාණාත්මක හැඩ<br>■ ද්විමාන හා ත්‍රිමාන නිර්මාණ<br>• පතාක<br>• පහන්<br>• විදුලි පහන් ආවරණ | • භාණ්ඩ හා සැරසිලි නිර්මාණය සඳහා නව සැලසුම් සංකල්ප භාවිත කරයි.<br>• ස්වභාවික පරිසරය ඇසුරෙන් නිර්මාණකරණයේ යෙදෙයි.<br>• එදිනෙදා ජීවිතයේ දී සංයමයෙන් කටයුතු කරයි.<br>• තමා වෙත පැවරෙන කටයුතු පිළිවෙළින් නිම කරයි. | 12 |
| | 3.2 නව සැලසුම් සංකල්ප භාවිත කර පාරිහාරික අවශ්‍යතා සඳහා ව්‍යාප්ත සැරසිලි නිර්මාණය කරයි. | ■ සැරසිලි ඒකක<br>■ මෝස්තර සිද්ධාන්ත<br>■ වර්ණ භාවිතය<br>■ රෙදි මෝස්තර<br>• ළමුන් සඳහා<br>• වැඩිහිටියන් සඳහා | | |
| | 3.3 ස්වභාවික හැඩ සහ වර්ණ භාවිතයෙන් භාණ්ඩ හා සැරසිලි නිර්මාණය කරයි. | ■ පාරිහාරික භාණ්ඩ<br>■ ස්වභාවික හැඩ<br>• නිර්මාණාත්මක සැරසිලි ඒකක<br>■ ස්වභාවික හැඩයන් සඳහා වර්ණ භාවිතය<br>• වර්ණ පටිපාටිය<br>• මල් කොළ ඇසුරෙන් ව්‍යාප්ත සැරසිලි | | |

| නිපුණතාව | නිපුණතා මට්ටමව | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 4.0 නිෂ්පාදන හා සේවා අවශ්‍යතා සඳහා ග්‍රැෆික් නිර්මාණ කරයි. | 4.1 විවිධ නිෂ්පාදන හා සේවා ප්‍රචාරණය සඳහා ග්‍රැෆික් නිර්මාණ කරයි. | ■ අවශ්‍යතාව<br>■ සැලසුම<br>■ මුද්‍රණයට යෝග්‍ය බව<br>■ සන්නිවේදනාර්ථ<br>■ නිර්මාණාත්මක අක්ෂර<br>■ වර්ණ මාධ්‍ය<br>• දවටන<br>• ලාංඡන<br>• ආරාධනා පත්‍ර | • විවිධ නිෂ්පාදන හා සේවා ප්‍රචාරණය සඳහා මුද්‍රණයට යෝග්‍ය නිර්මාණාත්මක අක්ෂර අඩංගු සන්නිවේදන අර්ථ ගැබ් වූ ලේබල්, දවටන, ලාංඡන, පෝස්ටර්, ඇරයුම් පත්‍ර නිර්මාණය කරයි. | 08 |
| | 4.2 ගීතයකට/ කවියකට/ නිසඳැසකට උචිත සන්නිදර්ශන චිත්‍ර නිර්මාණය කරයි. | ■ සන්නිදර්ශන චිත්‍රයක අඩංගු ලක්ෂණ<br>• රේඛාකරණය<br>• හැඩතල<br>• වර්ණ | • ගීත, කවි, නිසඳැස්වලට උචිත සන්නිදර්ශන චිත්‍ර නිර්මාණය කරයි. | |
| 5.0 විවිධ මාධ්‍ය භාවිතයෙන් මූර්ති හා කැටයම් නිර්මාණය කරයි. | 5.1 නිර්මාණාත්මක හැඩතල භාවිතයෙන් උන්නත කැටයම් නිර්මාණය කරයි. | ■ නිර්මාණාත්මක හැඩතල භාවිතයෙන් උන්නත කැටයම් නිර්මාණය<br>• විවිධ මාධ්‍ය<br>• උචිත බව<br>• සම්පිණ්ඩනය<br>• නිර්මාණාත්මක බව | • නිර්මාණාත්මක හැඩතල සම්පිණ්ඩනය කර උන්නත කැටයම් නිර්මාණය කරයි.<br>• නිර්මාණකරණය සඳහා විවිධ මාධ්‍ය භාවිත කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටමව | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 5.2 ඇඟීමේ ශිල්ප ක්‍රමය භාවිතයෙන් මිනිස් හිසක් නිර්මාණය කරයි. | ■ මිනිස් හිසක් නිර්මාණය<br>• විවිධ මාධ්‍ය<br>• උචිත බව<br>• සම්පිණ්ඩනය<br>• නිර්මාණාත්මක බව | • ඇඟීමේ ශිල්පක්‍රමය භාවිතයට ගනියි.<br>• ශිල්ප ක්‍රම පිළිබඳ අවබෝධයෙන් මිනිස් හිසක් නිර්මාණය කරයි.<br>• නිර්මාණකරණයේ දී මාධ්‍ය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි. | |
| 6.0 ආගමික හා සංස්කෘතික අංග, දෙස් විදෙස් තෝරාගත් ශිල්පීන්ගේ කලා කෘතින්, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලීව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි. | 6.1 තෝරාගත් දේශීය ශිල්පීන්ගේ නිර්මාණ රසාස්වාදය කරයි. | ■ වස්තු විෂය, කලා ආභාස, ශෛලිය, මාධ්‍යය හා ශිල්ප ක්‍රම, භාව ප්‍රකාශන, සංරචන ක්‍රම හා කලා ලක්ෂණ අධ්‍යයනය<br>• එම්. සාර්ලිස්<br>– සිදුහත් කුමරු සහ මව් බිසව<br>– පියුම්පිට වැඩීම<br>• සෝලියස් මෙන්ඩිස්<br>– හේමමාලා හා දන්ත කුමරු දන්ත ධාතුව වැඩම කරවීම<br>– සංඝමිත්තා මෙහෙණින් වහන්සේ ශ්‍රී මහා බෝධිය වැඩම කරවීම<br>• ජෝර්ජ් කීට්<br>– මාර පරාජය (බොරැල්ල ගෝතමී විහාරය)<br>– නායිකා චිත්‍ර<br>• ඩේවිඩ් පේන්ටර්<br>– ජයග්‍රාහී ලෙස ජෙරුසලමට ඇතුල්වීම<br>– යහපත් සමරිතානුවරයා (Good Samarithan) | • ආගමික තේමා වස්තු විෂය කර ගත් නූතන දේශීය ශිල්පීන්ගේ නිර්මාණවල සුවිශේෂතා විස්තර කරයි.<br>• එම ආගමික කලා නිර්මාණ සඳහා බලපෑ ආභාස සංසන්දනාත්මක ව විග්‍රහ කරයි.<br>• නව ආගමික චිත්‍ර සම්ප්‍රදායවල මූලිකාංග හා මූලධර්ම විස්තර කරයි.<br>• ස්වයං නිර්මාණකරණයට ආභාස කර ගනියි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටමව | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | • තාවඩි තුරේයිසාමි<br>- සුදු කුකුළාගේ රූපය<br>- පූජක හා ගණපති රූපය<br>• පෙරියතම්බි සුබ්‍රමණියම්<br>- අගස්තියර් හා විනායගර්<br>- ඇතා විසින් වල්ලිව එළවාගෙන යාම | | |
| | 6.2 තෝරාගත් විදේශීය ශිල්පීන්ගේ කලා කෘති රසාස්වාදය කරයි. | ■ වස්තු විෂය, කලා ආභාස, ශෛලිය, මාධ්‍ය හා ශිල්ප ක්‍රම, භාව ප්‍රකාශන, සංරචන ක්‍රම හා කලා ලක්ෂණ අධ්‍යයනය<br>• ලියනාඩෝ ඩාවින්චි<br>- පර්වත මස්තකයේ දේවමෑණියෝ<br>- අවසාන භෝජන සංග්‍රහය<br>- මොනාලිසා<br>• මයිකල් ආන්ජිලෝ<br>–පියෙටා<br>- ඩේවිඩ්<br>- ආදම් මැවීම<br>– අවසන් විනිශ්චය<br>• රෆායල් සන්සියෝ<br>– ඇතැන්ස් ගුරුකුලය<br>– මැඩෝනා චිත්‍ර<br>තණපිටියේ සිටින මැඩෝනා (Madonna of the Meadow)<br>මැඩෝනා ඩෙලා සෙදියා (Madonna Della Sedia) | • පුනරුද කලා නිර්මාණ සඳහා බලපාන ලද සමාජ පසුබිම විස්තර කරයි.<br>•පුනරුද ශිල්පීන්ගේ කලා නිර්මාණ සංසන්දනාත්මකව විග්‍රහ කරයි.<br>• කලා නිර්මාණ ඇගයීමේ හා රසවිඳීමේ හැකියාව ලබයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටමව | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 7.0 දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලාවන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි. | 7.1 ගම්පොළ යුගයේ ගෘහ නිර්මාණ, චිත්‍ර, මූර්ති හා කැටයම් අධ්‍යයනය කරයි. | ■ ඓතිහාසික පසුබිම, වස්තු විෂය, ශෛලිය, ආභාස, මාධ්‍යය, ශිල්ප ක්‍රම හා කලා ලක්ෂණ<br>• ගඩලාදෙණිය විහාරය<br>• ලංකාතිලක විහාරය<br>- ගෘහ නිර්මාණ<br>- කැටයම්<br>- බිතු සිතුවම්<br>- මූර්ති<br>- නිර්මාණ ශිල්පීන්<br>• ඇම්බැක්කේ දේවාලය<br>- ගෘහ නිර්මාණ<br>– කැටයම්<br>- නිර්මාණ ශිල්පීන් | • ගම්පොල යුගයේ ගෘහ නිර්මාණ, චිත්‍ර, මූර්ති, කැටයම්වල ඓතිහාසික තොරතුරු විස්තර කරයි. | 12 |
| | 7.2 මහනුවර යුගයේ උඩරට සම්ප්‍රදායේ ගෘහ නිර්මාණ, චිත්‍ර, මූර්ති හා කැටයම් අධ්‍යයනය කරයි. | ■ ඓතිහාසික පසුබිම, වස්තු විෂය, ශෛලිය, මාධ්‍යය, ශිල්ප ක්‍රම හා කලා ලක්ෂණ<br>• දළදා මාළිගාව<br>• මැදවල ටැම්පිට විහාරය<br>• දෙගල්දොරුව රජමහා විහාරය<br>• දඹුලු විහාරය<br>– ගෘහ නිර්මාණ<br>- බිතු සිතුවම්<br>– මූර්ති<br>- නිර්මාණ ශිල්පීන් | • මහනුවර යුගයේ උඩරට සම්ප්‍රදායයේ ගෘහ නිර්මාණ, චිත්‍ර, මූර්ති, කැටයම්වල විශේෂතා හඳුනා ගනියි.<br>• ඒවා ඇසුරෙන් නිර්මාණකරණයේ යෙදෙයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටමව | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 7.3 ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් කලා නිර්මාණ අධ්‍යයනය කරයි | ■ ඓතිහාසික පසුබිම, වස්තු විෂය, ශෛලිය, මාධ්‍යය හා ශිල්ප ක්‍රම<br>• මූර්ති නිර්මාණ<br>- පූජක රුව<br>- නළඟන රුව<br>- කවන්ද රූප<br>• මුද්‍ර නිර්මාණ<br>- පශුපති<br>- වෘෂභ රූප | • ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් කලා නිර්මාණවල සුවිශේෂී කලා ලක්ෂණ විස්තර කරයි. | |
| | 7.4 ඊජිප්තු හා ග්‍රීක කලා කෘති අධ්‍යයනය කරයි. | ■ ඓතිහාසික පසුබිම, වස්තු විෂය, ශෛලිය, මාධ්‍යය, ශිල්ප ක්‍රම හා කලා ලක්ෂණ<br>• ඊජිප්තු මූර්ති<br>– නෙෆර්ටිටි (NEFERTITI)<br>– ලියන්නා (SCRIBE)<br>– ස්පින්ක්ස් (SPHINX)<br>• ඊජිප්තු චිත්‍ර<br>– මීඩම් හි පාත්තයෝ (GEESE OF MEDIUM)<br>– කුරුළු දඩයම (FOWLING SCENE)<br>• ග්‍රීක මූර්ති<br>- වීනස් ඩි මෙලෝ (VENUS DE MILO)<br>- කවපෙත්ත විසිකරන්නා (DISCOBOLUS) | • මිසර හා ග්‍රීක කලාවන්හි සුවිශේෂතා සංසන්දනාත්මකව විග්‍රහ කරයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටමව | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | - හර්මීස් සහ ඩයොනීසස් (HERMES AND DIONYSUS)<br>- ඇතීනා දෙවඟන (ATHENA PARTHENOS)<br>- ලැඔකූන් (LAOCOON) | | |

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

| | | |
|---|---|---|
| **නිපුණතාව 1.0** | : | **පරිසරය ආශ්‍රිත තේමා යටතේ චිත්‍ර සංරචනය කරයි.** |
| **නිපුණතා මට්ටම 1.1** | : | **මානව හා සත්ත්ව රූප ඇතුළත් පරිසරය පුළුල්ව අධ්‍යයනය කර චිත්‍ර සංරචනය කරයි.** |
| **ක්‍රියාකාරකම 1.1.1** | : | **"වරෙල්ලා වරෙල්ලා - වැල්ලට ඔරු ඇවිල්ලා"** |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | : | **02 යි** |

**ඉගෙනුම් පල** :
- ධීවර ජන සංස්කෘතියේ ස්වභාවය විස්තර කරයි.
- ධීවර ජන ජීවිතයේ අභියෝගාත්මක බව ප්‍රකාශ කරයි.
- ධීවර ජන ජීවිතය පිළිබඳ ව සහකම්පනයෙන් කතා කරයි.
- ධීවර ජන ජීවිතයේ ස්වභාවයන් දැක්වෙන චිත්‍ර නිර්මාණය කරයි.
- නිම කළ කෘති රසවිඳියි, අගය කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- ධීවර ජන ජීවිතයේ ක්‍රියාකාරකම් හා සම්බන්ධ රූපසටහන්, සිතුවම්.
- පාඩම සංවර්ධනය කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස්:**

**පියවර 1.1.1.1** :
- ධීවර පරිසරය හා සම්බන්ධ ගීතයක් ගායනා කරමින් හෝ ශ්‍රවණයට සලස්වමින් පාඩමට පිවිසෙන්න.
- ජීවිතය ජය ගැනීමට ධීවර ජනතාව දරන උත්සාහය පිළිබඳව විවිධ නිදර්ශන චිත්‍ර ඉදිරිපත් කරමින් අදාළ ජන සංස්කෘතික ලක්‍ෂණ පිළිබඳව සාකච්ඡා කරන්න.
- විවිධ ඉරියව් හා හැඟීම් ප්‍රකාශිත චර්යා රටා පිළිබඳව සිසුන්ගෙන් විමසන්න.
- ධීවර ජන ජීවිතයේ විවිධ සංසිද්ධි මතුවන සේ චිත්‍ර නිර්මාණය කළ හැකි බව අවධාරණය කරන්න.

(මිනිත්තු 05 යි)

**පියවර 1.1.1.2** :
- ධීවර ජනජීවිතය, පිළිබඳ ව තෝරාගත් සංසිද්ධියක් චිත්‍රණය කිරීමට යොමු කරවන්න.
- නිර්මාණකරණයට අවශ්‍ය උපකරණ භාවිතයට මග පෙන්වන්න.
- ධීවර ජන ජීවිතය හා සබැඳි තෝරාගත්, අවස්ථාවකට අදාළ දළ සටහන් ඇඳීමට සිසුන් යොමු කරවන්න.
- දළ සටහන් ඇසුරින් නිම කළ කෘතිය සම්පිණ්ඩනය කර අභිමත ක්‍රම ශිල්පයකට අනුව වර්ණ ගැන්වීමට යොමු කරවන්න.
- සිද්ධාන්ත භාවිතය පිළිබඳ ව දැනුවත් කරන්න.

(මිනිත්තු 60 යි)

**පියවර 1.1.1.3** :
- අහඹු ලෙස තෝරාගත් සිසු නිර්මාණ පංතියට ඉදිරිපත් කරවන්න.
- නිර්මාණ පිළිබඳ ව ස්වයං ඇගයීමක් කිරීමට අවස්ථාව ලබාදෙන්න.

- නිර්මාණ පිළිබඳ ව සංවර්ධනාත්මක අදහස් ඉදිරිපත් කිරීමට අනෙකුත් සිසුන් යොමු කරවන්න.
- සිසුන්ගේ චිත්‍ර නිර්මාණ ඇසුරෙන් චිත්‍ර ඇඳීමේ සිද්ධාන්ත ඔබේ අදහස් සංක්ෂිප්ත ව දක්වන්න.

(මිනිත්තු 15 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පදනම් කරගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- ධීවර පරිසරයේ විවිධ අවස්ථා හා සංසිද්ධීන් පිළිබඳ සාකච්ඡා කිරීම
- තමා සිත්ගත් අවස්ථාවක් චිත්‍රණය සඳහා තෝරා ගැනීම
- සිද්ධාන්තමය ලක්ෂණ මතුවන සේ චිත්‍රය නිර්මාණය කිරීම
- අන් අයගේ නිර්මාණ රසවිඳිමින් අගය කිරීම

♦ **පහත මාතෘකා යටතේ අනෙකුත් ක්‍රියාකාරකම් සැලසුම් කර ගන්න.**

| | |
|---|---|
| 1.1.2 නිදහසේ සැරිසරන වනසතුන් | - කාලච්ඡේද 02 |
| 1.1.3 ප්‍රිය සම්භාෂණයක් | - කාලච්ඡේද 02 |
| 1.14 ජන ක්‍රීඩාවක සිත්ගත් අවස්ථාවක් | - කාලච්ඡේද 02 |
| 1.1.5 ජනාකීර්ණ වීථියක් | - කාලච්ඡේද 02 |

**නිපුණතාව 1.0 : පරිසරය ආශ්‍රිත තේමා යටතේ චිත්‍ර සංරචනය කරයි.**

**නිපුණතා මට්ටම 1.2 : මහනුවර යුගයට අයත් උඩරට විහාර බිතු සිතුවම්හි සම්ප්‍රදායික කලා ලක්ෂණ ඇසුරෙන් චිත්‍ර සංරචනය කරයි.**

**ක්‍රියාකාරකම 1.2.1 : ''ආගමික කටයුතුවල නිරතවන බැතිමතුන්''**

**කාලච්ඡේද සංඛ්‍යාව :** 03 යි

**ඉගෙනුම් පල :**

- විවිධ ආගමික වත් පිළිවෙත් හා ඒ හා බැඳි පාරිසරික තත්ත්ව පිළිබඳ විස්තර කරයි.
- ආගමික කටයුතුවල දී විවිධ ජාතීන්ට අනන්‍ය වූ ලක්ෂණ පැහැදිලි කරයි.
- පාරම්පරික චිත්‍ර සම්ප්‍රදායට අනුව ආගමික වතාවත් තේමාවට චිත්‍ර සංරචනය කිරීමේ ක්‍රම ශිල්ප සොයා බලයි.
- මහනුවර යුගයේ උඩරට ශෛලිගත සම්ප්‍රදායට අනුගත ව චිත්‍ර නිර්මාණය කරයි.
- නිර්මාණ රසවිඳිමින් අගය කරයි.

**ගුණාත්මක යෙදවුම් :**

- විවිධ ආගමික වතාවත් සහිත නිදර්ශන චිත්‍ර
- මහනුවර යුගයේ උඩරට විහාර බිතු සිතුවම් සහිත නිදර්ශන
- පාඩම සංවර්ධනය කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ
- ඇමුණුම 1.2.1.1 ට ඇතුළත් ගවේෂණ / කාර්ය උපදෙස් පත්‍රිකාවේ පිටපත්

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස්:**

**පියවර 1.2.1.1 :**

- පාසලේ පවත්නා ආගමික පරිසරයට උචිත ආගමික සංකේතයක් ආගමට අගෞරවයක් නොවන පරිදි, සිසුන්ගේ කුතුහලය හා අවධානය යොමුවන ලෙස පන්ති කාමරයට රැගෙන විත් ඒ ඇසුරින් පාඩමට පිවිසෙන්න.
- විවිධ ආගමික වතාවත් පිළිබිඹු වන චිත්‍ර නිදර්ශන පෙන්වමින් ඒ හා සබැඳි ඉරියව්, ඇඳුම්, පැලඳුම්, විවිධ සැරසිලි අලංකරණ හා පරිසර ස්වභාව පිළිබඳ ව අවධානය යොමු කරවන්න.
- මහනුවර යුගයේ උඩරට විහාර සිතුවම් ප්‍රදර්ශනය කරමින් එහි සුවිශේෂ ලක්ෂණ හා සංස්කෘතික වටිනාකම් පිළිබඳ සාකච්ඡාවක් මෙහෙවන්න.
    - චිත්‍ර මූලධර්ම (මහනුවර සම්ප්‍රදායික චිත්‍ර)
    - රේඛා හා වර්ණ භාවිතය
    - ඇඳුම් පැලඳුම්
    - විලාසිතා, සැරසිලි මෝස්තර

(මිනිත්තු 15 යි)

පියවර 1.2.1.2 :

- ඇමුණුම අංක 1.2.1.1 ට ඇතුළත් ගවේෂණ /කාර්ය උපදෙස් පත්‍රිකාව අභිමත ක්‍රමවේදයකට අනුව සිසුන්ට ලබාදෙන්න.
- නිදර්ශන චිත්‍ර ආශ්‍රිත ව සාකච්ඡා කරන ලද ආගමික වතාවත් තේමා කරගෙන සිත්ගත් අවස්ථාවක් පැන්සල භාවිත කරමින් ශෛලිගත ක්‍රමයට නිර්මාණය කිරීමට යොමු කරවන්න.
- චිත්‍ර නිර්මාණය සඳහා අවශ්‍ය උපකරණ භාවිතයට මඟ පෙන්වන්න.
- රේඛා භාවිතයෙන් ගොඩනඟන ලද චිත්‍රය මහනුවර යුගයේ උඩරට විහාර චිත්‍ර ඇසුරින් සම්ප්‍රදායානුකූල ව වර්ණ ගැන්වීමට අවශ්‍ය උපදෙස් හා මඟ පෙන්වීම් ලබාදෙන්න.
- නිර්මාණය කරන ලද චිත්‍ර පන්ති කාමරයේ ප්‍රදර්ශනය කිරීම සඳහා සූදානම් කරන්න.

(මිනිත්තු 90 යි)

පියවර 1.2.1.3 :

- සිසුන්ගේ නිර්මාණ පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරවන්න.
- නිර්මාණය පිළිබඳ ව ස්වයං ඇගයීමකට අවස්ථාව සලසන්න.
- නිර්මාණය පිළිබඳ ව සංවර්ධනාත්මක අදහස් ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබාදෙන්න.

(මිනිත්තු 05 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පදනම් කරගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- විවිධ ආගමික වතාවත් හා සබැඳි සිද්ධීන් හා අවස්ථා නම් කිරීම
- මහනුවර යුගයේ උඩරට විහාර චිත්‍ර ශෛලීය ලක්ෂණ හා සංරචන ශිල්ප ක්‍රම පැහැදිලි කිරීම
- උඩරට චිත්‍ර ශෛලිය ලක්ෂණ අනුව ආගමික වතාවත් හා සිද්ධි චිත්‍ර සංරචනය කිරීමේ ක්‍රම ශිල්ප සොයා බැලීම
- මහනුවර යුගයේ උඩරට සම්ප්‍රදායට අනුව චිත්‍ර නිර්මාණය කිරීම
- නිර්මාණ අගය කිරීම

**ඇමුණුම 1.2.1.1**

## ගවේෂණ/ කාර්ය උපදෙස් පත්‍රිකාව

- පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන ආගමික වතාවත් සහිත චිත්‍ර නිදර්ශන හොඳින් නිරීක්ෂණය කරන්න.
- එම අවස්ථාවලට අයත් සිද්ධි හා ඒවායේ ඉරියව්, ගතිලක්ෂණ හා භෞතික පරිසරය හඳුනාගන්න.
- ඉදිරිපත් කර ඇති මහනුවර යුගයේ උඩරට විහාර චිත්‍ර නිදර්ශන ඇසුරින් ඔබ තෝරාගත් මාතෘකාව නිර්මාණය කරන්න.
- රේඛාවෙන් අඳින ලද චිත්‍රය මහනුවර යුගයේ සම්ප්‍රදායික ලක්ෂණ සහිත ව වර්ණ ගන්වන්න.
- නිර්මාණය කරන ලද චිත්‍ර පංතිකාමරයේ ප්‍රදර්ශනය කිරීමට සූදානම් කරන්න.

♦ **පහත මාතෘකාව යටතේ තවත් ක්‍රියාකාරකමක් සැලසුම් කරගන්න.**

1.2.2 රන් දැතයි සරු පොළොවයි - කාලච්ඡේද 03

**නිපුණතාව 2.0 :** **පරිසරයේ පවත්නා ද්‍රව්‍යයන් සම්පිණ්ඩනාත්මකව චිත්‍රණය කරයි.**

**නිපුණතා මට්ටම 2.1 :** **විවිධ ස්වභාවික හා නිර්මිත වස්තූන් නිරීක්ෂණය කර දළ සටහන් අඳියි.**

**ක්‍රියාකාරකම 2.1.1 :** **''සනක හැඩැති වස්තුවක්, බාල්දියක්, වීදුරු බෝතලයක්, තැඹිලි ගෙඩියක් රේඛාවෙන් අධ්‍යයනය කරමු.''**

**කාලච්ඡේද සංඛ්‍යාව :** **02 යි**

**ඉගෙනුම් පල :**

- ධාරකය මත තබා ඇති භාණ්ඩ සමූහයේ එකිනෙකට වෙනස් වූ හැඩ හා මතුපිට ස්වභාව ඇති බව විස්තර කරයි.
- තලයට ගැළපෙන සේ පරිමාණානුකූලව භාණ්ඩ සමූහය රේඛාවෙන් ඇඳ දක්වයි.
- චිත්‍ර ඇඳීමේ සිද්ධාන්ත භාවිත කර ද්‍රව්‍ය සමූහය මනාව තලය පුරා සම්පිණ්ඩනය කරයි.
- විවිධ පැන්සල් භාවිත කර රේඛාවේ ඇති ශක්තීන් මතුකරමින් ද්‍රව්‍ය සමූහය අඳියි.
- අන් අයගේ නිර්මාණ අගයයි, රසවිඳියි.

**ගුණාත්මක යෙදවුම් :**

- සනක හැඩැති වස්තුවක්
- බාල්දියක්
- වීදුරු බෝතලයක්
- තැඹිලි ගෙඩියක්
- භාණ්ඩ තැබීම සඳහා ධාරකයක්
- චිත්‍ර අඳින කඩදාසි හා 2B , 3B, 4B, 6B ආදි පැන්සල්
- ඇමුණුම අංක 2.1.1.1 ට ඇතුළත් ගවේෂණ / කාර්ය උපදෙස් පත්‍රිකා පිටපත්

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස්:**

**පියවර 2.1.1.1 :**

- ධාරකය මත, සිසුන්ගේ ඇස් මට්ටමින් පහත ද්‍රව්‍ය සමූහය තබා හොඳින් නිරීක්ෂණය කිරීමට සලස්වන්න.
- ඒවායේ දක්නට ඇති විවිධතා පිළිබඳ සිසුන්ගෙන් විමසන්න.
- භාණ්ඩවල ගති ලක්ෂණ (වයනය) පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- චිත්‍ර ඇඳීමේ කඩදාසිය උචිත පරිදි (සිරස්ව හෝ තිරස්ව)තෝරාගැනීම පිළිබඳ සිසුන්ගේ අවධානය යොමු කරන්න.
- ද්‍රව්‍ය බලා ඇඳීමේ චිත්‍රයක අන්තර්ගත විය යුතු සිද්ධාන්ත ගැන සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- විවිධ පැන්සල් භාවිත කර රේඛාවේ විවිධතා හා ශක්තීන් පෙන්විය හැකි බව පැහැදිලි කරන්න.

(මිනිත්තු 10 යි)

**පියවර 2.1.1.2** :

- ඇමුණුම 2.1.1.1ට ඇතුළත් ගවේෂණ/ කාර්ය උපදෙස් පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- චිත්‍ර අඳින කඩදාසි පැන්සල් සිසුන්ට ලබා දෙන්න.
- ගවේෂණ/ කාර්ය උපදෙස් අනුව සිසුන් නිර්මාණකරණයට යොමු කරවන්න.
- සමස්ත නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සලස්වන්න.

(මිනිත්තු 60 යි)

**පියවර 2.1.1.3** :

- සිසු නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- නිර්මාණවල දක්නට ලැබෙන ප්‍රබලතා සහ දුබලතා පෙන්වා දෙමින් සංවර්ධනාත්මක යෝජනා ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - භාණ්ඩවල හැඩ විවිධත්වයෙන් යුක්ත බව.
  - සාර්ථක නිර්මාණයක් සඳහා නිරීක්ෂණය වැදගත් වන බව.
  - රේඛා මගින් පර්යාලෝකය, වයනය (මතුපිට ගති ලක්ෂණ), ත්‍රිමාන ලක්ෂණ මතු කළ හැකි බව.

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පදනම් කරගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- ද්‍රව්‍යවල දක්නට ලැබෙන විවිධතා විස්තර කිරීම
- රේඛා මගින් ද්‍රව්‍යවල ඇති ගති ලක්ෂණ පෙන්විය හැකි බව පැහැදිලි කිරීම
- ද්‍රව්‍යවල විවිධ හැඩ රේඛාවෙන් ඇඳීම
- නිරීක්ෂණයෙන් ද්‍රව්‍ය පරිමාණානුකූලව තලය මත සම්පිණ්ඩනය කිරීම

**ඇමුණුම 2.1.1.1**

## ගවේෂණ/ කාර්ය උපදෙස් පත්‍රිකාව

- ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කරන්න.
- එහි දක්නට ඇති විවිධ මූලික හැඩ පිළිබඳ ඔබගේ අවධානය යොමු කරන්න.
- එකිනෙක ද්‍රව්‍යවල ඇති වෙනස්කම් හඳුනාගන්න.
- පරිමාණානුකූලව එම ද්‍රව්‍ය තලය මත ඇඳීමේ නිවැරදි ක්‍රමවේද භාවිත කරන්න.
- ස්වභාවික හා නිර්මිත ද්‍රව්‍යවල මතුපිට ස්වභාවය පිළිබඳ අවධානය යොමු කරන්න.
- පර්යාලෝක ලක්‍ෂණ හා ත්‍රිමාන ලක්‍ෂණ මතු වන සේ එළිය, අඳුර මතුකරමින් රේඛාවෙන් ද්‍රව්‍ය අධ්‍යයනය කරන්න.
- ඔබගේ නිර්මාණ පංතියට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

♦ **පහත සඳහන් මාතෘකාව යටතේ තවත් ක්‍රියාකාරකමක් සැලසුම් කරගන්න.**

2.1.2 ගඩොල් කැටයක්, පෝච්චියක බහාලූ මලක් සහිත ඇන්තුරියම් පැළැටියක්, ලෙලි නොගැසූ පොල් ගෙඩියක් රේඛාවෙන් අඳිමු - කාලච්ඡේද 02

**නිපුණතාව 2.0 : පරිසරයේ පවත්නා ද්‍රව්‍යයන් සම්පිණ්ඩනාත්මකව චිත්‍රණය කරයි.**

**නිපුණතා මට්ටම 2.2 : ස්වභාවික හා නිර්මිත වස්තූන් නිරීක්ෂණය කර සම්පිණ්ඩනාත්මකව චිත්‍රණය කරයි.**

**ක්‍රියාකාරකම 2.2.1 : ''සනකාහ හැඩැති වස්තුවක්, මැටි බඳුනක බහාලූ අරලිය අත්තක්, අත් පන්දුවක් හෝ පා පන්දුවක් හෝ සම්පිණ්ඩනය කර වර්ණ කරමු.''**

**කාලච්ඡේද සංඛ්‍යාව : 02 යි.**

**ඉගෙනුම් පල :**
- ධාරකය මත තබා ඇති ද්‍රව්‍ය සමූහයේ එකිනෙකට වෙනස් වූ හැඩ හා මතුපිට ස්වභාවයක් ඇති බව විස්තර කරයි.
- චිත්‍ර ඇඳීමේ මූලික සිද්ධාන්ත භාවිතයට ගැනීමෙන් වස්තුවල හැඩ නිවැරදිව ඇඳිය හැකි බව පිළිගනියි.
- ද්‍රව්‍ය සමූහය තලය පුරා සම්පිණ්ඩනය කර රේඛාවෙන් ඇඳ වර්ණ ගන්වයි.
- සංයමයෙන් යුතුව ක්‍රියාවක නිරත වෙයි.
- උපදෙස් නිවැරදිව පිළිගනියි.

**ගුණාත්මක යෙදවුම් :**
- සනකාහ හැඩැති වස්තුවක්
- මැටි මල් බඳුනක්
- අරලිය මල් අත්තක් (පත්‍ර 5 ක් පමණ)
- අත් පන්දුවක් / දැල් පන්දුවක්
- ද්‍රව්‍ය තැබීම සඳහා ධාරකයක්
- ඇමුණුම් අංක 2.2.1.1 ට ඇතුළත් ගවේෂණ/කාර්ය උපදෙස් පත්‍රිකා
- චිත්‍ර ඇඳීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ
- ද්‍රව්‍ය සම්පිණ්ඩන චිත්‍රවල ආදර්ශ රූප සටහන්

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස්:**

**පියවර 2.2.1.1 :**
- ද්‍රව්‍ය සමූහය ධාරකය මත සුදුසු පරිදි ඇස් මට්ටමට පහතින් තබා සිසුන්ට හොඳින් නිරීක්ෂණය කිරීමට සලස්වන්න.
- ඒවායේ ඇති විවිධ හැඩ හා ප්‍රමාණ පිළිබඳ සිසුන්ගෙන් විමසන්න.
- ද්‍රව්‍ය සමූහයේ එක් එක් ද්‍රව්‍යවල ගති ලක්ෂණ (වයනය), තලය උචිත පරිදි තෝරා ගැනීම ආදී කරුණු පිළිබඳ ව ප්‍රදර්ශනය කරන ලද ආදර්ශ චිත්‍ර ඇසුරින් සාකච්ඡා කරන්න.
- විවිධ පැන්සල් වර්ග භාවිතයෙන් ද්‍රව්‍යවල ස්වභාවය රේඛාවෙන් ඇඳ දැක්විය හැකි බව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

(මිනිත්තු 10)

**පියවර 2.2.1.2** :

- ඇමුණුම 2.2.2.1 ට අදාළ ගවේෂණ/ කාර්ය උපදෙස් පත්‍රිකා සිසුන්ට ලබා දෙන්න.
- චිත්‍ර අඳින ද්‍රව්‍ය සහ උපකරණ සිසුන්ට ලබාදෙන්න.
- ගවේෂණ/ කාර්ය උපදෙස් අනුව සිසුන් ක්‍රියාකාරකමේ යොදවන්න.
- ක්‍රියාකාරකම්වල යෙදෙන සිසුන්ට අවශ්‍ය මඟ පෙන්වීම හා ආදර්ශ සැපයීම සිදු කරන්න.
- සිසු නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සලස්වන්න.

(මිනිත්තු 60 යි)

**පියවර 2.2.1.3** :

- නිම කරන ලද චිත්‍ර පංතියට ඉදිරිපත් කිරීමට සලස්වන්න.
- සිසුන්ට තම නිර්මාණ පිළිබඳ ව ස්වයං ඇගයීමකට අවස්ථාව ලබාදෙන්න.
- සිසු නිර්මාණවල ගුණාත්මක ලක්ෂණ හා දුර්වලතා පෙන්වා දෙමින් සංවර්ධනාත්මක යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- ද්‍රව්‍ය සමූහය තලයට ගැළපෙන ලෙස පරිමාණානුකූලව සම්පිණ්ඩනය කර උචිත පසුබිමක් යෙදීම, එළිය, අඳුර භාවිතය, වර්ණ මාධ්‍ය හැසිරවීම, පර්යාලෝකය, ත්‍රිමාන ලක්ෂණ යෙදීම පිළිබඳව සිසුන් සමඟ සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පදනම් කරගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- ද්‍රව්‍ය සමූහයේ දක්නට ලැබෙන එකිනෙකට වෙනස් වූ හැඩ හා ඒවායේ මතුපිට ස්වභාවය පිළිබඳ විස්තර කිරීම
- ධාරකය මත තබා ඇති ද්‍රව්‍ය සමූහය පරිමාණානුකූලව ඇඳීම
- රේඛාව හා වර්ණ භාවිතයෙන් ද්‍රව්‍ය සම්පිණ්ඩනයේ පර්යාලෝක ලක්‍ෂණ, ත්‍රිමාන ලක්ෂණ හා එළිය අඳුර දැක්වීම
- භාවිත කරන වර්ණ මාධ්‍යයට අනුව අදාළ ශිල්ප ක්‍රම භාවිත කිරීම
- අන් අයගේ නිර්මාණ අගය කිරීම

ඇමුණුම 2.2.1.1

**ගවේෂණ/ කාර්ය උපදෙස් පත්‍රිකාව**

- ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කරන්න.
- භාණ්ඩ එකිනෙකට ආවරණය වී ඇති ආකාරය හා එහි සාපේක්ෂ පරිමාව පිළිබඳ හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඒවායේ දක්නට ලැබෙන විවිධ හැඩතල, පරිමාණය, පර්යාලෝක ලක්ෂණ, ත්‍රිමාන ලක්ෂණ, එළිය, අඳුර භාවිතය, ගැඹුර හා වයනය ආදි සිද්ධාන්ත පිළිබඳ ව ඔබගේ අවධානය යොමු කරන්න.
- ද්‍රව්‍ය සමූහය රේඛාවෙන් අධ්‍යයනය කරන්න.
- තලයට ගැළපෙන සේ ද්‍රව්‍ය සම්පිණ්ඩනය චිත්‍රණය කර සුදුසු පසුබිමක් යොදා වර්ණ කරන්න.
- ඔබගේ නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

♦ **පහත මාතෘකා යටතේ අනෙකුත් ක්‍රියාකාරකම් සැලසුම් කරගන්න.**

2.2.2 ශබ්දකෝෂයක් වැනි විශාල ප්‍රමාණයේ පුස්තකයක්, වීදුරු බෝතලයක දැමූ වද මල් අත්තක් හා ගස්ලබු ගෙඩියක් රේඛාවෙන් ඇඳ වර්ණ කරමු - කාලච්ඡේද 02

2.2.3 ඝනකාභ හැඩැති පෙට්ටියක්, සිලින්ඩරාකාර බඳුනක බහාලූ පළල් පත්‍ර සහිත ක්‍රෝටන් අත්තක්, ලෙලි ගැසූ පොල් ගෙඩියක් හා රෙදිකඩක් චිත්‍රණය කරමු - කාලච්ඡේද 02

2.2.4 ඝනක හැඩැති වස්තුවක්, ගුරුලේත්තුවක බහාලූ මල් අත්තක්, වට්ටක්කා හෝ එවැනි හැඩගත් ගෙඩියක් සම්පිණ්ඩනය කර චිත්‍රණය කරමු - කාලච්ඡේද 02

2.2.5 ප්ලාස්ටික් ජෝගුවක්, රෝල් කරන ලද කඩදාසි, පලතුරු ගෙඩියක් (දොඩම්, දිවුල්, ඇපල් වැනි) හා මුද්‍රිත රෙදි කඩක්, චිත්‍රණය කරමු - කාලච්ඡේද 02

2.2.6 ඝනකාභ හැඩැති වස්තුවක්, ගෝලාකාර වස්තුවක්, වීදුරුවක දැමූ රුක් අත්තන මල් අත්තක්, මුද්‍රිත රෙදි කඩක් චිත්‍රණය කරමු - කාලච්ඡේද 02

**නිපුණතාව 3.0 : පාරිභාරික අවශ්‍යතා සඳහා මෝස්තර නිර්මාණකරණයේ යෙදෙයි.**

නිපුණතා මට්ටම 3.1 : නව සැලසුම් සංකල්ප භාවිත කර පාරිභාරික අවශ්‍යතා සඳහා නිර්මාණ කරයි.

ක්‍රියාකාරකම 3.1.1 : ''පහනක් නිර්මාණය කරමු.''

කාලච්ඡේද සංඛ්‍යාව : 02 යි

ඉගෙනුම් පල :
- විවිධ සංස්කෘතීන්ට අයත් පහන් දල්වමින් අරඹන සුවිශේෂී අවස්ථා විස්තර කරයි.
- විවිධ මාධ්‍යයන් ගෙන් නිර්මාණය වූ පහන් වර්ග භාවිත කරන බව පිළිගනියි.
- අභිමත මාධ්‍යයන් භාවිතයෙන් නිර්මාණය කළ හැකි පහන් සැලසුම් කරයි.
- මාධ්‍ය භාවිතය, නිර්මාණාත්මක බව, අවස්ථාවට ගැළපෙන බව පිළිබඳ අවබෝධයෙන් පහනක් ඇඳ දක්වයි.
- නිර්මාණය රස විඳිමින් අගයයි.

ගුණාත්මක යෙදවුම් :
- කුඩා පොල්තෙල් පහනක්, පොල්තෙල් අවශ්‍ය පමණ
- විවිධ පහන් වර්ග සහිත ඡායාරූප
- චිත්‍ර ඇඳීම සඳහා අවශ්‍ය උපකරණ

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස්:**

පියවර 3.1.1.1 :
- පන්තිය ඉදිරිපිට පහනක් ප්‍රදර්ශනය කර සිසුන් ලවා එය දැල්වීමට සලස්වන්න. සැමගේ අවධානය ඒ දෙසට යොමු කරවන්න.
- පහන භාවිත වන විවිධ ආගමික හා සංස්කෘතික අවස්ථා පිළිබඳ සිසුන්ගෙන් විමසන්න.
- සාම්ප්‍රදායික පහනට ආදේශකයක් නිර්මාණය කළ හැකි බව සාකච්ඡා කරන්න.
- පහනක් නිර්මාණය කළ හැකි විවිධ අමුද්‍රව්‍ය පිළිබඳ විමසන්න.
- එසේ නිම කළ හැකි පහනක් චිත්‍රයක් ලෙස ඇඳීමෙන් නිර්මාණය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබාගත හැකි බව අවධාරණය කරන්න.

(මිනිත්තු 15යි)

පියවර 3.1.1.2 :
- තමා අභිමත අයුරින් සැලසුම් චිත්‍ර ඇඳීමට සිසුන් යොමු කරවන්න.
- මාධ්‍යයන් තෝරාගැනීමේ දී
  - මාධ්‍යයේ සුවිශේෂී බව
  - භාවිතයට සුදුසු හා නුසුදුසු බව
  - අදාළ කාර්යයට ගැළපෙන බව
  - ගොඩනැගීමේ පහසුව පිළිබඳ ව සැලකිලිමත් විය යුතු බව

පැහැදිලි කිරීම

- නිර්මාණය සැලසුම් කිරීමේ දී පහත සඳහන් කරුණු පිළිබඳ ව අවධානය යොමු කරන්න
  - ඉදිරි පෙනුම, පැති පෙනුම පිළිබඳ ව අවධානය යොමු කිරීම
  - අවශ්‍යතාවට ගැළපෙන සේ ගොඩනැඟීමට පහසුවන පරිදි සැලසුම් කිරීම
  - තෝරාගන්නා ලද මාධ්‍යයන්ට ගැළපෙන මෝස්තර රටා යොදා ගැනීම
  - එහි සරල බව සහ ප්‍රායෝගික භාවිතයේ දී ගැටලු අවම වීම
- සැලසුම වර්ණ කිරීමේදී පහත කරුණු පිළිබඳ ව අවධානය යොමු කරන්න
  - තෝරාගන්නා ලද මාධ්‍යයට ආවේණික, එහි අනන්‍යතාව තහවුරු වන ලෙස වර්ණ කිරීම
  - ආකර්ෂණීය තත්ත්වය, නැවුම් බව රැකෙන පරිදි මූලික සිද්ධාන්ත භාවිතය (මිනිත්තු 90 යි)

**පියවර 3.1.1.3** :

- සිසුන්ගේ නිර්මාණ පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරවන්න.
- නිර්මාණය පිළිබඳව ස්වයං ඇගයීමකට අවස්ථාවක් ලබාදෙන්න.
- නිර්මාණ පිළිබඳ ව සංවර්ධනාත්මක අදහස් ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබාදෙන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - නිර්මාණයක් සැලසුම් කිරීමේ දී ඉදිරි පෙනුම එහි විවිධ පැති පෙනුම් ඇඳීමේ වැදගත්කම
  - විවිධ මාධ්‍ය භාවිතයෙන් (ස්වභාවික ද්‍රව්‍ය) නිර්මාණයකට ස්වභාවිකව සුන්දරත්වයක් මෙන් ම අඩු වියදමකින් කෘතිය නිම කළ හැකි වීම
  - තමාගේ නිසඟ හැකියාවන් කලාත්මක ව හා රසවිඳිය හැකි ලෙස නිර්මාණාත්මක ව ගොඩනැඟීමට හැකිවීම

(මිනිත්තු 15 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පදනම් කරගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- නිර්මාණාත්මක පහනක් ගොඩනැඟීමට සුදුසු ද්‍රව්‍ය නම් කිරීම
- මාධ්‍යයේ ස්වභාවය, භාවිතය, නිර්මාණාත්මක බව පාරිහාරික අවශ්‍යතාව පිළිබඳ ව අවබෝධයෙන් සැලසුම ගොඩනැඟීම
- තමන් තුළ වූ කලාත්මක හැකියා, ශක්‍යතා, නිර්මාණශීලීබව නිර්මාණකරණය සඳහා භාවිතයට ගැනීම
- වර්ණ මාධ්‍යයන්ගේ ගති ලක්ෂණ ඉස්මතුවන ලෙස වර්ණ ගන්වා නිම කිරීම

♦ **පහත මාතෘකා යටතේ ක්‍රියාකාරකම් සැලසුම් කර ගන්න**

3.1.2 උත්සව සරසන මනහර පතාක - කාලච්ඡේද 02

3.1.3 විදුලි පහන් ආවරණයක් නිර්මාණය කරමු - කාලච්ඡේද 02

**නිපුණතාව 3.0 : පාරිභාරික අවශ්‍යතා සඳහා නිර්මාණකරණයේ යෙදෙයි.**

**නිපුණතා මට්ටම 3.2 : නව සැලසුම් සංකල්ප භාවිත කර පාරිභාරික අවශ්‍යතා සඳහා ව්‍යාප්ත සැරසිලි නිර්මාණය කරයි.**

**ක්‍රියාකාරකම 3.2.1 : "සිගිති ඇඳුමට මැවෙන රටා"**

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02 යි

**ඉගෙනුම් පල :**
- සැරසිලි ඒකක නිර්මාණය කරයි.
- ළමයින් සඳහා නිර්මාණ කිරීමේ දී ඔවුන්ට උචිත සරල හැඩ හා වර්ණ භාවිත කරයි.
- සැරසිලි ඒකක ව්‍යාප්ත කර සැරසිල්ලක් සැලසුම් කරයි.
- සංයමයකින් යුතු ව කාර්යයේ නිරත වෙයි.
- නිර්මාණ අගයයි, රසවිඳියි.

**ගුණාත්මක යෙදවුම් :**
- ව්‍යාප්ත සැරසිලි දැක්වෙන රෙදිපිළි
- ළමයින් සඳහා සුදුසු හැඩතල සහිත මෝස්තර යෙදූ රෙදි හා ඒ ඇසුරෙන් මැසූ ඇඳුමක්

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස්:**

**පියවර 3.2.1.1 :**
- ළමයින් සඳහා උචිත මෝස්තර යෙදූ රෙදි හා එම රෙදිවලින් මැසූ ඇඳුම් පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- ළමයින් සඳහා උචිත මෝස්තර වැඩිහිටියන්ට අනුචිත බව මතුවන පරිදි සාකච්ඡාව මෙහෙයවන්න.
- ළමයින් සඳහා ම සුදුසු නිර්මාණවල ස්වභාවය පිළිබඳ ව සිසුන්ගෙන් අදහස් විමසන්න.
- ළමයින් සඳහා කරන නිර්මාණවල දී ඔවුන්ගේ රුචි අරුචිකම්, පිළිබඳ ව අවධාරණය වන පරිදි සාකච්ඡාව මෙහෙයවන්න.
- ළමයින් සඳහා වර්ණ තේරීමේ දී සැලකිය යුතු කරුණු පිළිබඳ ව සාකච්ඡා කරන්න.

(මිනිත්තු 15 යි)

**පියවර 3.2.1.2 :**
- ළමයින් සඳහා උචිත නිර්මාණ හැඩ හෝ ස්වභාවික හැඩ භාවිතයෙන් සැරසිලි ඒකකයක් නිර්මාණය කිරීමට සිසුන් මෙහෙයවන්න.
- නිර්මාණය කරන සැරසිලි ඒකක උචිත පරිදි චිත්‍ර අඳින කඩදාසියේ නිවැරදි ක්‍රමවේදයකට පිටපත් කරගැනීමට මෙහෙයවන්න.
- ළමයින් සඳහා උචිත වර්ණ මාලාවක් භාවිත කර වර්ණ ගැන්වීම සඳහා සිසුන් යොමු කරන්න.
- නිම කෘතීන් ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

(මිනිත්තු 55 යි)

**පියවර 3.2.1.3** : 
- ශිෂ්‍ය නිර්මාණ පන්තියට ඉදිරිපත් කරවන්න.
- ස්වයං ඇගයීමකට අවස්ථාව ලබාදෙන්න.
- සංවර්ධනාත්මක යෝජනා හා අදහස් ප්‍රකාශනයට අනෙක් සිසුන්ට අවස්ථාව සලසා දෙන්න.
- පොදු සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 05 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පදනම් කරගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- ළමයින් සඳහා සුදුසු වර්ණ හැඩතල නම් කිරීම
- ළමයින් සඳහා නිර්මාණ කිරීමේ දී ඔවුන්ට ම ගැළපෙන සරල හැඩ භාවිත කළ යුතු බව පිළිගැනීම හා භාවිතය
- ළමයින් සඳහා ගැළපෙන සැරසිලි ඒකක ඇඳීම
- ළමයින්ගේ රුචිකත්වයන් පිළිබඳ අවබෝධයෙන් නිර්මාණයේ යෙදීම
- නිර්මාණය සාර්ථක ව නිම කිරීම

♦ **පහත මාතෘකා යටතේ අනෙකුත් ක්‍රියාකාරකම් සැලසුම් කර ගන්න.**

- 3.2.2 සත්ත්ව රූ ඇසුරෙන් සරම් වාටියක් නිර්මාණය කරමු. - කාලච්ඡේද 02
- නිපුණතා මට්ටම 3.3 ට අදාළව සුදුසු ක්‍රියාකාරකමක් සැලසුම් කර ක්‍රියාත්මක කරන්න - කාලච්ඡේද 02

**නිපුණතාව 4.0** : **නිෂ්පාදන හා සේවා අවශ්‍යතා සඳහා ග්‍රැෆික් නිර්මාණ කරයි.**

**නිපුණතා මට්ටම 4.1** : **විවිධ නිෂ්පාදන හා සේවා ප්‍රචාරණය සඳහා ග්‍රැෆික් නිර්මාණ කරයි.**

**ක්‍රියාකාරකම 4.1.1** : **''දවටන, ඇසුරුම්, බහාලුම් නිර්මාණය කරමු''**

**කාලච්ඡේද සංඛ්‍යාව** : **02 යි**

**ඉගෙනුම් පල** :
- දවටන, ඇසුරුම්, බහාලුම්වල අනන්‍යතා ලක්ෂණ පිළිබඳ ව විස්තර කරයි.
- අදාළ නිර්මාණයේ ආකර්ශනීය බව නිෂ්පාදන අලෙවිය වර්ධනයට ඉවහල් වන බව පිළිගනියි.
- දේශීය ආහාර නිෂ්පාදන සඳහා දවටන /ඇසුරුම්/බහාලුම් නිර්මාණය කරයි.
- නිර්මාණ අගයයි, රසවිඳියි.

**ගුණාත්මක යෙදවුම්** :
- දවටන- චොක්ලට්, ටොෆී, සබන් දවටන
  ඇසුරුම්- බීම, දියර කිරි, තේ කොළ ඇසුරුම්
  බහාලුම්- බිස්කට්, කිරිපිටි, පොල්කිරි බහාලුම්

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස්:**

**පියවර 4.1.1.1** :
- ඔබට අභිමත පරිදි දැවටුමක, ඇසුරුමක හා බහාලුමක යොදා නිෂ්පාදනය කරන ලද භාණ්ඩ සිසුන් අතින් අත යවමින් හෝ රසවිඳීමට සලස්වමින් නිර්මාණශීලීව පාඩමට පිවිසෙන්න.
- දැවටුමක, ඇසුරුමක, බහාලුමක අනන්‍යතා ලක්ෂණ සහ භාණ්ඩ ප්‍රචාරණයේ දී හා අලෙවියේ දී එහි වැදගත්කම පිළිබඳ සාකච්ඡාව මෙහෙයවන්න.
  - ආකෘතිය
  - ප්‍රමාණය
  - ගුණාත්මකභාවය
  - පාරිභෝගික ආකර්ශනය

(මිනිත්තු 10 යි)

**පියවර 4.1.1.2** :
- අභිමත පරිදි තෝරාගත් මාතෘකාවක් සඳහා දවටනයක් හෝ ඇසුරුමක් හෝ බහාලුමක් නිර්මාණය කිරීමට අවශ්‍ය උපදෙස් දෙන්න.
- පන්තියේ සෑම සිසුවකුටම සිය අභිමතය පරිදි තෝරාගත් මාතෘකාවට අදාළ ව දවටනයක් /ඇසුරුමක්/බහාලුමක් නිර්මාණය කළ යුතු බව අවධාරණය කරන්න.

- දේශීය ආහාර වර්ගයකින් සාදන ලද නවතම නිෂ්පාදනයක් වෙළෙඳපලට හඳුන්වාදීමට උචිත දවටනයක් /ඇසුරුමක්/බහාලුමක් නිර්මාණය කිරීමට යොමු කරවන්න.
- තමා කළ නිර්මාණයට උචිත පරිදි සරල, උච්චාරණයට පහසු නමක් යෙදිය යුතු බව දැනුවත් කරන්න.
- අක්ෂර, වර්ණ, උචිත ලෙස භාවිත කරමින් නිර්මාණය නිම කිරීමට මග පෙන්වන්න.
- නිම කළ කෘති ප්‍රදර්ශනයට සුදුසු ලෙස ඉදිරිපත් කරවන්න.

(මිනිත්තු 60 යි)

**පියවර 4.1.1.3** :
- නිම කළ කෘති ප්‍රදර්ශනය කරවන්න.
- තම නිර්මාණය පිළිබඳව සිසුන්ගේ අදහස් ප්‍රකාශනයට අවස්ථාව ලබාදෙන්න.
- අනෙකුත් සිසුන්ට අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- තවදුරටත් සංවර්ධනය විය යුතු අවස්ථා පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡා කරමින් උපදෙස් ලබාදෙන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පදනම් කරගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- දවටන, ඇසුරුම් බහාලුම්වල වෙනස පිළිබඳව විස්තර කිරීම
- නිර්මාණාත්මක අක්ෂර හා චිත්‍ර උචිත ලෙස ගැළපීමේ රටා හඳුනා ගැනීම
- අභිමත තේමාව සඳහා දවටන/ඇසුරුම් /බහාලුම් නිර්මාණය කිරීම
- මනා වූ නිමාවක් ඇති ව වැඩ නිම කිරීම
- නිර්මාණ ඇගයීම හා රසවිඳීම

♦ **පහත මාතෘකා යටතේ අනෙකුත් ක්‍රියාකාරකම් සැලසුම් කරගන්න.**

4.1.2 අලුතින් හඳුන්වා දෙන බැංකුවක් සඳහා ලාංඡනයක් නිර්මාණය කරමු - කාලච්ඡේද 02

4.1.3 ආරාධනා පත්‍ර නිර්මාණය කරමු - කාලච්ඡේද 02

**නිපුණතාව 4.0** : **නිෂ්පාදන හා සේවා අවශ්‍යතා සඳහා ග්‍රැෆික් නිර්මාණ කරයි.**

**නිපුණතා මට්ටම 4.2** : **"ගීතයකට /කවියකට/නිසඳැසකට උචිත සන්නිදර්ශන චිත්‍ර නිර්මාණය කරයි."**

**ක්‍රියාකාරකම 4.2.1** : **''පද්‍ය පංතියකට සන්නිදර්ශන චිත්‍රයක් නිර්මාණය කරමු.''**

**කාලච්ඡේද සංඛ්‍යාව** : **02 යි**

**ඉගෙනුම් පල** :
- සන්නිදර්ශන චිත්‍ර පිළිබඳ ව විස්තර කරයි.
- සන්නිදර්ශන චිත්‍රවල අන්තර්ගත කලාත්මක ලක්ෂණ ප්‍රකාශ කරයි.
- පද්‍යයක් සඳහා උචිත සන්නිදර්ශන චිත්‍රයක් නිර්මාණය කරයි.
- නිම කළ කෘති රසවිඳියි, අගය කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- පුවත්පත්වල පළ වූ කවි, නිසඳැස්, කෙටිකතා, නවකතා හා විශේෂාංග ලිපි සඳහා නිර්මාණය කළ කළු, සුදු හෝ වර්ණ නිදර්ශන චිත්‍ර
- සන්නිදර්ශන චිත්‍රයක් ඇඳීම සඳහා සුදුසු පද්‍ය පංතියක්.

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස්:**

**පියවර 4.2.1.1** :
- පුවත්පත්, සඟරා ආදියෙහි පළ වූ කවි, නිසඳැස්, කෙටිකතා, නවකතා, විශේෂාංග සඳහා නිර්මාණය කළ සන්නිදර්ශන චිත්‍ර කිහිපයක් පංති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.
- ප්‍රදර්ශිත සන්නිදර්ශන චිත්‍ර පිළිබඳ ව සිසු අදහස් දැක්වීමට අවස්ථාව සලසන්න.
- සන්නිදර්ශන චිත්‍රවල භාවිත කළු, සුදු වර්ණ සහ වර්ණවත් බව හා රේඛා හැඩතල පිළිබඳ ව සාකච්ඡාව මෙහෙයවන්න.
- ග්‍රැෆික් චිත්‍ර ගණයට අයත් වන මෙම සන්නිදර්ශන නිර්මාණයේ දී රිද්මානුකූල බවක් මතුවිය යුතු බව අවධාරණය වන පරිදි සාකච්ඡාව තීව්‍ර කරන්න. (මිනිත්තු 15 යි)

**පියවර 4.2.1.2** :
- තෝරාගත් පද්‍ය පන්තිය සිසුන්ට ලබාදෙන්න.
- පද්‍යයේ අර්ථයට ගැළපීම, රිද්මයට ගැළපීම, රිද්මයට උචිත වර්ණ ගැන සැලකිලිමත් වෙමින් සන්නිදර්ශන චිත්‍රය නිර්මාණයට යොමු කරවන්න.
- නිර්මාණය කරන ලද සන්නිදර්ශන චිත්‍රය වර්ණ කිරීමේ දී පද්‍යයේ අර්ථය හා රිද්මය තීව්‍ර වන පරිදි වර්ණ හා රේඛා හැසිරවීමට සිසුන් මෙහෙයවන්න.
- නිම කරන ලද කෘති පන්තියේ ප්‍රදර්ශනය කිරීම සඳහා සූදානම් කරන්න. (මිනිත්තු 55 යි)

**පියවර 4.2.1.3** :

- නිම කළ කෘති පංතියේ ප්‍රදර්ශනය කරවන්න.
- ප්‍රදර්ශිත කෘති පිළිබඳ අදහස් දැක්වීමට සිසුන්ට අවස්ථාව සලසන්න.
- පද්‍ය පංති සඳහා නිර්මාණය කරන ලද සන්නිදර්ශන චිත්‍රයේ උචිත අනුචිතභාවය සිසුන් සමග සාකච්ඡා කරන්න.
- සිසුන්ගේ සන්නිදර්ශන චිත්‍රවල සංවර්ධනය විය යුතු අවස්ථා පිළිබඳ සාකච්ඡා කරමින් උපදෙස් දෙන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පදනම් කරගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- සන්නිදර්ශන චිත්‍ර යනු කුමක්දැයි විස්තර කිරීම
- අනෙකුත් ග්‍රැෆික් චිත්‍ර නිර්මාණ සමග සන්නිදර්ශන චිත්‍ර ලක්ෂණ සන්සන්දනය කිරීම
- පද්‍ය පංතියක් සඳහා උචිත රූප, වර්ණ හා රේඛා හසුරවමින් සන්නිදර්ශන චිත්‍රයක් නිර්මාණය කිරීම
- නිර්මාණ අගය කිරීම හා රස විඳීම

**නිපුණතාව 5.0** : **විවිධ මාධ්‍ය භාවිතයෙන් කැටයම් හා මූර්ති නිර්මාණය කරයි.**

**නිපුණතා මට්ටම 5.1** : **නිර්මාණාත්මක හැඩතල භාවිතයෙන් උන්නත කැටයම් නිර්මාණය කරයි.**

**ක්‍රියාකාරකම 5.1.1** : **''සත්ත්ව හා තුරුලතා හැඩ යොදා බිත්ති සැරසිල්ලක් නිර්මාණය කරමු.''**

**කාලච්ඡේද සංඛ්‍යාව** : **03 යි**

**ඉගෙනුම් පල** :

- කැටයම් සඳහා උචිත මාධ්‍ය හඳුනාගෙන ඒවා නිර්මාණාත්මකව භාවිතයට ගනියි.
- මාධ්‍ය භාවිතය පිළිබඳව අවබෝධයෙන් කටයුතු කරයි.
- විවිධ උපකරණ භාවිතය සහ හැසිරවීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.
- වර්ණ කිරීම සහ නිමහම් කිරීම නිර්මාණශීලීව කරයි.
- අන් නිර්මාණ රසවිඳියි, අගයයි.

**ගුණාත්මක යෙදවුම්** :

- ආදර්ශ උන්නත බිත්ති සැරසිලි
- බිත්ති සැරසිල්ල සඳහා ඇඳගත් පින්තූර, ඡායාරූප, පොත්, දළ සටහන්
- ඇමුණුම 5.1.1.1 ට ඇතුළත් ගවේෂණ/ කාර්ය උපදෙස් පත්‍රිකාවේ පිටපත් අවශ්‍ය පමණ
- ඩිමයි කඩදාසි, පැන්සල්, මකන, කුඩා ප්‍රමාණයේ පිහිතල, පින්සල්, වර්ණ (රබර් පේන්ට්, බැනර් පේන්ට්) වැලි කඩදාසි, කාබන් කොළ
- අඩි 1 1/2 x අඩි 1 1/2 ප්‍රමාණය අඟල් 1/2, 3/4 හෝ 01 ඝනකම් ඍජුෆෝම් ෂීට්

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස්:**

**පියවර 5.1.1.1** :

- පාඩම ආරම්භ කිරීමට ප්‍රථම ආදර්ශ උන්නත කැටයම, පින්තූර, දළ සටහන්, ඡායාරූප සිසුන් ඉදිරියේ ප්‍රදර්ශනය කරන්න.
- එය නැරඹීමට අවස්ථාව ලබාදී සිසුන් සමඟ අදහස් හුවමාරු කරගන්න.
- මාධ්‍ය භාවිතය සහ එය පහසුවෙන් කළ හැකි ආකාරය සම්බන්ධ ව සාකච්ඡා කරන්න.
- යොදාගත හැකි හැඩතල සහ සම්පිණ්ඩනය සම්බන්ධ ව සාකච්ඡා කරන්න. (මිනිත්තු 15යි)

**පියවර 5.1.1.2** :

- 5.1.1.1 ට අදාළ ගවේෂණ /කාර්ය උපදෙස් පත්‍රිකා සිසුන්ට ලබාදෙන්න.
- දළ සටහන් ඇඳීමට ඩිමයි කඩදාසි සහ කාබන් කොළ පැන්සල් ලබාදෙන්න.
- ඍජුෆෝම් ෂීට් සහ කැපීමට අවශ්‍ය උපකරණ ලබාදෙන්න.

- අවශ්‍ය උපදෙස් දෙමින් නිර්මාණය කිරීමට මඟ පෙන්වන්න.
- නිර්මාණය පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

(මිනිත්තු 90 යි)

පියවර 5.1.1.3 :
- සිසු නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සලස්වන්න.
- සිසුන්ගේ ස්වයං ඇගයීම සහ සාකච්ඡාවට ඉඩ ලබාදෙන්න.
- සංවර්ධනාත්මක අදහස් සහිත ඇගයීම් අවස්ථාවකට අනෙකුත් සිසුන් යොමු කරවන්න.
- නිර්මාණයේ දළ සටහන් අඳිමින් පසුව අවශ්‍ය උපකරණ භාවිතයෙන් සෘජුෆෝම් මත කැටයමක් පහසුවෙන් නෙළාගත හැකි බව අවබෝධ කරවන්න.
- කපාගත් කැටයම වැලි කඩදාසියක ආධාරයෙන් සුමට කර අවශ්‍ය පරිදි වර්ණ ගන්වා අලංකාර කර ගැනීමෙන් නිර්මාණයට වැඩි වටිනාකමක් එක් කළ හැකි බව අවබෝධ කරවන්න.
- දැව වැනි වෙනත් මාධ්‍ය භාවිතයෙන් ද අලංකාර අර්ධ උන්නත කැටයම් නිර්මාණය කළ හැකි බව අවබෝධ කරවන්න.

(මිනිත්තු 15යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පදනම් කරගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- උන්නත කැටයම් යනු කුමක්දැයි විස්තර කිරීම
- නෙළීමේ ශිල්ප ක්‍රමය භාවිත කර බිත්ති සැරසිල්ලක් නිර්මාණය කිරීමේ හැකියාව සොයා බැලීම
- සෘජුෆෝම් මාධ්‍ය භාවිත කරමින් උන්නත කැටයමක් නිර්මාණය කිරීම
- උපකරණ නිවැරදි ව පරිහරණය කිරීම
- සෙසු අයගේ නිර්මාණ අගය කිරීම

ඇමුණුම 5.1.1.1

## ගවේෂණ/ කාර්ය උපදෙස් පත්‍රිකාව

- ගුරුතුමිය /ගුරුතුමා පන්තියට ඉදිරිපත් කරන බිත්ති සැරසිල්ල /පින්තූර /දළ සටහන් ආදිය හොඳින් නිරීක්ෂණය කරන්න.
- එහි දක්නට ලැබෙන හැඩ, වර්ණ, නිමාව, මාධ්‍ය පිළිබඳ ඔබගේ අවධානය යොමුකරන්න.
- ලබා දී ඇති කඩදාසි භාවිත කර ඒ මත නියමිත ප්‍රමාණයට ( 1 1/2 x 1 1/2 ) සත්ත්ව හා තුරුලතා හැඩ යොදා බිත්ති සැරසිල්ලක් සඳහා දළ සටහන් අඳින්න.
- ඇඳගත් දළ සටහන කාබන් කොළයක ආධාරයෙන් සෘජුෆෝම් තලයට පිටපත් කරන්න.
- සපයා දී ඇති පිහිතල ඇතුළු උපකරණ භාවිත කරමින් අවශ්‍ය හැඩතල මතුවන පරිදි අනවශ්‍ය කොටස් කපා දමමින් කෘතිය නිම කරන්න.
- කපා මතුකර ගත් නිර්මාණය, වැලිකඩදාසියක ආධාරයෙන් අවශ්‍ය ප්‍රමාණයට සුමට කරගන්න.
- පළමු ව ඇතුළට ගිය කොටස් තද පැහැයෙන් ද ඉහළට මතු වූ කොටස් ක්‍රම ක්‍රමයෙන් ළා පැහැය යොදා වර්ණ කරන්න.
- වර්ණ කර අවසන් වූ පසු නිර්මාණය පන්තියට ඉදිරිපත් කරන්න.

නිපුණතාව 5.0 : විවිධ මාධ්‍ය භාවිතයෙන් කැටයම් හා මූර්ති නිර්මාණය කරයි.

නිපුණතා මට්ටම 5.2 : ඇඹීමේ ශිල්ප ක්‍රමය භාවිතයෙන් මිනිස් හිසක් නිර්මාණය කරයි.

ක්‍රියාකාරකම 5.2.1 : ''මිනිස් හිසක් අඹමු.''

කාලච්ඡේද සංඛ්‍යාව : 03 යි.

ඉගෙනුම් පල :
- මාධ්‍යයෙහි විවිධතා හඳුනාගෙන අවබෝධය ලබයි.
- මාධ්‍ය භාවිතය පිළිබඳ කුසලතාව ලබයි.
- උපකරණ භාවිතය පිළිබඳ හැකියාව ලබයි.
- නිමහම් කිරීමේ සහ වර්ණ කිරීමේ කුසලතාව ලබයි.
- අන් නිර්මාණ රසවිඳියි/අගයයි.

ගුණාත්මක යෙදවුම් :
- ආදර්ශ උන්නත කැටයමක් ආදර්ශ කැටයමක ඡායාරූප, දළ සටහන්, පින්තූර
- ඇමුණුම 5.2.1.1 ට ඇතුළත් ගවේෂණ/කාර්ය උපදෙස් පත්‍රිකාවේ පිටපත්
- ඩිමයි කඩදාසි, පැන්සල්, මකන, ලී තහඩු (1/2'' x 20'' x 15'') පදම් කළ මැටි ඇඹීම සඳහා අවශ්‍ය උපකරණ (Tools) වර්ණ (රබර් පේන්ට්, බැනර් පේන්ට්, ලැකර්) පින්සල්, වර්ණ දැමීමට භාජන

ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස්:

පියවර 5.2.1.1 :
- ආදර්ශ උන්නත කැටයම පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- නිර්මාණ පිළිබඳව සිසුන් සමඟ සාකච්ඡා කර අදහස් හුවමාරු කරගන්න.
- මානව හා සත්ත්ව හැඩතල භාවිත කර උන්නත කැටයමක් ඇඹීම සම්බන්ධව කණ්ඩායම තුළ සාකච්ඡා කරන්න.
- කණ්ඩායම ඊට සක්‍රීය ව දායක වීමෙන් මූලික ප්‍රවේශය සකස් කරගන්න.
- පදම් කළ මැටි භාවිතයෙන් සාර්ථකව නිර්මාණය කළ හැකි බව තේරුම් කරන්න.
- නිර්මාණය කිරීමෙන් පසුව වෙනත් දිනයක අලංකාර ලෙස වර්ණ කරන්න.

(මිනිත්තු 15යි)

පියවර 5.2.1.2 :
- ඇමුණුම 5.2.1.1 ට අදාළ ගවේෂණ උපදෙස් පත්‍රිකාව සිසුන්ට ලබාදෙන්න.
- දළ සටහන් ඇඳීමට සියලු සිසුන්ට අවස්ථාව දෙන්න.
- අඳින ලද දළ ඇසුරෙන් වඩාත් සුදුසු දළ සටහන තෝරා ගැනීමට සහායවන්න.

- මැටි එලා ගැනීමට අවශ්‍ය සූදානම් කළ ලෑලි කණ්ඩායමට
- පදම් කළ මැටි සහ අවශ්‍ය උපකරණ (Tools) කණ්ඩායමට ලබාදෙන්න.
- තෝරාගත් දළ සටහන ඇසුරෙන් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය මඟ පෙන්වමින් සහාය ලබාදෙන්න.
- නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට කණ්ඩායම් සූදානම් කරන්න.
- තෙත මැටිවලින් නිර්මාණය කර අවසන් කරන කාලය කාලච්ඡේද 2 කින් ද, වර්ණ කිරීමට, පසුව එළඹෙන 01 කාලච්ඡේදයක් ද යොදාගන්න.
- වර්ණ, පින්සල් ආදිය සිසුන්ට ලබාදෙන්න. වර්ණ ගැන්වීම සඳහා සිසුන් මෙහෙයවන්න.

(මිනිත්තු 90 යි)

**පියවර 5.2.1.3** :

- කණ්ඩායම්වල නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට ඉඩ සලස්වන්න.
- ඒ ඒ කණ්ඩායම්වල නිර්මාණ සම්බන්ධව අනෙක් කණ්ඩායම්වල සිසුන්ගෙන් ඇගයීමට අවස්ථාව සලසා දෙන්න.
- උන්නත කැටයමක් නිර්මාණය සඳහා මැටි මාධ්‍යය පහසු මාධ්‍යයක් බව අවබෝධ කරවන්න.
- දළ සටහන් ඇඳීම, නිර්මාණය වඩාත් පහසු කරවන අයුරු සාකච්ඡාව තුළින් මතුකරවන්න.
- උපකරණ භාවිතය, නිමාව සහ සාර්ථකත්වයට බලපාන අයුරු අවබෝධ කරගැනීමට ඉඩ සලසන්න.

(මිනිත්තු 15 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පදනම් කරගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- උන්නත කැටයම් යනු කුමක්දැයි විස්තර කිරීම
- උන්නත කැටයම් ගෘහ අලංකරණයට භාවිත කළ හැකි ආකාරය විමසා බැලීම
- මැටි මාධ්‍ය භාවිතයෙන් උන්නත කැටයම් නිර්මාණය කිරීම හා වර්ණ ගැන්වීම
- කණ්ඩායම් හැඟීමෙන් සහයෝගයෙන් වැඩ කිරීම
- උපකරණ නිවැරදිව භාවිත කිරීම

ඇමුණුම 5.2.1.1

## ගවේෂණ/ කාර්ය උපදෙස් පත්‍රිකාව

- කණ්ඩායම් සඳහා සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් කියවා ක්‍රියාකාරකම්වල යෙදෙන්න.
- ගුරුතුමා /ගුරුතුමිය පන්තියට ඉදිරිපත් කර ඇති ආදර්ශ උන්නත කැටයම හොඳින් නිරීක්ෂණය කරන්න.
- එහි දක්නට ලැබෙන හැඩ, මාධ්‍ය, වර්ණ, ත්‍රිමාන බව, නිමාව සම්බන්ධ ව අවධානය යොමු කරන්න.
- කණ්ඩායමට සපයා ඇති ඩිමයි කොළ භාවිත කර සියලුදෙනාම දළ සටහන් අඳින්න.
- කණ්ඩායමෙන් තෝරාගත් එක් හොඳ ම නිර්මාණය හෝ එක් එක් නිර්මාණයේ සාර්ථක කොටස එක්කර එක නිර්මාණයක් කණ්ඩායමේ සිසුවකු ලවා නියමිත ප්‍රමාණයට අඳින්න.
- කණ්ඩායමට සපයා ඇති ලෑල්ල මත අඟල් 1/2 ක පමණ ඝනත්වයක් සිටින ලෙසට මැටි අතුරා ගන්න.
- එම මැටි පුවරුව මතට ඇඳගත් චිත්‍රය අතුරා පෑන් තුඩින් හෝ පැන්සලයකින් ඇඳගන්න.
- ලබා දී ඇති ඇඹුම් උපකරණ (Tools) යොදාගෙන කණ්ඩායමේ සියලු දෙනා සහයෝගයෙන් අවශ්‍ය තැන් මතු කරගනිමින් අනවශ්‍ය කොටස් ඉවත් කරමින් නිර්මාණය කරන්න.
- සියලු කණ්ඩායම් නිර්මාණ වියළෙන්නට තබා එළඹෙන කාලච්ඡේදයක් සහිත දිනයක වර්ණ කරන්න. ඉහළට මතු වූ කොටස් ළා පැහැයෙන් ද යටගොස් ඇති තැන් තද පැහැයෙන් ද වර්ණ ගන්වන්න.
- ඔබගේ කණ්ඩායමේ නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

**නිපුණතාව 6.0** : **ආගමික හා සංස්කෘතික අංග, දෙස්, විදෙස් තෝරාගත් ශිල්පීන්ගේ කලා නිර්මාණ, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලීව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 6.1** : **තෝරාගත් දේශීය ශිල්පීන්ගේ නිර්මාණ රසාස්වාදය කරයි.**

**ක්‍රියාකාරකම 6.1.1** : **''එම්. සාර්ලිස් ශිල්පියාගේ සිතුවම් අගයමු''**

**කාලච්ඡේද සංඛ්‍යාව** : **01 යි**

**ඉගෙනුම් පල** :
- එම්. සාර්ලිස් ශිල්පියාගේ නිර්මාණවල කාලීන වැදගත්කම සොයා බලයි.
- විහාර සිතුවම් හා ලිතෝ මුද්‍රණ වශයෙන් එම්.සාර්ලිස්ගේ නිර්මාණ හඳුනා ගනියි.
- නව නිර්මාණාත්මක ශෛලිය සඳහා පදනම් වූ ආභාස විමසා බලයි.
- නිර්මාණ ආශ්‍රිත ව සංරචන ක්‍රම හා සිද්ධාන්ත ලක්ෂණ විස්තර කරයි.
- එම්. සාර්ලිස් ශිල්පියාගේ චිත්‍රවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- එම්. සාර්ලිස් ශිල්පියාගේ වර්ණ චිත්‍ර
  - සිදුහත් කුමරු හා මව් බිසව
  - පියුම් පිට වැඩීම
- ඇමුණුම 6.1.1.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 6.1.1.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 6.1.1.1** :
- එම්. සාර්ලිස් ශිල්පියාගේ නිදර්ශන චිත්‍ර සිසු අවධානයට යොමු කරවන්න.
- එම සිතුවම්වල ආභාසය, වස්තු විෂයය, ශෛලිය පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
- බටහිර චිත්‍ර කලා ශෛලිය අනුගමනය කරමින් ශ්‍රී ලාංකේය සංස්කෘතිය රැකගැනීම පිණිස බෞද්ධ සිතුවම් ඇඳ ඇති අකාරය පිළිබඳ විමසන්න.

(මිනිත්තු 10 යි.)

**පියවර 6.1.1.2** :
- ඇමුණුම 6.1.1.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- ඇමුණුම 6.1.1.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව අධ්‍යයනය කිරීමට සිසුන් යොමු කරවන්න.

- කියවීම් පත්‍රිකාව ඇසුරෙන් කාර්ය පත්‍රිකාවේ ඇති ක්‍රියාකාරකමෙහි යෙදීමට සිසුන්ට උපදෙස් දෙන්න.

(මිනිත්තු 20 යි.)

**පියවර 6.1.1.3** :

- සිසුන්ගේ පිළිතුරු පත් එකිනෙකා අතර හුවමාරු කරගනිමින් ඇගයීමට සලස්වන්න.
- අනාවරණය කරගත් පිළිතුරු පිළිබඳ සිසු අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- එම්. සාර්ලිස් ශිල්පියාගේ නිර්මාණ පිළිබඳ ව සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 10 යි.)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 6.1.1.1 හා ඇමුණුම 6.1.1.2 පදනම් කර කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- එම්. සාර්ලිස් ශිල්පියාගේ යුග මෙහෙවර හා නව නිර්මාණාත්මක ප්‍රවේශ විස්තර කිරීම
- බෞද්ධ විහාර සිතුවම් හා ලිතෝ මුද්‍රිත සිතුවම් නම් කිරීම
- පෙරදිග හා අපරදිග චිත්‍ර කලා ආභාස එම්. සාර්ලිස්ගේ සිතුවම්වලට බලපා ඇති ආකාරය විස්තර කිරීම
- එම්. සාර්ලිස් ශිල්පියාගේ චිත්‍ර නිර්මාණවල සුවිශේෂතා හා කලා ලක්ෂණ විස්තර කිරීම

**ඇමුණුම 6.1.1.1**

## කාර්ය පත්‍රිකාව

- ඔබට ඉදිරිපත් කර ඇති එම්. සාර්ලිස්ගේ නිර්මාණ හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- එම්. සාර්ලිස්ගේ නිර්මාණවල පවතින සුවිශේෂී ලක්ෂණ හඳුනාගන්න.
- පහත සඳහන් ක්‍රියාකාරකම්හි නිරතවන්න.
  1. එම්. සාර්ලිස් ශිල්පියා පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
  2. පහත සඳහන් කරුණු යටතේ එම්. සාර්ලිස් ශිල්පියාගේ නිර්මාණ ඇගයීමට ලක් කරන්න.
     - i. තේමාව
     - i. ශෛලිය
     - ii. අභාසය
     - iv. ශිල්ප ක්‍රමය
     - v. කලා ලක්ෂණ - රූප භාවිතය
       - වර්ණ භාවිතය
       - තලය භාවිතය
- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරගන්න.

ඇමුණුම 6.1.1.2

# කියවීම් පත්‍රිකාව

- වර්ෂ 1880 ජූනි 25 වන දින අම්බලන්ගොඩ උපත ලබමින් 1955 නොවැම්බර් 21 දින අප අතරින් සමුගත් එම්. සාර්ලිස් (මාලිගාවගේ සාර්ලිස්) බෞද්ධ චිත්‍ර කලාවේ නව පුනරුදයක් ඇති කළ ශිල්පියෙකි.
- ටවර් නෘත්‍ය ශාලාවේ චිත්‍ර වස්ත්‍ර සකස් කළ රිචඩ් හෙන්රිකස්ගේ බටහිර චිත්‍ර කලා ශෛලීය ලක්ෂණ එම්. සාර්ලිස්ගේ බෞද්ධ චිත්‍ර නිර්මාණ සඳහා ආභාසය විය.
- එම්. සාර්ලිස් ශිල්පියාගේ බෞද්ධ සිතුවම් නිර්මාණ, විහාර සිතුවම් හා ලිතෝ මුද්‍රිත සිතුවම් ලෙස කොටස් දෙකකට බෙදා වෙන් කළ හැකි ය.
- යටත් විජිතකරණය තුළ ශ්‍රී ලංකාවේ ජනප්‍රිය වී තිබූ බ්‍රිතාන්‍ය රැජිනගේ රූප වෙනුවට බෞද්ධ චිත්‍ර, සිංහල බෞද්ධ ජනතාව අතර ජනප්‍රිය කිරීමට පුරෝගාමී වූයේ එම්. සාර්ලිස් ශිල්පියා ය.
- ඔහු විසින් අඳින ලද බෞද්ධ සිතුවම් 1923 දී ජර්මනියට යවා ලිතෝ මුද්‍රිත ක්‍රමයෙන් පිටපත් ලබා ගැනිණ. එවැනි සිතුවම් 36 ක් විය. පහත සඳහන් වන්නේ ඉන් කිහිපයකි.
    - සිද්ධාර්ථ කුමාරෝත්පත්තිය
    - පියුම් පිට වැඩීම
    - ශිල්ප දැක්වීම
    - සිදුහත් යශෝධරා සරණ මංගල්‍යය
    - සිදුහත් කුමරු හා මව් බිසව
    - දුෂ්කර ක්‍රියාව
    - සීවලී මහරහතන් වහන්සේ
- එම්. සාර්ලිස් ශිල්පියා විසින් සිතුවම් ඇඳ ඇති බෞද්ධ විහාරස්ථාන කිහිපයක් පහත සඳහන් වේ.
    - කොළඹ මාලිගාකන්ද විහාරය
    - ඉඳුරුවේ යාලගම විහාරය
    - මතුගම පාන්තිය ශ්‍රී මංගල විහාරය
    - පොතුපිටියේ පූජාරාමය
- එම්. සාර්ලිස් ශිල්පියාගේ සිතුවම්වල දැකිය හැකි කලා ලක්ෂණ
    - මනා සම්පිණ්ඩනය
    - පර්යාලෝක ලක්ෂණ දැක්වීම
    - එළිය අඳුර හා ත්‍රිමාන ලක්ෂණ දැක්වීම
    - දීප්තිමත් වර්ණ භාවිතය
    - විචිත්‍ර සැරසිලිකරණය
    - බටහිර ස්වභාවික ශෛලියේ ආභාසය

**සිදුහත් කුමරු හා මව් බිසව (ලිතෝ මුද්‍රිත)**



- අපරදිග/බටහිර ස්වභාවිකවාදී චිත්‍ර ශෛලියේ ආභාසය අනුව රූප රචනය කර ඇත.
- පුනරුද යුගයේ චිත්‍ර ශිල්පීන් අඳින ලද මරියතුමිය හා ජේසු බිළිඳා දැක්වෙන මැඩෝනා චිත්‍රවල ආභාසය දැක ගත හැකි ය.
- සිතුවමේ මානව රූප සඳහා විචිත්‍ර ලෙස යොදා ඇති වස්ත්‍රාභරණ පෙරදිග ශෛලියේ ආභාසය පෙන්නුම් කරයි. විශේෂයෙන් ඉන්දියානු සම්ප්‍රදායේ ඇඳුම් පැළඳුම්වල ලක්ෂණ කැපී පෙනේ.
- රූපවල ත්‍රිමාන ලක්‍ෂණ ඉතා හොඳින් මතු කර ඇති අතර විචිත්‍ර වර්ණමාලාවක් ද වේ.
- සිදුහත් කුමරු හා මව් බිසව දක්වා ඇත්තේ මාළිගා අභ්‍යන්තර සමීප රූප දර්ශනයක් ලෙස ය.
- සමස්ත සිතුවමේ පෙරබිම සහ පසුබිම පමණක් දක්වා ඇත. මාළිගා කවුළුවෙන් පෙනෙන පසුබිම පර්යාලෝක ලක්ෂණ සහිත භූමි දර්ශනයක් ලෙස දක්වා ඇත.

**පියුම් පිට වැඩීම (ලිතෝ මුද්‍රිත)**



- චිත්‍ර අවකාශයේ ගැඹුර මතුවන සේ පර්යාලෝක ලක්ෂණ පෙන්වමින් ස්වභාවිකවාදී ශෛලියකින් රූප සංරචනය කිරීම දක්නට ලැබේ.
- පෙරබිම, මැදබිම සහ පසුබිම යන තල මත පර්යාලෝක ලක්ෂණයට අනුගත වෙමින් රූප හා සිද්ධි ගණනාවක් සිතුවම් කර ඇත.
- සිතුවමේ පසුබිම අවකාශ පර්යාලෝක ලක්ෂණ සහිතව භූමි දර්ශනයකින් සමන්විත ය.
- ත්‍රිමාන ලක්ෂණ මතුවන සේ විචිත්‍ර වර්ණමාලාවක් භාවිත කර ඇත.

**නිපුණතාව 6.0** : **ආගමික හා සංස්කෘතික අංග, දෙස්, විදෙස් තෝරාගත් ශිල්පීන්ගේ කලා නිර්මාණ, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලීව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 6.1** : **තෝරාගත් දේශීය ශිල්පීන්ගේ නිර්මාණ රසාස්වාදය කරයි.**

**ක්‍රියාකාරකම 6.1.2** : **''සෝලියස් මෙන්ඩිස් ශිල්පියාගේ සිතුවම් අගයමු.''**

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01 යි

**ඉගෙනුම් පල** :

- සෝලියස් මෙන්ඩිස් ශිල්පියාගේ චිත්‍ර නිර්මාණ හඳුනාගෙන නම් කරයි.
- නව නිර්මාණාත්මක සිතුවම් ශෛලිය සඳහා පදනම් වූ ආභාස විමසා බලයි.
- නිර්මාණ සඳහා පදනම් වු චිත්‍ර මූලිකාංග හා සංරචන සිද්ධාන්ත ලක්ෂණ විස්තර කරයි.
- සෝලියස් මෙන්ඩිස් ශිල්පියාගේ චිත්‍රවල කලා ලක්ෂණ රස විඳිමින් ඇගයීමට ලක් කරයි.

**ගුණාත්මක යෙදවුම්** :

- සෝලියස් මෙන්ඩිස් චිත්‍ර ශිල්පියාගේ කැලණි විහාර සිතුවම්
  - හේමමාලා හා දන්ත කුමරු දන්ත ධාතුව වැඩම කරවීම
  - සංඝමිත්තා මෙහෙණින් වහන්සේ ශ්‍රී මහා බෝධිය වැඩම කරවීම
- ඇමුණුම 6.1.2.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 6.1.2.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 6.1.2.1** :

- සෝලියස් මෙන්ඩිස් ශිල්පියාගේ විහාර සිතුවම් දැක්වෙන පින්තූර වෙත සිසු අවධානය යොමු කරවන්න.
- එම සිතුවම්වල ආභාසය, වස්තු විෂයය, ශෛලිය පිළිබඳව සිසුන්ගෙන් විමසන්න.

(මිනිත්තු 10 යි)

**පියවර 6.1.2.2** :

- ඇමුණුම 6.1.2.1 කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- ඇමුණුම 6.1.2.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව කියවීමට සලස්වන්න.
- කියවීම් පත්‍රිකාව ඇසුරින් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සිසුන්ට සහායවන්න.

(මිනිත්තු 20 යි)

**පියවර 6.1.2.3** :

- අහඹු ලෙස තෝරාගත් සිසුන් කිහිපදෙනෙකුගේ, පිළිතුරු පත් ඇගයීමට ලක් කරන්න.

- එක්රැස්කරගත් තොරතුරු හා සිසුන්ගේ පිළිතුරු සැලකිල්ලට ගනිමින් සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 6.1.2.1 හා ඇමුණුම 6.1.2.2 පදනම් කර කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- සෝලියස් මෙන්ඩිස් ශිල්පියාගේ කැලණි විහාර සිතුවම් නම් කිරීම
- සිතුවම් නිර්මාණය සඳහා සෝලියස් මෙන්ඩිස් ශිල්පියාට ලැබුණ ආභාස විස්තර කිරීම
- එම නිර්මාණවල ශෛලීය ලක්ෂණ පැහැදිලි කිරීම
- සෝලියස් මෙන්ඩිස් ශිල්පියාගේ බෞද්ධ සිතුවම්වල කලා ලක්ෂණ රසවිඳිමින් ඇගයීමට ලක් කිරීම

**ඇමුණුම 6.1.2.1**

## කාර්ය පත්‍රිකාව

- සෝලියස් මෙන්ඩිස් ශිල්පියාගේ නිර්මාණ හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.

  පහතින් දක්වා ඇති ක්‍රියාකාරකම්වල නිරතවන්න.

  1. සෝලියස් මෙන්ඩිස් ශිල්පියා පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.
  2. පහත සඳහන් කරුණු සැලකිල්ලට ගනිමින් සෝලියස් මෙන්ඩිස් ශිල්පියාගේ නිර්මාණ අර්ථවත් ඇගයීමක් කරන්න.

     i. තේමාව
     
     i. අභාසය
     
     iii. ශිල්ප ක්‍රමය
     
     iv. කලා ලක්ෂණ
     - රූප සංරචනය
     - වර්ණ භාවිතය
     - රේඛාකරණය
     - තලය භාවිතය
     - භාව ප්‍රකාශනය
- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරගන්න.

ඇමුණුම 6.1.2.2

## කියවීම් පත්‍රිකාව

- වර්ෂ 1897 ජූනි 17 වන දින හලාවත මාදම්පේ නගරයට නුදුරු මහවැව දී සෝලියස් මෙන්ඩිස් උපත ලබා ඇත.
- කැලණි විහාර බිතු සිතුවම් නව බෞද්ධ විහාර චිත්‍ර ශෛලියක් හඳුන්වා දීමට පුරෝගාමී විය.
- කැලණි විහාරයේ සිතුවම් නිර්මාණය කිරීමට ආභාසය වී ඇත්තේ, ඉන්දියාවේ අජන්තා, එල්ලෝරා හා භාග් වැනි ස්ථානවල කලා නිර්මාණ හා ලංකාවේ සීගිරිය, තිවංක පිළිමගේ වැනි ඉපැරණි සිතුවම් නිර්මාණයන් ය.
- කැලණි විහාරයේ සිතුවම්වලට අමතරව රණස්ගල්ල විහාරය, ගිරිඋල්ල මැද්දෙපොළ විහාරය, හබරාදූව පිටිදූව කැලණිගොඩ විහාරය, සහ පොළොන්නරුව ශ්‍රී විජය විහාරය යන විහාරස්ථානවල ද සෝලියස් මෙන්ඩිස් සිතුවම් ඇඳ ඇත.
- නව කැලණි විහාරයේ බිතු සිතුවම් තේමාත්මකව කොටස් දෙකකි.
    - බුද්ධ චරිතයේ විවිධ අවස්ථා
    - ඓතිහාසික සිද්ධි/ පුවත්

**බුද්ධ චරිතයේ අවස්ථා**

- මහමායා දේවිය දුටු සිහිනය
- වප් මඟුල
- සිප් සතර හැදෑරීම
- සුජාතාවගේ කිරිපිඬු දානය
- සම්බුද්ධත්වයට පත්වීම
- සම්බුද්ධ පරිනිර්වාණය

**ඓතිහාසික සිද්ධි**

- විජය කුමරුගේ ලංකාගමනය
- අනුරාධපුර මහාසීමාව බැඳීම
- අළුවිහාරයේ දී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම
- හේමමාලි කුමරිය හා දන්ත කුමරු ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩම කරවීම
- සංඝමිත්තා තෙරණියෝ ශ්‍රී මහබෝධි අංකුරය ලක්දිවට වැඩම කරවීම
- බුදුන්වහන්සේගේ ලංකාගමනය දැක්වෙන මහියංගනං, නාගදීපං, කල්‍යාණිං පදලාංඡනං යන ප්‍රධාන සිතුවම් සතර

**කැලණි විහාරයේ චිත්‍රවල දැකිය හැකි පොදු ලක්ෂණ**

- රිද්මයානුකූල හා විස්තරාත්මක මානව රූප සම්පිණ්ඩනය
- ප්‍රාණපූර්ණ සියුම් රේඛාකරණය
- සියුම් ව ගොඩනඟන ත්‍රිමාන ලක්ෂණ සහිත අඳුරු කහ, දුඹුරු, කළු, සුදු ආදී වර්ණමාලාවක් භාවිත කිරීම
- අඳුර තුළින් ආලෝකය වඩාත් තීව්‍ර ලෙස මතු කර දක්වන, කියරෝස්කුරෝ (Chiaroscuro) සිද්ධාන්තයට සමාන වර්ණ ගැන්වීමේ ලක්ෂණ පෙන්වීම
- විශාල අවකාශයක් මත ක්‍රියාකාරී රූප බොහෝ ගණනක් එකට සම්පිණ්ඩනය කිරීම
- වියළි බදාමය මත බිතු සිතුවම් ඇඳීමේ ශිල්ප ක්‍රමය වන ප්‍රෙස්කෝ සිකෝ ශිල්ප ක්‍රමය භාවිතය

**හේමමාලා කුමරිය හා දන්ත කුමරු ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩම කරවීම**

- කීර්ති ශ්‍රී මේඝවර්ණ රජ සමයේ (ක්‍රි. ව. 301 -328) කලිඟු රට ගුහසීව නම් රජතුමා විසින් දළදා වහන්සේගේ ආරක්ෂාව පතා හේමමාලා කුමරිය හා දන්ත කුමරු අත ශ්‍රී ලංකාද්වීපයට ශ්‍රී දළදා වහන්සේ වැඩම කරවීම මෙයින් නිරූපණය කෙරේ.
- විශාල අවකාශයක් මත මානව රූප ලාලිත්‍යමය ඉරියව්වලින් යුතුව සම්පිණ්ඩනය කර ඇත.
- ඓතිහාසික බිතු සිතුවම්වල දක්නට ලැබෙන සංගත වර්ණමාලාවක් භාවිත කරමින් ත්‍රිමාණ ලක්ෂණ සියුම් ලෙස මතු කර ඇත.
- සිතුවම් සඳහා වර්ණ යෙදීමේ දී අඳුරු කහ, දුඹුරු, කළු, සුදු ආදී වර්ණවල ප්‍රභේද මතුවන අයුරින් චිත්‍ර නිර්මාණය කර ඇත.
- රිද්මයානුකූල හා ප්‍රකාශන ගුණයෙන් යුතු රූප සියුම් රේඛාකරණයෙන් පරිපූර්ණත්වයට පත් කර ඇත.
- මෙම සිතුවමේ පසුබිම දැක්වීමේ දී ශිල්පියා ස්වභාවික පරිසරයේ අපූර්වත්වය ගම්‍යමාන වන සේ ප්‍රතිනිර්මාණය කර ඇත.

**සංඝමිත්තා තෙරණින් වහන්සේ ජය ශ්‍රී මහබෝධිය ශ්‍රී ලංකාවට වැඩම කරවීම**

- මෙම සිතුවමින් නිරූපණය වන්නේ ඉන්දියාවේ ධර්මාශෝක රජතුමාගේ දියණියක වූ සංඝමිත්තා තෙරණිය විසින් ශ්‍රී මහා බෝධි ශාකාවක් ලංකාවට රැගෙන ඒම සහ සිරිලක රජ කළ දෙවනපෑතිස් රජතුමා දියට බැස ශ්‍රී මහා බෝධිය භාරගැනීමට සූදානම්වන අවස්ථාව වේ.
- විශාල තලයක් මත සිතුවම සම්පිණ්ඩනයේ දී ඇතිවන අභියෝග ජය ගනිමින් අදාළ ප්‍රස්තුතය තලයට ගොනු කර ගැනීමේ දී ශිල්පීය හැකියාව රූප, වර්ණ හා රේඛා සංරචනය මගින් මැනවින් ප්‍රකාශ වේ.
- මෙම සිතුවමින් දක්වෙන රුවල් නැව ඉතා විස්තරාත්මක හැඩතල මගින් හා ජලයෙහි චාලක ස්වරූපය සියුම් රේඛාකරණය මගින් ද ඉතා විසිතුරු ලෙස දක්වා ඇත.
- පැරණි සාම්ප්‍රදායික චිත්‍ර කලාවේ රිද්මයානුකූල රේඛාවට නව ජීවයක් එක් කරමින් හා සම්ප්‍රදායික සංගත වර්ණමාලාවකට අනුගත ව අඳුරු කහ, දුඹුරු, කොළ, සුදු, කළු ආදී වර්ණ භාවිත කිරීම හඳුනාගත හැකි ය.
- අඳුර තුළින් ආලෝකය වඩාත් තීව්‍ර ලෙස මතු කරන කියරෝස්කුරෝ (Chiaroscuro) නැමති වර්ණ කිරීමට සමාන ලක්ෂණ මෙම සිතුවමෙහි දැකිය හැකි ය.



හේමමාලා කුමරිය හා දන්ත කුමරු ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩම කරවීම



සංඝමිත්තා තෙරණින් වහනසේ ජය ශ්‍රී මහබෝධිය ශ්‍රී ලංකාවට වැඩම කරවීම

නිපුණතාව 6.0 : ආගමික හා සංස්කෘතික අංග, දෙස්, විදෙස් තෝරාගත් ශිල්පීන්ගේ කලා නිර්මාණ, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලීව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.

නිපුණතා මට්ටම 6.1 : තෝරාගත් දේශීය ශිල්පීන්ගේ නිර්මාණ රසාස්වාදය කරයි.

ක්‍රියාකාරකම 6.1.3 : "ජෝර්ජ් කීට් ශිල්පියාගේ නිර්මාණ අගයමු"

කාලච්ඡේද සංඛ්‍යාව : 01 යි

ඉගෙනුම් පල :
- ජෝර්ජ් කීට් ශිල්පියාගේ නිර්මාණ නම් කරයි.
- ජෝර්ජ් කීට් ශිල්පියාගේ සිතුවම් පිළිබඳ තොරතුරු එක්රැස් කරයි.
- බෞද්ධ චිත්‍ර කලාවේ නව ශෛලියක් පිළිබිඹු කළ ගෝතමී විහාර බිතු සිතුවම් පිළිබඳ සොයා බලයි.
- නව නිර්මාණාත්මක ශෛලිය සඳහා ආභාස, චිත්‍ර මූලිකාංග හා සංරචනය කිරීමේ ක්‍රම විස්තර කරයි.
- ජොර්ජ් කීට් ශිල්පියාගේ චිත්‍රවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කරයි.

ගුණාත්මක යෙදවුම් :
- ජෝර්ජ් කීට් ශිල්පියාගේ වර්ණ චිත්‍ර
  - මාර පරාජය (බොරැල්ලේ ගෝතමී විහාරය)
  - නායිකා චිත්‍ර
- ඇමුණුම 6.1.3.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 6.1.3.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

පියවර 6.1.3.1 :
- සුදුසු ක්‍රමවේදයක් භාවිත කරමින් ජෝර්ජ් කීට් ශිල්පියාගේ සිතුවම් සිසු අවධානයට යොමු කරවන්න.
- ඔහුගේ සිතුවම් එක්රැස් කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- එම සිතුවම්වල ආභාසය, වස්තු විෂයය, ශෛලිය පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න. (මිනිත්තු 10 යි)

පියවර 6.1.3.2 :
- ඇමුණුම 6.1.3.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- ඇමුණුම 6.1.3.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- කියවීම් පත්‍රිකාව ඇසුරින් පිළිතුරු සැපයීමට සිසුන්ට උපදෙස් ලබාදෙන්න.
- පිළිතුරු සැපයීමට සිසුන්ට සහායවන්න.

(මිනිත්තු 20 යි)

පියවර 6.1.3.3 :
- අහඹු ලෙස තෝරාගත් සිසුන් කිහිපදෙනෙකුගේ පිළිතුරු පත් ඇගයීමට ලක්කරන්න.

- ජෝර්ජ් කීට් ශිල්පියාගේ නිර්මාණ පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 6.1.3.1 හා ඇමුණුම 6.1.3.2 පදනම් කර කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- ජාත්‍යන්තර කීර්තියට පත් වූ චිත්‍ර ශිල්පියකු ලෙස ජෝර්ජ් කීට් කළ නිර්මාණ සොයා බැලීම
- ජෝර්ජ් කීට් ශිල්පියාගේ සිතුවම්වල ශෛලී ලක්ෂණ විස්තර කිරීම
- බෞද්ධ චිත්‍ර කලාවේ නව ශෛලියක් ඇති කළ චිත්‍ර ශිල්පියකු බව ප්‍රකාශ කිරීම
- ඔහුගේ නිර්මාණ සඳහා බලපෑ යුරෝපීය හා හින්දු කලා සම්ප්‍රදායන්ගේ ආභාසය විස්තර කිරීම
- ජෝර්ජ් කීට් ශිල්පියාගේ චිත්‍රවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කිරීම

**ඇමුණුම 6.1.3.1**

## කාර්ය පත්‍රිකාව

- ඔබට ඉදිරිපත් කර ඇති ජෝර්ජ් කීට්ගේ නිර්මාණ හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- ජෝර්ජ් කීට්ගේ නිර්මාණවල පවතින සුවිශේෂී ලක්ෂණ හඳුනාගන්න.
- පහත සඳහන් ක්‍රියාකාරකම්හි නිරතවන්න.
  1. ජෝර්ජ් කීට් ශිල්පියා පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
  2. ඔහුගේ ප්‍රසිද්ධ නිර්මාණ හා ඒවා හමුවන ස්ථාන නම් කරන්න.
  3. එම එක් එක් නිර්මාණ පහත සඳහන් කරුණු යටතේ ඇගයීමට ලක් කරන්න.
     - i. තේමාව
     - ii. ශෛලිය
     - iii. අභාසය
     - iv. ශිල්ප ක්‍රමය
     - v. කලා ලක්ෂණ
       - රූප භාවිතය
       - වර්ණ භාවිතය
       - තලය භාවිතය
       - භාව ප්‍රකාශනය
- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරගන්න.

ඇමුණුම 6.1.3.2

## කියවීම් පත්‍රිකාව

- ආසියාවේ විශිෂ්ට චිත්‍ර ශිල්පියකු වශයෙන් ප්‍රසිද්ධියට පත් ජෝර්ජ් කීට් ක්‍රි.ව. 1901 අප්‍රේල් 17 වන දින මහනුවර අම්පිටියේ දී සිංහල බර්ගර් පවුලක උපත ලැබී ය.
- මහනුවර ත්‍රිත්ව විදුහලෙන් මූලික අධ්‍යාපනය ලබා ඇත.
- ඔහු 43 කණ්ඩායමට අයත් චිත්‍ර ශිල්පියකු වන අතර ගෝතමී විහාරයේ බිතුසිතුවම් ද නිර්මාණය කර ඇත.
- නූතන යුගයේ ප්‍රවීණ චිත්‍ර ශිල්පියකු වන ඔහු තම සිතුවම් නිර්මාණවලට හින්දු කලා ආභාසය හා යුරෝපයේ පැබ්ලෝ පිකාසෝගේ ඝනිකවාදී චිත්‍ර ශෛලියේ කලා ආභාසය සහිත ව ඔහුටම ආවේණික චිත්‍ර ශෛලියක් නිර්මාණය කරගැනීම දැකිය හැකි ය.
- කොළඹ - බොරැල්ල ගෝතමී විහාරයේ බෞද්ධ සිතුවම් ඇඳීම වර්ෂ 1939 - 1940 කාලය තුළ සිදුවිය.
- ගෝතමී විහාරයේ බිතු සිතුවම් චිත්‍රාවලියක් සේ ඇඳ ඇති අතර එහි දැකිය හැකි සුවිශේෂී අවස්ථා කිහිපයක් පහත දැක්වේ.
  - මහමායා දේවිය දුටු සිහිනය
  - සිද්ධාර්ථ කුමාරෝත්පත්තිය
  - සරණ මංගල්‍ය
  - නළඟනන්ගේ විකාර දැකීම
  - සතර පෙර නිමිති දැකීම
  - මාරපරාජය
- මෙම සිතුවම් සෙ.මී. 192 ක් පමණ උස්වූ බිත්තියක ජීව ප්‍රමාණයෙන් ඇඳ ඇත.
- ජෝර්ජ් කීට් ශිල්පියා සිතුවම් නිර්මාණයේ දී රේඛාවට ප්‍රධාන තැනක් ලබා දී ඇති අතර එම රේඛා ඍජු රේඛා, කෙටි රේඛා, වක්‍ර රේඛා වශයෙන් හඳුනාගත හැකි ය.
- නිතැතින් ම ගලායන ජීවමය ගුණයෙන් යුතු රේඛාවෙන් රූපවල පිරුණු බව මනා ව ඉස්මතු කර ඇත.
- රතු, සුදු, දුඹුරු, කහ, නිල්, කොළ යන වර්ණ භාවිත කරමින් සියුම් ලෙස ත්‍රිමාන ලක්ෂණ මතු කර ඇත.
- මෙම සිතුවම් වියළි බදාමයේ අඳින ලද බිතුසිතුවම් ක්‍රමය වන ප්‍රෙස්කෝ සිකෝ ශිල්ප ක්‍රමයට නිර්මාණය කර ඇත.

### මාරපරාජය

- ගෝතමී විහාරයේ සිතුවම් අතර සුවිශේෂී සිතුවමක් ලෙස සැලකෙන 'මාර පරාජය' හින්දු කලා ලක්ෂණ හා පිකාසෝගේ ඝනිකවාදී ශෛලීය ලක්ෂණ ආභාසය කර ගත් නිර්මාණයකි.
- ඝනිකවාදී හැඩතල භාවිත කිරීමෙන් මාරසේනාවේ මුහුණුවල රුදුරු භයංකර විලාසය මැනවින් ඉස්මතු කර ඇත.
- මාර පිරිසට දුඹුරු, අළු, කළු වැනි අඳුරු වර්ණත් බුදුන්වහන්සේ සඳහා අඳුරු කහ, ලා දුඹුරු වැනි වර්ණත් යොදා ගනිමින් ත්‍රිමාන ලක්ෂණ සහිත ව සිතුවම වර්ණවත් කර ඇත.
- රූප වටා පරිපූර්ණත්වය හා නිමාව පෙන්වන නිර්මාණශීලී රේඛාකරණය ඔහුට ම ආවේණික වූවකි.




**නායිකා චිත්‍ර**

- ජෝර්ජ් කීට් ශිල්පියා විසින් නායිකා චිත්‍ර ගණනාවක් ඇඳ ඇත.
- මෙම සිතුවම් තෙල් සායම් මාධ්‍යයෙන් කැන්වස් මත කරන ලද චිත්‍ර නිර්මාණයන් ය.
- නායිකා සිතුවම් අනුරාගී බවින් යුතු ප්‍රකාශනයන් වන අතර ඒ බව දැක්වීම සඳහා පුළුල් ඇස් හා හා පුළුල් දෙතොල් නිරූපණය කර ඇත.
- නිර්මාණයේ අලංකරණය මෙන්ම ප්‍රකාශන ශක්තිය තීව්‍ර කිරීම සඳහා ද රේඛාකරණය මැනවින් භාවිත කර ඇත.
- මෙම කලා නිර්මාණ සඳහා ආභාස වශයෙන් බටහිර ඝනිකවාදී කලා ලක්ෂණ මෙන් ම හින්දු දර්ශනයේ තන්ත්‍රයාන ලක්ෂණ ද ලැබී ඇතැයි විචාරක මතයයි.
- අඳුරු වර්ණ මෙන්ම පැහැදිලි දීප්තිමත් වර්ණ එකට සංකලනය කර වර්ණවත් කර තිබීම මෙම නායිකා සිතුවම්වලින් දැකිය හැකි ය.




| | | |
|---|---|---|
| **නිපුණතාව 6.0** | : | **ආගමික හා සංස්කෘතික අංග, දෙස්, විදෙස් තෝරාගත් ශිල්පීන්ගේ කලා නිර්මාණ, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලීව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.** |
| **නිපුණතා මට්ටම 6.1** | : | **තෝරාගත් දේශීය ශිල්පීන්ගේ නිර්මාණ රසාස්වාදය කරයි.** |
| **ක්‍රියාකාරකම 6.1.4** | : | **"ඩේවිඩ් පේන්ටර් ශිල්පියාගේ නිර්මාණ අගයමු"** |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | : | **01 යි** |

**ඉගෙනුම් පල** :

- ඩේවිඩ් පේන්ටර් ශිල්පියාගේ නිර්මාණ සොයා බලයි.
- යුරෝපීය ස්වභාවිකවාදී සම්ප්‍රදායන්ගේ ආභාසය ඔහුගේ නිර්මාණ ආශ්‍රිත ව විස්තර කරයි.
- නිර්මාණවල චිත්‍රමය ගුණාංග විමසා බලයි.
- ඩේවිඩ් පේන්ටර් ශිල්පියාගේ චිත්‍රවල සුවිශේෂී කලා ලක්ෂණ ඇගයීමට ලක් කරයි.

**ගුණාත්මක යෙදවුම්** :

- ඩේවිඩ් පේන්ටර් ශිල්පියාගේ වර්ණ චිත්‍ර
  - ජයග්‍රාහි ලෙස ජෙරුසෙලමට ඇතුල් වීම- කොළඹ කලාභවන
  - යහපත් සමරිතානුවරයා (Good Samarithan) ත්‍රිත්ව දෙව්මැදුර
- ඇමුණුම 6.1.4.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 6.1.4.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 6.1.4.1** :

- සුදුසු ක්‍රමවේදයක් භාවිත කරමින් ඩේවිඩ් පේන්ටර් ශිල්පියාගේ සිතුවම් සිසු අවධානයට යොමු කරවන්න.
- ඩේවිඩ් පේන්ටර් ශිල්පියාගේ සිතුවම් එක්රැස් කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- එම සිතුවම්වල ආභාසය, වස්තු විෂය, ශෛලිය පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.

(මිනිත්තු 10 යි)

**පියවර 6.1.4.2** :

- ඇමුණුම 6.1.4.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- ඇමුණුම 6.1.4.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- කියවීම් පත්‍රිකාව ඇසුරින් පිළිතුරු සැපයීමට සිසුන්ට උපදෙස් ලබා දෙන්න.
- පිළිතුරු සැපයීමට සිසුන්ට සහායවන්න.

(මිනිත්තු 20 යි)

**පියවර 6.1.4.3** :

- අහඹු ලෙස තෝරාගත් සිසුන් කිහිප දෙනෙකුගේ පිළිතුරු පත් ඇගයීමට ලක් කරන්න.

- ඩේවිඩ් පේන්ටර් ශිල්පියාගේ නිර්මාණ පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 6.1.4.1 හා ඇමුණුම 6.1.4.2 පදනම් කර කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- චිත්‍ර ශිල්පියකු ලෙස ඩේවිඩ් පේන්ටර් කළ නිර්මාණ සොයා බැලීම
- ඩේවිඩ් පේන්ටර් ශිල්පියාගේ චිත්‍රවල විවිධ ශෛලීය ලක්ෂණ විස්තර කිරීම
- ක්‍රිස්තියානි චිත්‍ර කලාවේ නව පෙරළියක් ඇති කළ චිත්‍ර ශිල්පියකු බව ප්‍රකාශ කිරීම
- යුරෝපීය ස්වභාවිකවාදී සම්ප්‍රදායන්ගේ ආභාසය ඔහුගේ නිර්මාණ ආශ්‍රිත ව විස්තර කිරීම
- ඩේවිඩ් පේන්ටර් ශිල්පියාගේ චිත්‍රවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කිරීම

**ඇමුණුම 6.1.4.1**

## කාර්ය පත්‍රිකාව

- ඔබට ඉදිරිපත් කර ඇති ඩේවිඩ් පේන්ටර්ගේ නිර්මාණ හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- පහත සඳහන් ක්‍රියාකාරකම්හි නිරතවන්න.

1. ඩේවිඩ් පේන්ටර් ශිල්පියා පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
2. ඔහුගේ ප්‍රසිද්ධ නිර්මාණ හා ඒවා හමුවන ස්ථාන නම් කරන්න.
3. පහත සඳහන් කරුණු යටතේ ඩේවිඩ් පේන්ටර් ශිල්පියාගේ නිර්මාණ ඇගයීමට ලක් කරන්න.

i. තේමාව

ii. ශෛලිය

iii. අභාසය

iv. ශිල්ප ක්‍රමය

v. කලා ලක්ෂණ
- රූප භාවිතය
- වර්ණ භාවිතය
- තලය භාවිතය
- භාව ප්‍රකාශනය

- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරගන්න.

ඇමුණුම 6.1.4.2

## කියවීම් පත්‍රිකාව


- විශිෂ්ට චිත්‍ර ශිල්පියකු ලෙස ප්‍රසිද්ධියට පත් ඩේවිඩ් පේන්ටර් වර්ෂ 1900 දී උතුරු ඉන්දියාවේ ඇල්මෝරා හි දී ඉංග්‍රීසි ජාතික මිෂනාරි පියෙකුට හා සිංහල මවකට දාව උපත ලැබීය.
- ඔහු එංගලන්තයේ රෝයල් ඇකඩමියේ චිත්‍ර කලාව පිළිබඳ අධ්‍යාපනය ලබා ඇත.
- යුරෝපීය ශාස්ත්‍රාලීය චිත්‍ර කලාවේ ස්වභාවිකවාදී චිත්‍ර කලා ආභාසය සහිතව ඔහුටම ආවේණික චිත්‍ර ශෛලියක් නිර්මාණය කරගෙන ඇත.
- ප්‍රවීණ චිත්‍ර ශිල්පියකු වන ඔහු ලංකා කලා සංගමයට අයත් අද්‍යතන යුගයේ චිත්‍ර ශිල්පියකු වේ.
- ඩේවිඩ් පේන්ටර්ගේ නිර්මාණ සඳහා වස්තු විෂය වූ තේමා පහතින් දැක්වේ.
    - ප්‍රතිරූප
    - භූමි දර්ශන
    - මානව රූප සම්පිණ්ඩන
    - ත්‍රිත්ව දෙව්මැදුරේ බිතු සිතුවම්
- ඩේවිඩ් පේන්ටර් චිත්‍ර ශිල්පියාගේ නිර්මාණ ශෛලිය හා චිත්‍ර මූලිකාංග සංරචන කිරීමේ ලක්ෂණ
    - ජීවගුණය හා කායික සුන්දරත්වය මැනැවින් පිළිබිඹුවන ලෙස මානව රූප චිත්‍රණය කිරීම
    - චිත්‍රයේ ගැඹුර හා පර්යාලෝක ලක්ෂණ නිරූපණය
    - මිනිස් ඉරියව් ලාලිත්‍යයෙන් හා හැඟීම් ප්‍රකාශනයෙන් යුතු වීම
    - ත්‍රිමාන ලක්ෂණ සහිත ව දීප්තිමත් වර්ණමාලාවක් භාවිත කිරීම
    - ක්‍රිස්තියානි තේමා නිරූපණය කිරීමේ දී යුරෝපීය සංස්කෘතිය හා භූතලය වෙනුවට ශ්‍රී ලාංකීය සමාජ පසුබිමක චිත්‍රණය කර තිබීම

**ජයග්‍රාහී ලෙස ජෙරුසෙලමට ඇතුළු වීම**



- ජාතික කලාභවනේ නිත්‍ය ප්‍රදර්ශනයට තබා ඇති මෙම සිතුවම කැන්වසය මත තෙල් සායම් මාධ්‍යයෙන් කරන ලද නිර්මාණයකි.
- චිත්‍රයේ දක්වන මානව රූප ඉරියව් කායික සුන්දරත්වය දක්වන ලාලිත්‍යයෙන් යුතුව චිත්‍රණය කර ඇති අතර ඒවා හැඟීම් ප්‍රකාශනයෙන් යුතුව නිරූපණය කෙරේ.
- තලය මත රූප සංරචනය කිරීමේ දී පෙරබිම, මැද බිම හා පසුබිම මත රූප පිහිටවමින් චිත්‍රයයේ ගැඹුර හා පර්යාලෝක ලක්ෂණ නිරූපණය කර ඇත.
- ත්‍රිමාන ලක්ෂණ සහිතව වඩාත් රෝස පැහැයට හුරු දීප්තිමත් වර්ණමාලාවක් භාවිත කර ඇත.
- චිත්‍රයේ පසුබිම සඳහා දක්වා ඇත්තේ ජෙරුසරම කාන්තාරය වෙනුවට ලාංකීය වියළි කලාපීය කඳු සහිත භූ පරිසරයකි.

**යහපත් සමරිතානුවරයා (Good Samarithan)**



- මෙම සිතුවම මහනුවර ත්‍රිත්ව දෙව්මැදුරේ දැකිය හැකි සිතුවමකි.
- මින් නිරූපණය වන්නේ ජේසුස් වහන්සේ දේශනා කරන ලද උපමා කථාවක අවස්ථාවකි. එනම් යහපත් සමරිතානුවරයා පහරදීමකට ලක්වී තුවාල ලැබූ පුද්ගලයකු හට පිහිටවන ආකාරයයි.
- ජේසුස් වහන්සේගේ කතා පුවත සහිත මහනුවර ත්‍රිත්ව දෙව්මැදුරේ බිතු සිතුවම්වල සුවිශේෂත්වය වන්නේ යුරෝපීය සංස්කෘතිය හා භූ තලය වෙනුවට ශ්‍රී ලාංකේය සමාජ පසුබිම නිරූපණය කර තිබීමයි.
- ශ්‍රී ලාංකේය මිනිස් රූප, ඇඳුම් පැළඳුම් හා පරිසර ස්වභාවය මෙම චිත්‍රයේ කැපී පෙනෙන ලක්ෂණයෝ ය.
- යුරෝපීය ශාස්ත්‍රාලීය චිත්‍ර කලාවේ සංරචන සිද්ධාන්ත ලක්ෂණ වන ගැඹුර නිරූපණය කරන පර්යාලෝක ලක්ෂණ හා ත්‍රිමාන ලක්ෂණ භාවිතය මෙම නිර්මාණවල දැකිය හැකි ය.

**නිපුණතාව 6.0** : **ආගමික හා සංස්කෘතික අංග, දෙස්, විදෙස් තෝරාගත් ශිල්පීන්ගේ කලා නිර්මාණ, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලීව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 6.1** : **තෝරාගත් දේශීය ශිල්පීන්ගේ කලාකෘති රසාස්වාදය කරයි.**

**ක්‍රියාකාරකම 6.1.5** : **''තාවඩි මු. තුරෙයිසාමි ශිල්පියාගේ නිර්මාණ අගයමු''**

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01 යි

**ඉගෙනුම් පල** :
- තාවඩි මු. තුරෙයිසාමි ශිල්පියාගේ නිර්මාණ දැක ගත හැකි ස්ථාන නම් කරයි.
- එම ස්ථානවල ඇති සිතුවම් නම් කරයි.
- ඔහුගේ නිර්මාණ සඳහා ලැබුණු ආභාස විස්තර කරයි.
- සිතුවම් සඳහා යොදා ගත් වර්ණවල ස්වභාවය විමසා බලයි.
- තාවඩි තුරෙයිසාමිගේ චිත්‍ර නිර්මාණවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- තාවඩි මු. තුරෙයිසාමි ශිල්පියාගේ වර්ණ චිත්‍ර
  - සුදු කුකුළාගේ රූපය
  - සුදු අත් සහිත පූජක රූපය හා ගණපති රූපය- නල්ලූර් සට්ටනාදර් හින්දු කෝවිලේ ඇති බිතු සිතුවම්
- ඇමුණුම 6.1.5.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 6.1.5.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 6.1.5.1** :
- තාවඩි මු. තුරෙයිසාමි ශිල්පියාගේ චිත්‍ර නිර්මාණ සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- එම නිර්මාණවල පසුබිම පිළිබඳව සිසුන්ගෙන් ප්‍රශ්න කරමින් සිතුවම්වල වස්තු විෂය, ආභාස, ශෛලිය හා ශිල්ප ක්‍රම ගැන සිසුන්ගෙන් විමසන්න.
- දේශීය චිත්‍ර ශිල්පීන්ගේ නිර්මාණ අගය කිරීමේ වැදගත්කම පිළිබඳ සිසුන් දැනුවත් කරන්න. (මිනිත්තු 10 යි)

**පියවර 6.1.5.2** :
- ඇමුණුම 6.1.5.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- ඇමුණුම 6.1.5.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව සිසුන්ට ලබා දී එය අධ්‍යයනය කිරීමට අවශ්‍ය උපදෙස් හා මග පෙන්වීම ලබා දෙන්න.
- කියවීම් පත්‍රිකාව කියවා අවබෝධයෙන් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සිසුන් යොමු කරවන්න.

(මිනිත්තු 20 යි)

**පියවර 6.1.5.3** : 
- අභඹු ලෙස තෝරාගත් සිසුන් කිහිප දෙනෙකුගේ පිළිතුරු පත් ඇගයීමට ලක් කරන්න.
- තාවඩි මු. තුරෙයිසාමි ශිල්පියාගේ නිර්මාණ පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 6.1.5.1 හා ඇමුණුම 6.1.5.2 පදනම් කර කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- තාවඩි මු. තුරෙයිසාමි ශිල්පියාගේ සිතුවම් නම් කිරීම
- ඔහුගේ සිතුවම්වල කලා ලක්ෂණ සොයා බැලීම
- හින්දු ආගමික චිත්‍ර කලාවේ නව ශෛලියක් ඇති කළ චිත්‍ර ශිල්පියකු බව ප්‍රකාශ කිරීම
- ඔහුගේ නිර්මාණ සඳහා බලපෑ හින්දු කලා සම්ප්‍රදායන්ගේ ආභාසය විස්තර කිරීම
- තාවඩි මු. තුරෙයිසාමි සිතුවම් රසවිඳිමින් ඇගයීමට ලක්කිරීම

**ඇමුණුම 6.1.5.1**

## කාර්ය පත්‍රිකාව

- ඔබට ඉදිරිපත් කර ඇති තාවඩි මු. තුරෙයිසාමිගේ නිර්මාණ හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- පහත සඳහන් ක්‍රියාකාරකම්හි නිරතවන්න.

1. තාවඩි මු. තුරෙයිසාමි ශිල්පියා පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
2. ඔහුගේ ප්‍රසිද්ධ නිර්මාණ හා ඒවා හමුවන ස්ථාන නම් කරන්න.
3. පහත සඳහන් කරුණු යටතේ තාවඩි මු. තුරෙයිසාමි ශිල්පියාගේ නිර්මාණ ඇගයීමට ලක් කරන්න.

   i. තේමාව
   ii. ශෛලිය
   iii. අභාසය
   iv. ශිල්ප ක්‍රමය
   v. කලා ලක්ෂණ - රූප භාවිතය
   - වර්ණ භාවිතය
   - තලය භාවිතය
   - භාව ප්‍රකාශනය

- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරගන්න.

ඇමුණුම 6.1.5.2

## කියවීම් පත්‍රිකාව

- තාවඩි මු. තුරෙයිසාමි 19 වන සියවස අගභාගයේ යාපනයේ තාවඩි ප්‍රදේශයේ ජීවත් වූ චිත්‍ර ශිල්පියෙකි.
- මොහු දකුණු ඉන්දීය තන්ජාවූර් (Thanjavur) සිතුවම්වල ශිල්පක්‍රම නිර්මාණ සඳහා භාවිත කර ඇත.
- එමෙන් ම යුරෝපා යථාර්ථවාදය (Realism) හා පෙරදිග සිතුවම් ලක්ෂණ සම්මිශ්‍රණයක් මොහුගේ සිතුවම්වල කැපී පෙනේ.
- යාපනයේ නල්ලූර් හි සට්ටනාදර් ශිව දේවාලයේ ඇති බිතු සිතුවම් අතර සුදු අත් ඇති පූජක රුව (ඓයර්), ගණපති රූපය, සුදු කුකුළාගේ රූපය, හා සැරසිලි මොහුගේ විශිෂ්ට නිර්මාණ වේ.
- මෙම සිතුවම්වල ස්වභාවික වර්ණ භාවිතයත් පෙරදිග සම්ප්‍රදාය අනුගමනය කරමින් ලා වර්ණ ව්‍යාප්තියක් හඳුනාගත හැකි ය.
- විශේෂයෙන් ළා දුඹුරු වර්ණ මාලාවක් මෙම සිතුවම්වල දක ගත හැකි ය.
- හුණු බදාම මත ප්‍රෙස්කෝ සිකෝ ශිල්ප ක්‍රමයට බිතු සිතුවම් නිමවා ඇත.
- තාවඩි මු. තුරෙයිසාමි ශිල්පියා තාවඩි මුරුගන් මූර්ති කෝවිලේ ද සිතුවම් නිර්මාණය කර ඇත. මෙම දේවාලයේ ඇති සිතුවම් අතර කිරි කාවඩි කරුවා, වල්ලි දෙවඟන බිහිකළ මුව දෙන, වශිෂ්ටර් හා කාරාම් පශු, කතරගම දෙවියන් මහලු බමුණකුගේ වෙස් ගෙන අලියාගෙන් වල්ලි දෙවඟන බේරීම, වැදි රූපය ආදිය වැදගත් නිර්මාණ ලෙස සැලකේ.
- ඔහුගේ චිත්‍ර නිර්මාණ කන්කසන්තුරේ වරායට අයත් ගබඩා කාමරවල හා පෞද්ගලික නිවාසවල තිබී අති අතර අද මේවා දක්නට නොලැබේ.

සුදු කුකුළාගේ රූපය



- තාවඩි මු. තුරෙයිසාමි ශිල්පියා විසින් නිර්මාණය කරන සුදු කුකුළා නැමති සිතුවම සට්ටනාදර් ශිව දේවාලයේ දැකිය හැකි වේ.
- යුරෝපීය යථාර්ථවාදී සිතුවම් ආභාසය මෙම සිතුවමේ පැහැදිලිව හඳුනාගත හැකි ය.
- ගම්භීර පෙනුමක් සහිත ව කුකුළාගේ චලනය ඉතා තාත්වික ව දක්වා ඇත.
- ලා පැහැයට හුරු දුඹුරු වර්ණ මාලාවක් සිතුවම පුරා දක්නට ලැබේ.
- වියළි බදාමය මත සිතුවම් නිර්මාණය කිරීමේ ශිල්ප ක්‍රමය වන ප්‍රෙස්කෝ සිකෝ ක්‍රමයට සිතුවම නිර්මාණය කර ඇත.

**සුදු අත් සහිත පූජක රූපය හා ගණපති රූපය**



- සට්ටනාදර් ශිව දේවාලයේ දැකිය හැකි මෙම සිතුවමින් සුදු අත් සහිත පූජකයකු ගණපතිට පූජා පවත්වන ආකාරය නිරූපණය කර තිබේ.
- ලා දුඹුරු වර්ණ සමඟ ළා වර්ණ සිතුවම සඳහා භාවිත කර ඇත.
- දකුණු ඉන්දීය තන්ජාවූර් සිතුවම්වල ආභාසයත් යුරෝපා යථාර්ථවාදී සිතුවම්වල ආභාසයත් මෙම සිතුවම් නිර්මාණ සඳහා පදනම් වී ඇත.
- පූජාවට අවශ්‍ය ද්‍රව්‍ය සහ අලංකාර තොරණක් සහිත ගණපති රූපය මෙම සිතුවමේ දැක ගත හැකි ය.
- පහන් පූජාවේ නියැළෙන සුදු අත් සහිත පූජක රුව පෙරදිග සාම්ප්‍රදායික ලක්ෂණවලින් ඇඳ ඇත.
- සිතුවමේ පසුබිම ළා පැහැයෙන් යුතු වර්ණ ගන්වා ඇත.
- ස්වාභාවිකව සකස් කර ගත් වර්ණ භාවිතයෙන් වියළි හුණු බදාමය මත සිතුවම (ප්‍රෙස්කෝ සිකෝ ක්‍රමයට) නිර්මාණය කර ඇත.

නිපුණතාව 6.0 : ආගමික හා සංස්කෘතික අංග, දෙස්, විදෙස් තෝරාගත් ශිල්පීන්ගේ කලා නිර්මාණ, අධ්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලීව රසාස්වාදයට ලක් කරමින් ඒවායේ ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.

නිපුණතා මට්ටම 6.1 : තෝරාගත් දේශීය ශිල්පීන්ගේ කලාකෘති රසාස්වාදය කරයි.

ක්‍රියාකාරකම 6.1.6 : "පෙරියතම්බි සුබ්‍රමණියම් කලාකරුවාගේ නිර්මාණ අගයමු''

කාලච්ඡේද සංඛ්‍යාව : 01 යි

ඉගෙනුම් පල :
- පෙරියතම්බි සුබ්‍රමණියම් ශිල්පියාගේ සිතුවම් නිර්මාණ දක්නට ලැබෙන ස්ථාන හා එම සිතුවම් නම් කරයි.
- ඔහුගේ නිර්මාණ සඳහා බලපෑම් (ආභාස) ඇති කළ කරුණු විස්තර කරයි.
- ඔහු තම සිතුවම් සඳහා යොදාගත් වර්ණවල ස්වභාවය ගවේෂණය කරයි.
- පෙ. සුබ්‍රමණියම් ශිල්පියාගේ නිර්මාණවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කරයි.

ගුණාත්මක යෙදවුම් :
- පෙ. සුබ්‍රමණියම් ශිල්පියාගේ වර්ණ චිත්‍ර
  - අගස්තියර් හා විනායගර් නම් සිතුවම (ඉනුවිල් පරරාසසේකර පිල්ලෙයාර් කෝවිල)
  - ඇතා විසින් වල්ලි ව එළවාගෙන යාම සිතුවම (ඉනුවිල් පරරාසසේකර පිල්ලෙයාර් කෝවිල)
- ඇමුණුම 6.1.6.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 6.1.6.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

පියවර 6.1.6.1 :
- පෙ. සුබ්‍රමණියම් ශිල්පියා නිර්මාණය කළ සිතුවම්වල ඡායා පිටපත් පන්තියේ ප්‍රදර්ශනය කර සිසු අවධානය ඒවා කෙරෙහි යොමු කරවන්න.
- එම සිතුවම්වල තේමාව, ශිල්ප ක්‍රම හා ආභාසය පිළිබඳ සිසුන්ගෙන් විමසන්න.
- දේශිය චිත්‍ර ශිල්පින්ගේ නිර්මාණ ඇගයීමේ වැදගත්කම විස්තර කරන්න. (මිනිත්තු 10 යි)

පියවර 6.1.6.2 :
- ඇමුණුම 6.1.6.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- ඇමුණුම 6.1.6.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.

- කියවීම් පත්‍රිකාව කියවා ප්‍රශ්නවලට පිළිතුරු සපයන ලෙස සිසුන්ට උපදෙස් ලබා දෙන්න.
- සිසුන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.

(මිනිත්තු 20 යි)

**පියවර 6.1.6.3** :
- අහඹු ලෙස ශිෂ්‍යයන් කිහිප දෙනෙකුගේ පිළිතුරු පත් තෝරා ඇගයීමට ලක් කරන්න.
- පෙ. සුබ්‍රමණියම් ශිල්පියාගේ නිර්මාණ පිළිබඳ සමාලෝචනය කරන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 6.1.6.1 හා ඇමුණුම 6.1.6.2 පදනම් කර කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- පෙ. සුබ්‍රමණියම් ශිල්පියාගේ සිතුවම් නම් කිරීම
- ඔහුගේ සිතුවම්වල කලා ශෛලීය සොයා බැලීම
- හින්දු ආගමික චිත්‍ර කලාවේ නව ශෛලියක් ඇති කළ චිත්‍ර ශිල්පියකු බව ප්‍රකාශ කිරීම
- සිතුවම් නිර්මාණය සඳහා පෙ. සුබ්‍රමණියම් ශිල්පියාට ලැබුණ බලපෑම්/ ආභාස විස්තර කිරීම
- පෙ. සුබ්‍රමණියම්ගේ සිතුවම්වල කලා ලක්ෂණ රසවිඳමින් ඇගයීමට ලක්කිරීම

**ඇමුණුම 6.1.6.1**

## කාර්ය පත්‍රිකාව

- ඔබට ඉදිරිපත් කර ඇති පෙ. සුබ්‍රමණියම්ගේ නිර්මාණ හොඳින් නිරික්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- පහත සඳහන් ක්‍රියාකාරකම්හි නිරතවන්න.

1. පෙ. සුබ්‍රමණියම් ශිල්පියා පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
2. ඔහුගේ ප්‍රසිද්ධ නිර්මාණ හා ඒවා හමුවන ස්ථාන නම් කරන්න.
3. පහත සඳහන් කරුණු යටතේ පෙ. සුබ්‍රමණියම් ශිල්පියාගේ නිර්මාණ ඇගයීමට ලක් කරන්න.

i තේමාව
i ශෛලිය
ii අභාසය
iv. ශිල්ප ක්‍රමය
v. කලා ලක්ෂණ - රූප භාවිතය
- වර්ණ භාවිතය
- තලය භාවිතය
- භාව ප්‍රකාශනය

- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරගන්න.

# කියවීම් පත්‍රිකාව

- වර්ෂ 1920.09.21 දින යාපනය, නල්ලූර්හි උපත ලබමින් වර්ෂ 2006 මාර්තු 15 දින අප අතරින් සමුගත් පෙරියතම්බි සුබ්‍රමණියම් දෙමළ ජනතාව අතර ජනප්‍රියත්වයට පත් වූ විශිෂ්ට චිත්‍ර ශිල්පියෙකි.
- දෙමළ ජනතාවගේ එදිනෙදා ජීවිත අවශ්‍යතාවන් සමග බැඳි අභිලාෂයන් ඉටු කළ චිත්‍ර ශිල්පියකු ලෙස පෙරියතම්බි සුබ්‍රමණියම් චිත්‍ර ශිල්පියාගේ නිර්මාණවලට සුවිශේෂී ස්ථානයක් හිමි වේ.
- ඔහු යාපනයේ ජීවත් වෙමින් ස්ව උත්සහයෙන් චිත්‍ර කලාව හැදෑරූ ශිල්පියෙකි.
- ඉන්දියානු කලාකරු රවි වර්මාගේ පුරාණ ඓතිහාසික සිද්ධි නිරූපිත සිතුවම්වල ශෛලිය ලක්ෂණ පෙ. සුබ්‍රමණියම්ගේ සිතුවම් සඳහා ද ආභාස වී ඇත.
- රවි වර්මාගේ සිතුවම්වල ශෛලිය සඳහා ඉන්දීය ජනප්‍රිය සංස්කෘතියේ ප්‍රකාශිත මාධ්‍ය වන චිත්‍රපට, කැලැන්ඩර් හා පෝස්ටර් චිත්‍ර ආදිය තුළින් නිරූපිත දේව රූප ලක්ෂණ පෙන්වන අතර එකී ලක්ෂණ පෙ. සුබ්‍රමණියම් ශිල්පියාගේ සිතුවම් ආශ්‍රිතව හඳුනාගත හැකි ය.
- රවි වර්මාගේ චිත්‍රවල දක්නට ලැබෙන දෘෂ්ටි මායා (Illusion optical) ප්‍රකාශන ශිල්ප ක්‍රමය පෙ. සුබ්‍රමණියම්ගේ නිර්මාණ සඳහා අනුගමනය කර ඇත.
- කෝවිල් බිත්ති චිත්‍රවලට අමතරව ඔහු තිර රෙදි චිත්‍ර නිර්මාණය කිරීම, විශාල ප්‍රමාණයේ බැනර් හා කට්ඖට් (Cutout) චිත්‍ර නිර්මාණය කිරීම සඳහා දායක වූ ශිල්පියෙක් ද වෙයි.
- පෙරියතම්බි සුබ්‍රමණියම් ශිල්පියාගේ සිතුවම් පහත සඳහන් කොවිල්වල බිත්ති මත හා තිර රෙදිවල දක්නට ලැබේ.
  - නල්ලූර් කෛලාසපිල්ලෙයාර් කෝවිල
  - ඉනුවිල් පරරාසසේකර පිල්ලෙයාර් කෝවිල
  - සුදුමලයි අම්මන් කෝවිල
  - වැල්වෙට්ටිත්තුරෙයි සිවන් කෝවිල
  - නල්ලූර් වීර කාලි අම්මන් කෝවිල
  - වේලණෙයි අම්මන් කෝවිල

**අගස්තියර් හා විනායගර් නම් සිතුවම**



- පෙ. සුබ්‍රමණියම්ගේ නිර්මාණ කළ සිතුවම් අතර සුවිශේෂී සිත්තමක් වන අගස්තියර් හා විනායගර් නම් සිතුවම ඉනුවිල් පරරාසසේකර පිල්ලෙයාර් කෝවිලෙ හි දැකිය හැකි ය.
- මෙම නිර්මාණයෙන් අගස්තියර්ගේ කෙණ්ඩියට කපුටු වෙසින් පැමිණි විනායගර් තට්ටු කළ නිසා හටගත් කාවේරී නදියයේ කතා පුවත අවස්ථා තුනකින් යුතුව නිරූපණය කර ඇත.
- හුණු බිත්තිය මත තලය සකස් කිරීමකින් තොරව එනමල් වර්ණ යොදා මෙම සිතුවම නිර්මාණය කර ඇත.
- ස්වභාවික ප්‍රමාණයට නිර්මාණය වී ඇති මෙම සිතුවම ඉතා ආකර්ෂණීය ලෙස භාවිත කරන වර්ණ විවිධ තානය (Tone) යොදාගනිමින් ත්‍රිමාන ලක්ෂණවලින් යුතුව භාවිත කර ඇත.
- .රූප, ත්‍රිමාන ලක්ෂණ සහිත වර්ණවල තානය (Colour tone) මගින් ගොඩනංවා ඇති හෙයින් රූප වටා පැහැදිලි රේඛාකරණයක් දක්නට නොලැබේ.
- පර්යාලෝකනය ලක්ෂණ දක්වා ඇති අතර පෙර බිමේ ඇති රූපවල ක්‍රියාකාරකම්වලට උචිත පරිදි හා ඒවා එක් එක් තීව්‍ර කරන ආකාරයට පසුබිමේ දර්ශන දක්වා ඇත.
- කොටස් තුනකින් යුත් මෙම සිතුවමෙහි එක් එක් කොටසින් එකිනෙකට වෙනස් හැඟීම් ප්‍රකාශන දක්වයි. ඒ අනුව

  පළමුවන කොටසින් - කපුටා පලවාහරින අගස්තියර්

  දෙවෙනි කොටසින් - දරුවකු බවට පත් වූ විනායගර්ව අගස්නියර් විසින් පළවාහැරීම දක්වයි. මෙහි දී දරුවා සමච්චල් කරන ආකාරය හා අගස්තියර් කෝප වී සිටින ආකාරය ද නිරූපණය කර ඇත.

  තුන්වන කොටසින් - පැමිණියේ විනායගර් බව හැඟුණු බැවින් යටපත් පහත් ලෙස විනායගර්ට අගස්තියර් වඳින අයුරු නිරූපණය කර ඇත
- මෙම සිද්ධි දර්ශනවල පිළිවෙළ තුළින් අගස්තියර්ගේ භක්තිය මැනැවින් නිරූපණය කර ඇත.

ඇතා වල්ලිව එළවාගෙන යාම



- පෙ. සුබ්‍රමණියම් චිත්‍ර ශිල්පියාගේ තවත් සුවිශේෂී නිර්මාණයක් වන ඇතා වල්ලිව එළවාගෙන යාම නැමති සිතුවම ඉනුවිල් පරරාසසේකර පිල්ලෙයාර් කොවිලෙ හි දක්නට ලැබේ.
- ඇත් වෙසින් පැමිණි විනායගර්, වල්ලි එලවාගෙන යනු ලබන අතර වල්ලි, තාපස වෙසින් පැමිණි මුරුගන්ගෙන් පිළිසරණ ලැබීම මෙම සිතුවමෙන් නිරූපිතය.
- වර්ණ තානය (Colour tone) විවිධත්වය මගින් ත්‍රිමාන ලක්ෂණ හා පර්යාලෝක ලක්ෂණ දක්වා ඇත.
- බිත්තියෙහි තලය සකස් කිරීමකින් තොරව එනමල් වර්ණයෙන් සිතුවම් කර ඇත.
- මෙම සිතුවමින් ඇතා ලෙස පැමිණියේ විනායගර් බව සංකේතාත්මක ව දක්වා ඇත.
- වර්ණ ද සංකේතාත්මක ව යොදාගෙන ඇති අතර ඉතා දීප්තිමත් වර්ණ යොදාගෙන ඇත.
- ආලෝකය හා අඳුර යොදා ගනිමින් රූපවල සීමා රේඛාකරණයෙන් තොරව දක්වා ඇත
- විනායගර් සහ ඇතා එක් කොටසක ද වල්ලි සහ තාපසයා තවත් කොටසක් ලෙසින් ද සිද්ධි දෙක ම එක තලයක සමෝධානය කරන ආකාරයට හු දර්ශනය යොදා ඇත.
- ඇතාගේ භයානක ස්වරූපය හා වල්ලිගේ බිය මුසු හැඟීම් නිරූපණය කෙරෙන මෙම නිර්මාණයෙන් ත්‍රාසය හා බියමුසු හැඟීම් මැනැවින් ප්‍රකාශ කරන්නක් වෙයි.

| | | |
|---|---|---|
| **නිපුණතාව 6.0** | : | **ආගමික හා සංස්කෘතික අංග, දෙස්, විදෙස් තෝරාගත් ශිල්පීන්ගේ කලා නිර්මාණ, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලීව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.** |
| **නිපුණතා මට්ටම 6.2** | : | **තෝරාගත් විදේශීය ශිල්පීන්ගේ කලාකෘති රසාස්වාදය කරයි.** |
| **ක්‍රියාකාරකම 6.2.1** | : | "ලියනාඩෝ ඩාවින්චි (Lenardo da Vinci) ශිල්පියාගේ නිර්මාණ අගයමු" |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | : | **01 යි** |

**ඉගෙනුම් පල** :

- ලියනාඩෝ ඩාවින්චි ශිල්පියාගේ සිතුවම් නම් කරයි.
- ඔහුගේ නව නිර්මාණාත්මක චිත්‍ර ශෛලිය සඳහා පදනම් වූ ආභාස විස්තර කරයි.
- සංරචන ක්‍රම හා සිද්ධාන්ත ලක්ෂණ විස්තර කරයි.
- සිතුවම් සඳහා යොදා ගත් වර්ණ හා පසුබිම් භූ දර්ශනවල ස්වභාවය විමසා බලයි.
- ලියනාඩෝ ඩාවින්චි ශිල්පියාගේ චිත්‍ර නිර්මාණවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කරයි.

**ගුණාත්මක යෙදවුම්** :

- ලියනාඩෝ ඩාවින්චි ශිල්පියාගේ වර්ණ චිත්‍ර
  - පර්වත මස්තකයේ දේවමෑණියෝ
  - අවසන් රාත්‍රී භෝජන සංග්‍රහය
  - මොනාලිසා
- ඇමුණුම 6.2.1.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 6.2.1.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 6.2.1.1** :

- ලියනාඩෝ ඩාවින්චි ශිල්පියාගේ සිතුවම් සිසුන්ගේ අවධානයට යොමු කරවන්න.
- ලියනාඩෝ ඩාවින්චි ශිල්පියාගේ සිතුවම් එක්රැස්කිරීමට සිසුන් ට උපදෙස් දෙන්න.
- ඔහුගේ සිතුවම්වල වස්තු විෂය, ආභාස, ශෛලිය හා ශිල්ප ක්‍රම ගැන සිසුන්ගෙන් විමසන්න.

(මිනිත්තු 10යි)

**පියවර 6.2.1.2** :

- ඇමුණුම 6.1.2.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- ඇමුණුම 6.1.2.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව කියවීමට අවස්ථාව සලස්වන්න.

- කියවීම් පත්‍රිකාව කියවා තේරුම්ගෙන අවබෝධයෙන් පිළිතුරු සැපයීමට සිසුන්ට උපදෙස් දෙන්න.

(මිනිත්තු 20 යි)

**පියවර 6.2.1.3** :
- අහඹු ලෙස තෝරාගත් සිසුන් කිහිප දෙනෙකුගේ පිළිතුරු පත් ඇගයීමට ලක් කරන්න.
- ලියනාඩෝ ඩාවින්චි ශිල්පියාගේ නිර්මාණ පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 6.2.1.1 හා ඇමුණුම 6.2.1.2 පදනම් කර කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- ලියනාඩෝ ඩාවින්චි ශිල්පියාගේ සිතුවම් නිර්මාණ විස්තර කිරීම
- ඔහුගේ සිතුවම්වල කලා ලක්ෂණ සොයා බැලීම
- යුරෝපීය ශාස්ත්‍රාලීය චිත්‍ර කලාවේ නව පෙරළියක් ඇති කළ චිත්‍ර ශිල්පියෙකු බව ප්‍රකාශ කිරීම
- ලියනාඩෝ ඩාවින්චි සිතුවම් සඳහා යොදා ගත් වර්ණ හා පසුබිම් භූමි දර්ශන විස්තර කිරීම

**ඇමුණුම 6.2.1.1**

## කාර්ය පත්‍රිකාව

- ඔබට ඉදිරිපත් කර ඇති ලියනාඩෝ ඩාවින්චිගේ නිර්මාණ හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- පහත සඳහන් ක්‍රියාකාරකම්හි නිරතවන්න.
  1. ලියනාඩෝ ඩාවින්චි ශිල්පියා පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
  2. ඔහුගේ ප්‍රසිද්ධ නිර්මාණ හා ඒවා හමුවන ස්ථාන නම් කරන්න.
  3. පහත සඳහන් කරුණු යටතේ ලියනාඩෝ ඩාවින්චි ශිල්පියාගේ නිර්මාණ ඇගයීමට ලක් කරන්න.
     - i. තේමාව
     - ii. ශෛලිය
     - iii. අභාසය
     - iv. ශිල්ප ක්‍රමය
     - v. කලා ලක්ෂණ - රූප භාවිතය
       - වර්ණ භාවිතය
       - තලය භාවිතය
       - භාව ප්‍රකාශනය
- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරගන්න.

ඇමුණුම 6.2.1.2

## කියවීම් පත්‍රිකාව

- පුනරුද යුගයේ (Renaissance Period) බිහිවූ ශ්‍රේෂ්ටතම චිත්‍ර ශිල්පියකු ලෙස ලියනාඩෝ ඩාවින්චි හැඳින්විය හැකි ය.
- වර්ෂ 1452 වින්සි ( Vinci ) නුවර උපත ලද මොහු වෙරකියෝ චිත්‍ර ශිල්පියා යටතේ ශිල්ප හැදෑරූ අතර චිත්‍ර ශිල්පයට පමණක් නොව ගණිතය, විද්‍යාව, ඉංජිනේරු ශිල්පය, සංගීතය, ගෘහ නිර්මාණ ශිල්පය මෙන් ම සැලසුම් ශිල්පයට ද දස්කම් දක්වා ඇත.
- ඔහුගේ නිර්මාණ සඳහා ග්‍රීක රෝම කලා නිර්මාණවල මූලික කලා ලක්ෂණ හා විද්‍යාත්මක නව සෞන්දර්ය ප්‍රවේශ පදනම් වී ඇත.
- ලියනාඩෝ ඩාවින්චිගේ සිතුවම් කිහිපයක් පහතින් දැක්වේ.
    1. පර්වත මස්තකයේ දේව මෑණියෝ (Vergin of the rocks)
    2. අවසන් භෝජන සංග්‍රහය (The Last Supper)
    3. මොනාලිසා (Monalisa)


**පර්වත මස්තකයේ දේවමෑණියෝ** (Vergin of the rocks)



- ලන්ඩන් ජාතික කලාගාරයේ ප්‍රදර්ශනය කර ඇති මෙම සිතුවම වර්ෂ 1483 - 1500 කාලය තුළ නිර්මාණය කරන ලද්දකි.
- පර්වත මස්තකයේ දේවමෑණියෝ සිතුවමෙන් දැක්වෙන්නේ මරියතුමිය අසලින් සිටින ජේසු බිළිඳා සහ ශාන්ත ජොන් බැප්ටිස් සමඟ සුරදූතියකි.
- ත්‍රිකෝණාකාර ආකෘතියක් මත රූප සම්පිණ්ඩනය කර ඇති මෙම සිතුවම කැන්වසය මත තෙල් සායම් මාධ්‍යයෙන් නිර්මාණය කර ඇත.

- මෙම නිර්මාණයේ දේවමෑණියන්ගේ මුහුණෙන් දැක්වෙන කරුණාභරිත බවත්, දරුවන්ගේ මොලකැටි බව මෙන් ම හැඟීම් ප්‍රකාශනය පෙන්වීමට ශිල්පියා ගෙන ඇති උත්සාහය සාර්ථක වී ඇත.
- සිතුවමෙහි පසුබිම පැළැටි සහ විවිධ හැඩවලින් යුක්ත ගල්කුළු පෙන්වා ඇති අතර පර්යාලෝක ලක්ෂණ සහිතව ඈතට විහිදී ගිය භූමි දර්ශනයක් නිරූපිත ය.
- අඳුර තුළින් ආලෝකය වඩාත් තීව්‍ර ලෙස මතු කිරීම පිළිබඳ ශිල්පියා සතුව තිබූ පරිණත බව මෙම සිතුවමින් නිරූපණය කෙරේ.
- මෙම වර්ණ ගැන්වීමේ සිද්ධාන්තය කියරොස්කුරො (Chiaroscuro) ලෙස හඳින්වේ.
- දුඹුරු වර්ණයේ විවිධ ප්‍රභේද සහිත අඳුරු වර්ණමාලාවක් යොදා ඇති අතර අඳුර තුළින් මරියතුමියගේ හා දරුවන්ගේ මුහුණු වඩාත් ආලෝකමත්ව මතු කර දක්වා ඇත.

**අවසන් භෝජන සංග්‍රහය (The Last Supper)**



- ලියනාඩෝ ඩාවින්චි විසින් මිලානයේ ලුඩෝවිකෝ ඉල්මෝරෝ ආදිපාදවරයා යටතේ සේවය කරන කාලයේ ශාන්ත මරියා ඩෙලාග්‍රේසි නැමති ඩොමිනිකානු තාපසාරාමයේ භෝජනාගාර බිත්තියක් මත ප්‍රෙස්කෝ සිකෝ ශිල්ප ක්‍රමයට නිර්මාණය කරන ලද්දකි.
- අවකාශමය පර්යාලෝකය අනුව චිත්‍රණය කර ඇති මෙම සිතුවම මධ්‍යයේ ජේසුස්වහන්සේ දක්වා ඇති අතර, දෙපස අනුගාමිකයන් දොළොස් දෙනෙකි. ජුදාස් නැමති පාවාදෙන්නාගේ මුහුණෙහි ඇති කුතුහලය නිරූපණය කිරීම හැඟීම් ප්‍රකාශනය මැනැවින් දැක්වීමට ගත් උත්සාහයකි.
- චිත්‍රය වර්ණ ගැන්වීමේ දී දුඹුරු වර්ණයේ විවිධ ප්‍රභේද සහිත අඳුරු වර්ණමාලාවක් ත්‍රිමාන හා පර්යාලෝක ලක්ෂණ සහිත ව යොදා ඇත.
- කියරොස්කුරො (Chiaroscuro) වර්ණ කිරීමේ සිද්ධාන්ත අනුව තලය මධ්‍යයේ සිටින ජේසුස්වහස්සේ වඩාත් ආලෝකමත්ව මතු කර දක්වමින් සෙසු රූප අඳුරු වර්ණමාලාවකින් දක්වා ඇත.

## මොනාලිසා (Monalisa)



- ලියනාඩෝ ඩාවින්චිගේ විශිෂ්ට නිර්මාණයක් වන මොනාලිසා දැනට ප්‍රංශයේ ලූවර් කෞතුකාගාරයේ මහජන ප්‍රදර්ශනයට තබා ඇත.
- මෙම සිතුවම පොප්ලර් නැමති ලීයක තෙල්සායම් මාධ්‍යයෙන් නිර්මාණය කර ඇත.
- ෆැන්සිස්කෝ ජියෝකොන්ඩා නැමති වෙළඳ ව්‍යාපාරිකයාගේ බිරිඳ වූ ලීසාගේ උඩුකය රුව (Portrait) ලෙස සැලකෙන මෙම සිතුවම පිළිබඳ වෙනත් මත ද පවතියි.
- මෙම සිතුවමෙහි පසුබිම සඳහා යොදා ඇත්තේ පර්යාලෝක ලක්ෂණ සහිත භූමි දර්ශනයකි.
- මෙහි දී මුහුණට පපු පෙදෙසට, දෙඅත්වලට ත්‍රිකෝණාකාර සම්බන්ධතාව ගොඩනගමින් යොදා ඇති ආලෝකය මෙන් ම මඳ සිනහව හා බැල්ම යනාදිය මෙම සිතුවමට ගෙන දෙන්නේ ආකර්ශනකි.

නිපුණතාව 6.0 : ආගමික හා සංස්කෘතික අංග, දෙස්, විදෙස් තෝරාගත් ශිල්පීන්ගේ කලා නිර්මාණ, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලීව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.

නිපුණතා මට්ටම 6.2 : තෝරාගත් විදේශීය ශිල්පීන්ගේ කලාකෘති රසාස්වාදය කරයි.

ක්‍රියාකාරකම 6.2.2 : ''මයිකල් ආන්ජිලෝගේ (Michaelanjelo) නිර්මාණ අගයමු.''

කාලච්ඡේද සංඛ්‍යාව : 01 යි

ඉගෙනුම් පල :
- මයිකල් ආන්ජිලෝ ශිල්පියාගේ සිතුවම් හා මූර්ති නම් කරයි.
- මයිකල් ආන්ජිලෝ ශිල්පියාගේ නිර්මාණ, තොරතුරු එක්රැස් කරයි.
- නව නිර්මාණාත්මක ශෛලිය සඳහා පදනම් වූ ශිල්ප ක්‍රම විස්තර කරයි.
- සංරචන ක්‍රම හා සිද්ධාන්ත ලක්ෂණ විස්තර කරයි.
- මයිකල් ආන්ජිලෝ ශිල්පියාගේ නිර්මාණවල කලා ලක්ෂණ ඇගයීමට හා රසස්වාදයට ලක් කරයි.

ගුණාත්මක යෙදවුම් :
- මයිකල් ආන්ජිලෝ ශිල්පියාගේ නිර්මාණ
  - පියෙටා (Pieta)
  - ඩේවිඩ් (David)
  - ආදම් මැවීම (The creation of Adam)
- ඇමුණුම 6.2.2.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 6.2.2.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

පියවර 6.2.2.1 :
- මයිකල් ආන්ජිලෝ ශිල්පියාගේ නිර්මාණ පන්තියේ ප්‍රදර්ශනය කර එම නිර්මාණ පිළිබඳ සිසු අදහස් විමසන්න.
- එම නිර්මාණ අධ්‍යයනය කිරීමේ වටිනාකම සාකච්ඡා කරන්න.

(මිනිත්ත 10 යි)

පියවර 6.2.2.2 :
- ඇමුණුම 6.1.2.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- ඇමුණුම 6.1.2.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව කියවීමට අවස්ථාව සලස්වන්න.
- කියවීම් පත්‍රිකාව කියවා තේරුම්ගෙන අවබෝධයෙන් පිළිතුරු සැපයීමට සිසුන්ට උපදෙස් දෙන්න.

(මිනිත්තු 20 යි)

පියවර 6.2.2.3 :
- අහඹු ලෙස තෝරාගත් සිසුන් කිහිප දෙනෙකුගේ පිළිතුරු පත් ඇගයීමට ලක් කරන්න.
- මයිකල් ආන්ජිලෝ ශිල්පියාගේ නිර්මාණ පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 6.2.2.1 හා 6.2.2.2 පදනම් කර කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- මයිකල් ආන්ජිලෝ ශිල්පියාගේ සිතුවම් හා මූර්ති නම් කිරීම
- මයිකල් ආන්ජිලෝ ශිල්පියාගේ නිර්මාණ, තොරතුරු එක්රැස් කිරීම
- නව නිර්මාණාත්මක ශෛලීය සඳහා පදනම් වූ ශිල්ප ක්‍රම විස්තර කිරීම
- සංරචන ක්‍රම හා සිද්ධාන්ත ලක්ෂණ විස්තර කිරීම
- මයිකල් ආන්ජිලෝ ශිල්පියාගේ නිර්මාණවල කලා ලක්ෂණ ඇගයීමට හා රසාස්වාදයට ලක් කිරීම

**ඇමුණුම 6.2.2.1**

## කාර්ය පත්‍රිකාව

- ඔබට ඉදිරිපත් කර ඇති මයිකල් ආන්ජිලෝගේ නිර්මාණ හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- මයිකල් ආන්ජිලෝගේ නිර්මාණවල සුවිශේෂී ලක්ෂණ හඳුනාගන්න.
- පහත සඳහන් ක්‍රියාකාරකම්හි නිරතවන්න.
  1. මයිකල් ආන්ජිලෝ ශිල්පියා පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
  2. ඔහුගේ ප්‍රසිද්ධ නිර්මාණ හා ඒවා හමුවන ස්ථාන නම් කරන්න.
  3. පහත සඳහන් කරුණු යටතේ මයිකල් ආන්ජිලෝ ශිල්පියාගේ නිර්මාණ ඇගයීමට ලක් කරන්න.
     - i. තේමාව
     - ii. ශෛලිය
     - iii. අභාසය
     - iv. ශිල්ප ක්‍රමය
     - v. කලා ලක්ෂණ - රූප හා හැඩතල භාවිතය
       - භාව ප්‍රකාශනය
- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරගන්න.

ඇමුණුම 6.2.2.2

## කියවීම් පත්‍රිකාව

- මයිකල් ආන්ජිලෝ ක්‍රි.ව. 1475 ඉතාලියේ ෆ්ලොරන්ස් නගරයේ කාසල් කැප්රීස් නම් ස්ථානයේ දී උපත ලැබී ය.
- ඔහු චිත්‍ර, මූර්ති හා කැටයම් කලාව හා වාස්තු විද්‍යාව සඳහා සහජ දක්ෂතාවක් දැක්වූ අතර පුබුදු යුගයේ බිහි වූ විශිෂ්ට කලා ශිල්පියෙකු ලෙසින් හැඳින්විය හැකි ය.
- ඔහු විසින් කිරිගරුඬ මාධ්‍යයෙන් කරන ලද විශිෂ්ට මූර්ති පහතින් දක් වේ.
  - පියෙටා
  - ඩේවිඩ්
  - මෝසෙස්
  - මියයන වහලා
  - කැරලිකාර වහලා
  - II.වැනි ජුලියස් පාප්තුමාගේ සොහොන් ගෙය
  - බෲගස්හි මරිය මව්තුමිය
- මයිකල් ආන්ජිලෝ ශිල්පියා සිස්ටයින් දෙව්මැදුරේ අඳින ලද සිතුවම්වලට අමතරව ශුද්ධ වූ පවුල නමින් කැන්වසය මත තෙල් සායම් මාධ්‍ය සිතුවමක් ද නිර්මාණය කර තිබේ.

### පියෙටා (Pieta)






- මයිකල් ආන්ජිලෝ මෙම මූර්තිය නිර්මාණය සඳහා තේමා කරගෙන ඇත්තේ කුරුසියෙන් ඉවත් කරන ලද මිය ගිය ජේසුස් වහන්සේගේ අප්‍රාණික සිරුර මරිය මව්තුමිය විසින් උකුලෙහි හොවාගෙන සිටින ආකාරයයි.
- " කිරිගරුඬ" මාධ්‍යයෙන් නෙළා ඇති මෙම පූර්ණ උන්නත මූර්තිය රෝමයේ ශාන්ත පීතර දෙව් මැදුරේ ප්‍රදර්ශනය කර ඇත.
- ජේසුස් වහන්සේගේ අප්‍රාණික ශරීර ස්වභාවය තාත්විකව හා මරියතුමියගේ සළුපිළිවල රිද්මයානුකූල බව ඉතා ස්වභාවිකව කිරිගරුඬ මාධ්‍යයෙන් නිරූපණය කර ඇත.
- මව සහ පුතු සමවයස්ව දැක්වීමෙන් දිව්‍යමය ස්වභාවය මතුකිරීමට උත්සාහයක් දරා ඇත.
- මානුෂිකත්වය පිළිබඳ අනුවේදනීයත්වය මෙම නිර්මාණයෙන් ධ්වනිත කරයි.


## ඩේවිඩ් (David)



- ශක්තිය, නිර්භීතභාවය, මානව දයාව හා තාරුණ්‍ය යන ගුණාංග මෙම මූර්තියෙන් මැනැවින් නිරූපිත ය.
- කිරිගරුඬ මාධ්‍යයෙන් පූර්ණ උන්නත ලෙස නිර්මාණය කර ඇති මෙම ප්‍රතිමාව අඩි 14 අඟල් 03 පමණ උසින් යුතු නග්න පුරුෂ රුවකි.
- ග්‍රීක-රෝම මූර්ති සම්ප්‍රදායට අනුව මානව දේහයේ සුන්දරත්වය, කඩවසම් බව හා රිද්මය ස්වභාවික හා තාත්විකව නිරූපණය කර ඇත.

## ආදම් මැවීම (The creation of Adam)



- මයිකල් ආන්ජිලෝ විසින් රෝමයේ සිස්ටයින් දෙව් මැදුරේ ෆ්‍රෙස්කෝ සිකෝ ශිල්ප ක්‍රමයෙන් නිර්මාණය කරන ලද වියන්තල සිතුවම් අතුරින් වැදගත් නිර්මාණයකි.
- මෙහි විශේෂත්වය වන්නේ දෙවියන් වහන්සේගේ රුව බොහෝ ක්‍රිස්තියානි ශිල්පීන් විසින් නිරූපණය නොකරන ලද ලෙස සාමාන්‍ය මිනිස් රුවක ස්වරූපයෙන් නිර්මාණය කර දැක්වීමයි.

- මෙම සිතුවමින් නිරූපණය වන්නේ දේව දූතයින් සමඟ සිටින දෙවියන් වහන්සේ ආදම් වෙත ඇඟිල්ල දිගු කර සිටින අතර ආදම් විසින් දෙවියන් වහන්සේ වෙත අත දිගු කර සිටින ආකාරය යි.
- මෙහි දී දෙවියන් වහන්සේගේ මහලු ස්වරූපය සහ ආදම්ගේ තාරුණ්‍ය මැනවින් නිරූපණය කර තිබේ.
- ඔහුගේ මූර්තිවල දැකිය හැකි ශක්ති සම්පන්න හා ජවසම්පන්න බව මෙම චිත්‍ර නිර්මාණයෙහි ද මැනවින් දැකිය හැකි ය.

**අන්තිම විනිශ්චය (Last Judgment)**



- රෝමයේ වතිකානු නගරයේ සිස්ටයින් දෙව් මැදුරේ අල්තාරය පිටුපස බිත්තියේ මෙම සිතුවම නිර්මාණය කර ඇත.
- ලොව විශාලතම ෆ්‍රෙස්කෝ සිකෝ සිතුවම ලෙස සැලකෙන මෙය අඩි 48 x 44 ප්‍රමාණයෙන් යුක්ත ය.
- මයිකල් ආන්ජිලෝ විසින් මෙම චිත්‍රය ප්‍රධාන කොටස් 3 කට බෙදා එය ස්වර්ගය, මනුලොව හා පරලොව ලෙස සංකේතාත්මකව නිරූපණය කර ඇත.
- ශිල්පියාට ආවේණික වූ ස්වභාවික හා තාත්වික ශෛලීය ලක්ෂණ සහිතව මෙම චිත්‍රය සංරචනය කර තිබේ.
- එහි දී මිනිස් රූපවල කායික ලක්ෂණ හා ක්‍රියාකාරී ලක්ෂණ සමග හැඟීම් ප්‍රකාශනය මැනවින් නිරූපණය කර ඇත.

**නිපුණතාව 6.0** : **ආගමික හා සංස්කෘතික අංග, දෙස්, විදෙස් තෝරාගත් ශිල්පීන්ගේ කලා නිර්මාණ, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලීව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 6.2** : **තෝරාගත් විදේශීය ශිල්පීන්ගේ කලාකෘති රසාස්වාදය කරයි.**

**ක්‍රියාකාරකම 6.2.3** : **''රෆායල් සන්සියෝ** (Raphael Sanzio) **ශිල්පියාගේ නිර්මාණ අගයමු''**

**කාලච්ඡේද සංඛ්‍යාව** : **01 යි**

**ඉගෙනුම් පල** :

- රෆායල් සන්සියෝ ශිල්පියාගේ සිතුවම් නම් කරයි.
- රෆායල් සන්සියෝ ශිල්පියාගේ සිතුවම්, තොරතුරු එක්රැස් කරයි.
- සිතුවම් සඳහා යොදා ගත් වර්ණ හා පසුබිම් භූමි දර්ශන විමසා බලයි.
- නව නිර්මාණාත්මක ශෛලිය සඳහා පදනම් වූ ශිල්පීය ක්‍රම විස්තර කරයි.
- සංරචන ක්‍රම හා සිද්ධාන්ත ලක්ෂණ විස්තර කරයි.
- රෆායල් සන්සියෝගේ චිත්‍ර නිර්මාණවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කරයි.

**ගුණාත්මක යෙදවුම්** :

- රෆායල් සන්සියෝ ශිල්පියාගේ වර්ණ චිත්‍ර
  - ඇතැන්ස් ගුරුකුලය (School of Athens)
  - මැඩෝනා චිත්‍ර
  - තණපිටියේ සිටින මැඩෝනා (Madonna of the Meadows)
  - මැඩෝනා ඩෙලා සේදියා (Madonna Della Sedia)
- ඇමුණුම 6.2.3.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 6.2.3.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 6.2.3.1** :

- රෆායල් සන්සියෝ ශිල්පියාගේ නිර්මාණ සිසු අවධානයට යොමු කරවන්න.
- රෆායල් සන්සියෝ ශිල්පියාගේ විවිධ වූ නිර්මාණ එක්රැස් කරවීමට සිසුන් යොමු කරවන්න.
- ඔහුගේ සිතුවම්වල තේමාව, ශෛලිය වර්ණ යෙදීම ආදී කරුණු පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.

(මිනිත්තු 10 යි)

**පියවර 6.23.2** :

- ඇමුණුම 6.3.2.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- ඇමුණුම 6.3.2.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව අධ්‍යයනයට සිසුන්ට යොමු කරවන්න.

- කියවීම් පත්‍රිකාව ඇසුරින් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සිසුන්ට සහාය වන්න.

(මිනිත්තු 20 යි)

**පියවර 6.2.3.3** :
- අහඹු ලෙස තෝරාගත් සිසුන් කිහිප දෙනෙකුගේ පිළිතුරු පත් ඇගයීමට ලක් කරන්න.
- රෆායල්ගේ නිර්මාණ පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 6.2.3.1 හා ඇමුණුම 6.2.3.2 පදනම් කර කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- රෆායල් සන්සියෝ ශිල්පියාගේ සිතුවම් නම් කිරීම
- යුරෝපීය ශාස්ත්‍රාලීය චිත්‍ර කලාවේ නව පෙරළියක් ඇති කළ චිත්‍ර ශිල්පියෙකු බව ප්‍රකාශ කිරීම
- රෆායල් සන්සියෝ විසින් සිතුවම් සඳහා යොදා ගත් වර්ණ හා පසුබිම් භූමි දර්ශන විස්තර කිරීම
- රෆායල් සන්සියෝ ශිල්පියාගේ චිත්‍ර නිර්මාණවල කලා ලක්ෂණ ඇගයීම

**ඇමුණුම 6.3.2.1**

## කාර්ය පත්‍රිකාව

- ඔබට ඉදිරිපත් කර ඇති රෆායල් සන්සියෝ ශිල්පියාගේ නිර්මාණ හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- රෆායල් සන්සියෝගේ නිර්මාණවල සුවිශේෂී ලක්ෂණ හඳුනාගන්න.
- පහත සඳහන් ක්‍රියාකාරකම්හි නිරතවන්න.
    1. රෆායල් සන්සියෝ ශිල්පියා පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
    2. ඔහුගේ ප්‍රසිද්ධ නිර්මාණ හා ඒවා හමුවන ස්ථාන නම් කරන්න.
    3. පහත සඳහන් කරුණු යටතේ රෆායල් සන්සියෝ ශිල්පියාගේ නිර්මාණ ඇගයීමට ලක් කරන්න.
        - i. තේමාව
        - i ශෛලිය
        - ii. අභාසය
        - iv. ශිල්ප ක්‍රමය
        - v. කලා ලක්ෂණ - රූප භාවිතය
            - වර්ණ භාවිතය
            - තලය භාවිතය
            - භාව ප්‍රකාශනය
- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරගන්න.

ඇමුණුම 6.2.3.2

# කියවීම් පත්‍රිකාව

- පුනර්ජීවන යුගයේ විසූ ශ්‍රේෂ්ට චිත්‍ර ශිල්පීන් අතර රෆායල් සන්සියෝ ශිල්පියාට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි.
- මොහු වර්ෂ 1483 වර්ෂයේ දී උෆර්බිගෝ නැමති නගරයේ උපත ලැබුවේය.

**ඇතැන්ස් ගුරුකුලය** (School of Athens)



- ඇතැන්ස්හි ගුරුකුලය රෆායල් විසින් නිර්මාණය කරන ලද විශිෂ්ට බිතු සිතුවමක් වේ.
- මෙය රෝමයේ ස්ටැන්සා ඩෙලා සිගන්චුරා (Stanza della Segnatura) නැමැති ගොඩනැගිලි බිත්තියක ප්‍රෙස්කෝ සිකෝ ශිල්ප ක්‍රමයට නිර්මාණය කරන ලද්දකි.
- වාස්තු විද්‍යාත්මක අවකාශය මත රූප සම්පිණ්ඩනය කිරීම පිළිබඳ දක්වා ඇති කුසලතාව සහ ප්‍රතිභාව නිර්මාණකරණයේ අග්‍ර ඵලයක් ලෙසට විචාරකයෝ හඳුන්වති.
- චිත්‍රයෙන් දැක්වෙන්නේ පැරණි ග්‍රීක දාර්ශනික ඇතන්ස් ගුරුකුලය යි. සිතුවම මධ්‍යයේ ඇරිස්ටෝටල් හා ප්ලේටෝ යන දාර්ශනිකයන් ය. සෙසු දාර්ශනිකයන් ද වාද විවාදවල පැටලී සිටින අයුරු පෙන්නුම් කරයි.

.

- මෙම දාර්ශනික ලෝකය ක්‍රියාකාරී මානව රූප සම්පිණ්ඩනය මගින් ඉදිරිපත් කර තිබීම මෙම සිතුවමේ දැකිය හැකි විශේෂතාවකි.
- දුඹුරු වර්ණයේ විවිධ ප්‍රභේද, අඳුරු කහ වර්ණවල විවිධ ප්‍රභේද, රඹ සහ සුදු ආදී වර්ණයන් සිතුවම සඳහා භාවිත කර ඇත.

### මැඩෝනා චිත්‍ර

- රෆායල්ගේ නිර්මාණ අතර ප්‍රකට තේමාවක් වූයේ මැඩෝනා හෙවත් කන්‍යා මරියතුමිය හා ජේසු බිළිඳා දැක්වෙන නිර්මාණයෝ ය.
- පුනරුද යුගයේ වෙනත් චිත්‍ර ශිල්පීන් නිර්මාණය කළ මැඩෝනා චිත්‍රවලට වඩා රෆායල් විසින් නිර්මාණය කරන ලද මැඩෝනා චිත්‍ර සුවිශේෂී නිර්මාණ ලෙස සැලකේ.
- මෙම සිතුවම් තෙල් සායම් මාධ්‍යයෙන් කැන්වසය මත නිර්මාණය කර ඇත.
- ත්‍රිකෝණාකාර ආකෘතියක් මත හැඟීම් දනවනසුළු ප්‍රකාශනයන් සහිතව රූප පිහිටවීම මෙම චිත්‍රවල විශේෂතාවකි.
- ත්‍රිමාන ලක්ෂණ සහිත වර්ණ භාවිතය මෙන් ම ප්‍රභාමණ්ඩලය හෙවත් හෙලෝව නිරූපණය නොකිරීම ද නිර්මාණයන්හි දැකිය හැකි ලක්ෂණයන් ය.

**තණපිටියේ සිටින මැඩෝනා** (Madonna of the Meadows)



- පර්යාලෝක ලක්ෂණ සහිත භූමි දර්ශනයක ගහකොළ මල් සහිත සැබෑ පිටිසර ගැමි පසුබිමක සාමාන්‍ය ගැහැනියක ලෙස රූපණය කිරීම මෙම නිර්මාණයේ සුවිශේෂත්වයකි.
- මරියතුමිය පිරුණු ශරීරයෙන් හා මෘදු සොම්නස් හා සෙනෙහසින් පිරුණු මුහුණකින් යුතු හැඟීම් ප්‍රකාශනය සහිතව ඉදිරිපත් කිරීමට ශිල්පියා උත්සාහ ගෙන ඇත.
- ප්‍රංශයේ ලූවර් කෞතුකාගාරයේ මෙම සිතුවම ප්‍රදර්ශනයට තබා ඇත.

**මැඩෝනා ඩෙලා සේදියා (Madonna Della Sedia)**



- කවාකාර තලයක් මත ඇඳ ඇති මෙම සිතුවමෙන් මරිය මව්තුමියට තුරුළු වී සිටින ජේසු බිළිඳාත් ඒ දෙස බලා සිටින ශාන්ත ජෝන් බැප්ටිස් ළදරුවාත් නිරූපණය වේ.
- රූප ත්‍රිත්වය සමීප දර්ශනයක් ලෙස එක තලයක් තුළ සංරචනය කර ඇත.
- මානව දේහයේ කායික සුන්දරත්වය මෙන් ම වස්ත්‍රවල විස්තරාත්මක ලක්‍ෂණ මැන්වින් නිරූපණය කර ඇත.
- මරිය මව්තුමියගේ කරුණාවන්ත බව හා සෙනෙහස මෙන්ම ළදරුවන්ගේ සුරතල් මොළකැටි හා පුෂ්ටිමත් ලක්ෂණ තාත්විකවාදී ස්වරූපයෙන් දක්වීමට ශිල්පියා සමත් වී ඇත.
- රෆායල්ගේ අනෙකුත් මැඩෝනා චිත්‍රවල දක්වෙන විස්තරාත්මක පසුබිම් භූමි දර්ශන වෙනුවට මෙම සිතුවමේ පසුබිම, ගැඹුර නිරූපණය නොවන ලෙස අඳුරු වර්ණයකින් දක්වා ඇත.

**නිපුණතාව 7.0** : **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලාවන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.1** : **ගම්පොළ යුගයේ ගෘහ නිර්මාණ, චිත්‍ර, මූර්ති හා කැටයම් අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.1.1** : "ගඩලාදෙණිය විහාරය"

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01 යි

**ඉගෙනුම් පල** :
- ගඩලාදෙණි විහාරයේ ගෘහ නිර්මාණ, මූර්ති, කැටයම්, නම් කරයි.
- ගඩලාදෙණි විහාරයේ නිර්මාණවල ඓතිහාසික පසුබිම සොයා බලයි.
- නිර්මාණාත්මක ශෛලිය සඳහා පදනම් වූ මාධ්‍ය හා ශිල්ප ක්‍රම විස්තර කරයි.
- ගඩලාදෙණි විහාරයේ ගෘහ නිර්මාණ ඇතුළු කලා අංගවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- ගඩලාදෙණිය විහාරය හා සබැඳි වර්ණ ඡායාරූප සී.ඩී. තැටි, ගඩලාදෙණි විහාරය සිතුවම් හා කැටයම් සහිත පින්තූර
- ඇමුණුම 7.1.1.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 7.1.1.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 7.1.1.1** :
- ගඩලාදෙණි විහාරයට අදාළ පින්තූර ප්‍රදර්ශනය කරමින් සිසුන්ගේ අවධානය ලබා ගන්න.
- ගඩලාදෙණි විහාර පිළිබඳ සිසුන්ගේ පෙර දැනුම විමසන්න.

(මිනිත්තු 10 යි)

**පියවර 7.1.1.2** :
- ඇමුණුම 7.1.1.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- ඇමුණුම 7.1.1.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව කියවීමට සලස්වන්න.
- කියවීම් පත්‍රිකාව ඇසුරින් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට සිසුන් යොමු කරවන්න.

(මිනිත්තු 20 යි)

**පියවර 7.1.1.3** :
- සුදුසු ක්‍රමවේදයන් භාවිත කර පිළිතුරු පරීක්ෂාවට ලක් කරන්න.
- සදොස් පිළිතුරු නිදොස් කර සමස්ත ප්‍රශ්නාවලියට නිවැරදි පිළිතුරු සපයා ගැනීමට සලස්වන්න.

- ගඩලාදෙණිය විහාරය පිළිබඳ වැඩිදුරටත් තොරතුරු එක් රැස් කරන ලෙස සිසුන් දැනුවත් කරන්න.
- සමස්ත පාඩම පිළිබඳ කෙටි සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම් 7.1.1.1 හා 7.1.1.2 පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- ගඩලාදෙණි විහාර සංකීර්ණයේ ගෘහ නිර්මාණාත්මක අංග, මූර්ති සහ කැටයම් නම් කිරීම හා ඒවායේ කලා ලක්ෂණ අගය කිරීම හා රස විඳීම
- ගඩලාදෙණි විහාරය නිර්මාණය සඳහා ඉන්දීය විජයනගර් සම්ප්‍රදාය බලපා ඇති බව විස්තර කිරීම
- එම විහාරයේ නිර්මාණවල ඓතිහාසික පසුබිම සොයා බැලීම
- නිර්මාණාත්මක ශෛලිය සඳහා පදනම් වූ මාධ්‍ය හා ශිල්ප ක්‍රම විස්තර කිරීම

**ඇමුණුම 7.1.1.1**

## කාර්ය පත්‍රිකාව

- ප්‍රදර්ශනය කර ඇති ගඩලාදෙණි විහාරයේ කලා නිර්මාණ හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- ගඩලාදෙණි විහාර නිර්මාණවල පවතින සුවිශේෂී ලක්ෂණ හඳුනා ගන්න.
- පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
    1. ගඩලාදෙණිය විහාරයේ දැකිය හැකි වාස්තු විද්‍යා අංග හා මූර්ති නම් කරන්න.
    2. ගඩලාදෙණි විහාරයේ ඓතිහාසික පසුබිම කෙටියෙන් පැහැදිලි කරන්න.
        - යුගය/ කාලය
        - අනුග්‍රහය
        - ශිල්පියා
    3. වාස්තු විද්‍යා නිර්මාණවල කලාත්මක ශෛලිය සඳහා පදනම් වූ පහත අංග විස්තර කරන්න.
        - සම්ප්‍රදාය
        - වාස්තු විද්‍යාත්මක ප්‍රවේශ/සැලසුම්/ ආකෘති
        - මාධ්‍ය හා ශිල්ප ක්‍රම
    4. ගඩලාදෙණි විහාරයේ බුදු පිළිමය පිළිබඳ පහත කරුණු ඇසුරින් කලාත්මක ඇගයීමක් කරන්න.
        - මුද්‍රා
        - ආසන ක්‍රමය
        - සිවුර
        - මුහුණේ ප්‍රකාශනය
- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

## කියවීම් පත්‍රිකාව

- සද්ධර්මතිලක විහාරය හෙවත් ගඩලාදෙණි විහාරය ගම්පොළ යුගයට අයත් නිර්මාණයකි.
- ක්‍රි. ව. 1341-1351 කාලයට අයත් ගම්පොළ යුගයේ රජ කළ සතරවන බුවනෙකබාහු රජුගේ රාජ්‍ය කාලයේදී ධර්මකිර්ති හිමියන්ගේ අනුශාසනාව පරිදි හා සේනාධිලංකාර ඇමැතිගේ මූලිකත්වයෙන් මෙම විහාර නිර්මාණ කටයුතු සිදු කර ඇත.
- මෙම විහාරයේ ගෘහ නිර්මාණ ශිල්පියා ලෙස කටයුතු කරන ලද්දේ දකුණු ඉන්දීය ශිල්පියකු වන ගණේෂ්වරාචාර්ය හා ඔහුගේ අනුගාමික ශිල්පීන් ය.

### වාස්තු විද්‍යා නිර්මාණ

**ගඩලාදෙණිය විහාරය  ප්‍රතිමා විහාරය**





- මෙම සුවිශේෂී ගොඩනැගිල්ල තනි කළුගලෙන් නිමවා ඇති අතර, මණ්ඩපය, අන්තරාලය හා ගර්භගෘහය යන ප්‍රධාන කොටස් තුනකින් සමන්විත වේ.
- ගඩලාදෙණි විහාරයේ මණ්ඩපය තනි කළුගලින් නිමවා ඇත. මෙහි පියස්ස පැතලි ය. පාදමෙහි නටන්නන්ගේ සහ වයන්නන්ගේ රූප පෙළක් කැටයම් කර ඇති අතර එම රූප ජීවශක්තියෙන් සහ චලනයන්ගෙන් යුක්ත ය.
- සිවුරුස්, අටැස් කොටස්වලින් යුතු ව දොරටුව ඉදිරිපස දෙකළවර ඇති තුන් ඇඳුතු ගල් කුලුනු හා දාගැබක හැඩය ඇති "ගෙඩිගෙය" නම් වූ වෘත්තාකාර ශිඛරයක් සහිත පියස්සකින් සමන්විත මෙම බෞද්ධ විහාරය, දකුණු ඉන්දීය විජයනගර් ගෘහ නිර්මාණ කලා ලක්ෂණ පෙන්වයි.
- මෙම කුලුනු පාදමෙහි හිස ඔසවා ගත් සිංහ රුවක් නිර්මාණය කර ඇති අතර කුලුනු මුදුනෙහි තවත් සිංහ රූපයක් ද බඳේ පනේලය තුළ වෘෂභයකු පිට නැග ගත් මිනිස් රුවක් හා මාළුවකු පිට නැග ගත් මිනිස් රුවකි. විශාල කුලුනකට කුඩා කුලුනු සම්බන්ධ කිරීම සඳහා ගල්පටියක් භාවිතා කිරීම මෙහි දැකිය හැකි සුවිශේෂී ලක්ෂණයකි.

**විජයොත්පාය**



- විජයොත්පාය නමින් හඳුන්වෙන අඩි 12 ක් පමණ උස අධිතාලමක් මත හිඳි බුද්ධ ප්‍රතිමා සතරක් තැන්පත් කර ඇති ගලින් නිම වූ ප්‍රතිමා ගෘහ 04ක් විහාරය ඉදිරිපිට ගල්තලාව මත දැකිය හැකි ය.
- මෙම ගෘහ නිර්මාණ අංගයේ දිසා අටකට මුහුණලා ඇත් රූප 08ක් කැටයම් කර ඇත. ගොඩනැගිල්ල මධ්‍යයෙහි අඩි 40 ක් පමණ උසට නිර්මාණය කර ඇති ස්තූපය පියස්සකින් ආවරණය වේ.
- ස්තූපය වටා ඇති කුඩා පරිවාර චෛත්‍ය සතරකි. ඒවා ප්‍රතිමා ගෘහයන් හතරෙහි පියස්ස මත ගොඩ නගා ඇත.

**බුදු පිළිම**



- ගර්භ ගෘහය තුළ හිඳි බුදු පිළිමයක් සහ හිටි පිළිම සතරක් දක්නට ලැබෙන අතර මෙම ප්‍රතිමා මහනුවර යුගයේ දක්නට ලැබෙන ප්‍රතිමා ලක්ෂණ පිළිබිඹු කරයි.
- මෙම බුදු පිළිම විවෘත දෙනෙත්, තරංගාකාර රැළි සහිත චීවරය පෙන්නුම් කෙරෙන අතර බුදුන් වහන්සේගේ අධ්‍යාත්මික ගුණ සමුදායට වඩා බාහිර ලක්ෂණ පෙන්වීමට ශිල්පියා උත්සාහ ගෙන ඇත.
- වර්ණ ගන්වන ලද හිඳි බුදු පිළිමයට පිටුපසින් අලංකාර මකර තොරණකි.
- වීරාසන ක්‍රමයට වැඩහිඳින හා ධ්‍යාන මුද්‍රාවෙන් යුතු මෙම බුදු පිළිමය හිස මත සිරස්පත දක්වා තිබීම ද විශේෂ ලක්ෂණයක් වේ.

**නිපුණතාව 7.0** : **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලාවන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.1** : **ගම්පොළ යුගයේ ගෘහ නිර්මාණ චිත්‍ර, මූර්ති හා කැටයම් අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.1.2** : **"ලංකාතිලක විහාරය"**

**කාලච්ඡේද සංඛ්‍යාව** : **01 යි**

**ඉගෙනුම් පල** :
- ලංකාතිලක විහාරයේ ගෘහ නිර්මාණ, මූර්ති, කැටයම්, සිතුවම් නම් කරයි.
- ලංකාතිලක විහාරයේ නිර්මාණවල ඓතිහාසික පසුබිම සොයා බලයි.
- නිර්මාණාත්මක ශෛලිය සඳහා පදනම් වූ මාධ්‍ය හා ශිල්ප ක්‍රම විස්තර කරයි.
- ලංකාතිලක විහාරයේ නිර්මාණවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- ලංකාතිලක විහාරයේ ගෘහ නිර්මාණ, මූර්ති, කැටයම්, සිතුවම් ඇතුළත් ඡායාරූප
- ඇමුණුම 7.1.2.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 7.1.2.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 7.1.2.1** :
- ලංකාතිලක විහාරයේ ගෘහ නිර්මාණ අංග, මූර්ති සහ සිතුවම් සිසුන්ගේ අවධානයට යොමු කරවන්න.
- ඒවා පිළිබඳ සිසුන්ගේ පෙර දැනුම විමසන්න.
- ලංකාතිලක විහාරයේ නිර්මාණයන්ට අදාළ තොරතුරු එක්රැස් කරවීමට සිසුන් යොමු කරවන්න.

(මිනිත්තු 10 යි)

**පියවර 7.1.2.2** :
- ඇමුණුම 7.1.2.1 ට අයත් කාර්ය පත්‍රිකාව හා ඇමුණුම 7.1.2.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- කියවීම් පත්‍රිකාව ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- ඔවුනොවුන් අතර සාකච්ඡාවෙන් නිවැරදි පිළිතුරු සොයා ගැනීමට මග පෙන්වන්න.

(මිනිත්තු20 යි)

පියවර 7.1.2.3 :

- පිළිතුරු සැපයීමෙන් අනතුරුව අහඹු ලෙස තෝරාගත් සිසුන් කිහිපදෙනෙකුගේ පිළිතුරු ඇගයීමට ලක් කරන්න.
- සමස්ත පාඩම පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 7.1.2.1 හා ඇමුණුම 7.1.2.2 පදනම් කර කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- ලංකාතිලක විහාරයේ මූර්ති සහ සිතුවම් නම් කිරීම
- ලංකාතිලක විහාරය නිර්මාණය සඳහා ලැබූ ආභාසය විස්තර කිරීම
- ලංකාතිලක විහාරයේ ගෘහ නිර්මාණ, සිතුවම් හා මූර්ති ලක්ෂණ ඇගයීම හා රස විඳීම

**ඇමුණුම 7.1.2.1**

## කාර්ය පත්‍රිකාව

- ප්‍රදර්ශනය කර ඇති ලංකාතිලක විහාර නිර්මාණ හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- ලංකාතිලක විහාර නිර්මාණවල පවතින සුවිශේෂී ලක්ෂණ හඳුනාගන්න.
- පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
    1. ලංකාතිලක විහාරයේ දැකිය හැකි වාස්තු විද්‍යා අංග, චිත්‍ර හා මූර්ති නම් කරන්න.
    2. ලංකාතිලක විහාරයේ ඓතිහාසික පසුබිම කෙටියෙන් පැහැදිලි කරන්න.
        - යුගය/ කාලය
        - අනුග්‍රහය
        - ශිල්පියා
    3. වාස්තු විද්‍යා නිර්මාණවල කලාත්මක ශෛලිය සඳහා පදනම් වූ පහත අංග විස්තර කරන්න.
        - සම්ප්‍රදාය
        - වාස්තු විද්‍යාත්මක ප්‍රවේශ/සැලසුම්/ ආකෘති
        - මාධ්‍ය හා ශිල්ප ක්‍රම
    4. ලංකාතිලක විහාරයේ බුදු පිළිමය පිළිබඳ පහත කරුණු ඇසුරින් කලාත්මක ඇගයීමක් කරන්න.
        - මුද්‍රා
        - ආසන ක්‍රමය
        - සිවුර
        - මුහුණේ ප්‍රකාශනය
    5. ලංකාතිලක විහාර සිතුවම් අතර දක්නට ලැබෙන සිතුවම් නම් කරමින් ඒවා පිළිබඳ පහත කරුණු යටතේ ඇගයීමක් කරන්න.
        - ශෛලිය
        - ශිල්ප ක්‍රමය
        - වර්ණ භාවිතය
        - රේඛාකරණය
- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

ඇමුණුම 7.1.2.2

## කියවීම් පත්‍රිකාව

- ගම්පොළ යුගයේ ඉදිවූ ලංකාතිලක විහාරය පැන්හල්ගල නම් වූ ගල්තලාවක් මත ඉදිකර ඇත.
- හතර වන බුවනෙකබාහු රජ කාලයට (ක්‍රි.ව. 1341 - 1351) අයත් මෙම ගොඩනැගිල්ල සේනාධිලංකාර අමාත්‍යවරයාගේ උපදෙස් මත නිර්මාණය කරන ලද්දකි.
- ලංකාතිලක විහාරයේ නිර්මාණ ශිල්පියා වන්නේ ඉන්දියාවේ ස්ථපතිරායර් නම් ශිල්පියා යි.

**වාස්තු විද්‍යා නිර්මාණ - ලංකාතිලක විහාරය**

- මෙම ගෘහ නිර්මාණය සඳහා ගඩොල් සහ හුණු බදාම යොදාගෙන ඇති අතර අතීතයේ දී එය මහල් 4කින් යුක්ත විය.
- පිටත බිත්තියේ නිර්මාණය කරන ලද ඇත් රූප හා පැන්නුම් කුලුනු විහාරයට අලංකාරයක් ගෙන දෙන වාස්තු විද්‍යාත්මක අංග වේ.
- ප්‍රතිමා ගෘහයට සම්බන්ධ කර සතර දිසාවේ සමන්, විභීෂණ, උපුල්වන් කතරගම හා ගණදෙවියන් උදෙසා සාදන ලද දේවාල පහක් (05) හා ඒවායේ දේව ප්‍රතිමා දක්නට ලැබේ.

**බුද්ධ ප්‍රතිමා**

- ප්‍රතිමා ගෘහයේ ඇති හිඳි බුද්ධ ප්‍රතිමාවේ දෙනෙත් විවෘත ව මෙන් ම, චීවරයේ රැළි තරංගාකාරව යොදමින් බුදුන් වහන්සේගේ අධ්‍යාත්මික ගුණ සමුදායට වඩා බාහිර ලක්ෂණ පෙන්වීමට ශිල්පියා උත්සාහ ගෙන ඇත. එසේ ම ප්‍රතිමාවේ සෘජු දෘඩ ප්‍රකාශනයක් පිළිබිඹු කරයි.
- වීරාසන ක්‍රමයට වැඩහිඳින බුදු පිළිමයෙහි ධ්‍යාන මුද්‍රාව මෙන් ම ඌෂ්ණීෂය මත සිරස්පත නිර්මාණය කර තිබීම දැකිය හැකි ය.
- මල්කමින් හා ලියකමින් සරසන ලද මකර තොරණක් වර්ණවත් ප්‍රතිමාවට පිටුපසින් නිර්මාණය කර ඇත.

**සිතුවම්**

- මහනුවර යුගයේ සිතුවම් සම්ප්‍රදායට නෑකම් කියන ලංකාතිලක විහාර සිතුවම් අතර සූවිසි විවරණය, සොළොස්මස්ථානය, සත් සතිය ආදී සිතුවම් වැදගත් ස්ථානයක් ගනියි. එසේ ම කීර්ති ශ්‍රී රාජසිංහ රජු හා සේනාධිලංකාර අමාත්‍ය රූ චිත්‍රණය කර තිබීම දැකිය හැකි ය.
- පාරම්පරික සැරසිලි මෝස්තර අතර මෙහි වියන්තලයේ නිර්මාණය කර ඇති සිව් හංස පූට්ටුව මෙන් ම අලංකාර වූ ලියවැල් මෝස්තර විශිෂ්ට නිර්මාණ වශයෙන් සැලකේ.



ලංකාතිලක රජ මහා විහාරය



බුද්ධ ප්‍රතිමා



සූවිසි බුදුවරුන්ගේ නිර්මාණ අතර
'කෝණාගම බුද්ධ'



සිව් හංස පූට්ටුව



විවිධ සැරසිලි මෝස්තර

**නිපුණතාව 7.0** : **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලාවන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.1** : **ගම්පොළ යුගයේ ගෘහ නිර්මාණ චිත්‍ර, මූර්ති හා කැටයම් අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.1.3** : ''ඇම්බැක්කේ දේවාලය''

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි

**ඉගෙනුම් පල**

- ඇම්බැක්ක දේවාලයේ ගෘහ නිර්මාණ හා කැටයම් හඳුනාගනිමින් නම් කරයි.
- ඇම්බැක්ක දේවාලයේ නිර්මාණවල ඓතිහාසික පසුබිම සොයා බලයි.
- නිර්මාණ සඳහා පදනම් වූ ආභාස, මාධ්‍ය හා ශිල්ප ක්‍රම විස්තර කරයි.
- ඇම්බැක්ක දේවාලයේ ගෘහ නිර්මාණ ඇතුළු කලා අංගවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කරයි.

**ගුණාත්මක යෙදවුම්** :

- ඇම්බැක්ක දේවාලයේ ගෘහ නිර්මාණ ලී කැටයම් ඇතුළත් ඡායාරූප
- ඇමුණුම 7.1.3.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 7.1.3.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 7.1.3.1** :

- ඇම්බැක්ක දේවාලයේ කැටයම් සහිත පින්තූරයක් ප්‍රදර්ශනය කර ඒ පිළිබඳ සිසු අවධානය යොමු කරවන්න.
- ඇම්බැක්ක දේවාලයේ ලී කැටයම් නිර්මාණ, ඒවායේ ආභාසය, ශෛලිය පිළිබඳ සිසුන්ගේ පෙර දැනුම විමසන්න.
- ඇම්බැක්ක දේවාලයේ නිර්මාණවලට අදාළ තොරතුරු එක්රැස් කිරීමට සිසුන් යොමු කරවන්න.

(මිනිත්තු 15 යි)

**පියවර 7.1.3.2** :

- ඇමුණුම 7.1.3.1 කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- ඇමුණුම 7.1.3.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- කියවීම් පත්‍රිකාව ඇසුරින් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සිසුන්ට උපදෙස් දෙන්න.

(මිනිත්තු 50 යි)

පියවර 7.1.3.3 :
- පන්තියේ සිසුන් කිහිපදෙනෙකු අහඹු ලෙස තෝරාගෙන ඔවුන්ගේ පිළිතුරු ඇගයීමට ලක් කරන්න.
- සමස්ත ක්‍රියාකාරකම පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 15 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 7.1.3.1 හා ඇමුණුම 7.1.3.2 පදනම් කර කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- ඇම්බැක්ක දේවාලයේ නිර්මාණවල ඓතිහාසික පසුබිම සොයා බැලීම
- ඇම්බැක්ක දේවාලයේ ගෘහ නිර්මාණ හා කැටයම් හඳුනාගනිමින් නම් කිරීම
- එම නිර්මාණ සඳහා පදනම් වූ ආභාස, මාධ්‍ය හා ශිල්ප ක්‍රම විස්තර කිරීම
- ඇම්බැක්ක දේවාලයේ ලී කැටයම්වල කලාත්මක ලක්ෂණ විස්තර කිරීම

ඇමුණුම 7.1.3.1

## කාර්ය පත්‍රිකාව

- ප්‍රදර්ශනය කර ඇති ඇම්බැක්ක දේවාලයේ නිර්මාණ හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- ඇම්බැක්ක දේවාලයේ නිර්මාණවල පවතින සුවිශේෂී ලක්ෂණ හඳුනාගන්න.

- පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  1. ඇම්බැක්ක දේවාලයේ ඓතිහාසික පසුබිම කෙටියෙන් පැහැදිලි කරන්න.
     - යුගය/ කාලය
     - අනුග්‍රහය
     - ශිල්පියා
  2. ඇම්බැක්ක දේවාලයේ දැකිය හැකි කල්පිත හා සමකාලීන සමාජය නිරූපණය කරන සුවිශේෂී කැටයම් නම් කරන්න.
  3. වාස්තු විද්‍යා නිර්මාණවල කලාත්මක ශෛලිය සඳහා පදනම් වූ පහත අංග විස්තර කරන්න.
     - සම්ප්‍රදාය
     - වාස්තු විද්‍යාත්මක ප්‍රවේශ/සැලසුම්/ ආකෘති
     - මාධ්‍ය හා ශිල්ප ක්‍රම
  4. ඇම්බැක්ක දේවාලයේ ලී කැටයම් පිළිබඳ පහත කරුණු සැලකිල්ලට ගනිමින් කලාත්මක ඇගයීමක් කරන්න.
     - මාධ්‍ය
     - ශිල්ප ක්‍රමය
     - ශෛලිය
     - භාව ප්‍රකාශනය
     - සමකාලීන සමාජ නිරූපණය

- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

ඇමුණුම 7.1.3.2

## කියවීම් පත්‍රිකාව

- ගම්පොළ යුගයේ ඉදිවූ ඇම්බැක්ක දේවාලය මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර මැද පළාත කෝරළයේ පිහිටා ඇත.
- 14 වන ශත වර්ෂයේ රජ කළ තුන් වන වික්‍රමබාහු රජ දවස දෙල්මඩ මූලාචාරී සහ ඔහුගේ ගෝලයින් විසින් මෙම දේවාලයේ නිර්මාණ කටයුතු කර ඇත.
- ජනප්‍රවාදයේ එන පරිදි බෙර වයන්නෙකු දුටු සිහිනයක ප්‍රතිඵලයක් ලෙස කතරගම දෙවියන් උදෙසා ඇම්බැක්ක දේවාලය නිර්මාණය කළ බව සඳහන් වේ.



ඇම්බැක්කේ දේවාලය



මඩොල් කුරුපාව

- ඇම්බැක්ක දේවාලයේ සුවිශේෂ වූ පියස්ස, පරාල 26ක් එක් ලී ඇණයකට සම්බන්ධ කර නිර්මාණය කර ඇති ගෘහ නිර්මාණාත්මක අංගය මඩොල් කුරුපාව නමින් හඳුන්වයි. මෙය හෙළ කලාකරුවාගේ ගෘහ නිර්මාණ ශිල්පයේ විශිෂ්ටත්වය පෙන්නුම් කරන්නකි.
- ඇම්බැක්ක දේවාලයේ වාස්තු විද්‍යාත්මක සැලැස්ම වාහල්කඩ මණ්ඩපය, දිග්ගෙය, ගර්භ ගෘහය යන අංගවලින් සමන්විත වේ. වාහල්කඩ මණ්ඩපයෙහි හා දිග්ගෙයි ඇති ලී කණු මත කැටයම් නිර්මාණ දැක ගත හැකි ය.

**වාහල්කඩ මණ්ඩපයඃ**

- මෙහි ලී කණු 10 කි.
- සෑම කණුවක ම සිව්රැස් පනේල සතර බැගින් දක්නට ඇත. ඒ අනුව පනේල කැටයම් 40කි.

**දිග්ගෙය :**

- මෙහි ලී කණු 32 කි. සෑම කණුවකම සිව්රැස් පනේල සතර බැගින් ඇත.
- මෙහි කැටයම් සංඛ්‍යාව 128 කි.

- ඇම්බැක්ක දේවාලයේ ලී කැටයම් ගම්මාලු හා පිහිඹියා දැවයෙන් අල්ප උන්නත නෙළීමේ ශිල්ප ක්‍රමයට නිර්මාණය කර ඇත.
- ප්‍රධාන තේමා 5ක් යටතේ කැටයම් නිර්මාණ හඳුනාගත හැකි ය.

1. **කල්පිත සත්ත්ව මෝස්තර**
2. **සත්ත්ව මෝස්තර**
3. **ජන ජීවිතය හා සම්බන්ධ කැටයම්**
4. **වාටි මෝස්තර (ලීස්තර )**
5. **මල්කම් හා ලියකම්**

- පාරම්පරික සිංහල සැරසිලි මෝස්තර අතර දැකිය හැකි සුවිශේෂී කල්පිත මෝස්තර නිර්මාණ බොහොමයක් ඇම්බැක්ක දේවාලයේ පනේල ලී කැටයම් අතර දැක ගත හැකි ය. පහතින් දැක්වෙන්නේ කලාත්මක ලක්ෂණයන්ගෙන් යුතු කල්පිත හා සත්ත්ව නිර්මාණ කිහිපයකි.

| | |
|---|---|
| – හේරුණ්ඩ පක්ෂියා | – කිඳුරු රූපය |
| – ඇත්කඳ ලිහිණියා | – නාරිලතා |
| – සැරපෙන්දියා | – හංස පූට්ටුව |
| – වෘෂභ කුංඤ්ජය | – සිංහයා |


හේරුණ්ඩ පක්ෂියා


කිඳුරිය


හංස පූට්ටුව


වෘෂභ කුඤ්ඤරය


හංසයා


සිංහයා

- ඇම්බැක්ක දේවාල ලී කැටයම් අතර සුවිශේෂී නිර්මාණ වශයෙන් සැලකෙනුයේ සමකාලීන සමාජ ජීවිතය සම්බන්ධ අවස්ථා නිරූපණය කරන කැටයම් ය. පහත සඳහන් වන එම නිර්මාණ කිහිපයකි.

| | |
|---|---|
| – රබන් වයන්නා | – මල්ලව පොරය |
| – අශ්වාරෝහකයා | – නළඟන |
| – හේවායා | – දරුවාට කිරි පොවන මව |

- ඉහත දක්වන ලද සියලු නිර්මාණ පනේල මධ්‍යයේ කැටයම් වූ අතර පනේල වටා වූ වාටි මෝස්තර (ලීස්තර) සඳහා නිර්ජීවී හා උද්භිත සැරසිලි මෝස්තර යොදා ඇත. මේ සඳහා අරිම්බුව, ගල් බිංදුව හා කුන්දිරික්කන් වැනි නිර්ජීවී මෝස්තර ද, නෙළුම් මල් හා ලියවැල් උද්භිත මෝස්තර ද නිර්මාණ ලෙස භාවිත කර ඇත.


නෙළුම - පේකඩ නිර්මාණයකි


ලියකම් මෝස්තරයක්


නළඟන


දරුවාට කිරි පොවන මව


මල්ලව පොරය


විදේශීය හේවායා


දේශීය හේවායා


රබන් වයන්නා

**නිපුණතාව 7.0** : **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලාවන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.2** : **මහනුවර යුගයේ උඩරට සම්ප්‍රදායේ ගෘහ නිර්මාණ, චිත්‍ර, මූර්ති හා කැටයම් අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.2.1** : **''සෙංකඩගලපුර ශ්‍රී දළදා වරුණ''**

**කාලච්ඡේද සංඛ්‍යාව** : **01 යි**

**ඉගෙනුම් පල** :

- මහනුවර ශ්‍රී දළදා මාළිගාවේ ගෘහ නිර්මාණ ශිල්පය සහ කැටයම් පිළිබඳ තොරතුරු එක්රැස් කරයි.
- දළදා මාළිගාවේ ගෘහ නිර්මාණ අංග සහ කැටයම් නම් කරයි.
- දළදා මාළිගාවේ නිර්මාණවල ඓතිහාසික පසුබිම සොයා බලයි.
- නිර්මාණාත්මක ශෛලිය සඳහා පදනම් වූ ආභාස, මාධ්‍ය හා ශිල්ප ක්‍රම විස්තර කරයි.
- දළදා මාළිගාවේ ගෘහ නිර්මාණ ඇතුළු කලා අංගවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කරයි.

**ගුණාත්මක යෙදවුම්** :

- මහනුවර ශ්‍රී දළදා මාළිගාව හා එහි බිතු සිතුවම් හා කැටයම් සහිත පින්තූර
- ඇමුණුම් 7.2.1.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම් 7.2.1.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 7.2.1.1** :

- මහනුවර ශ්‍රී දළදා මාළිගාවේ ගෘහ නිර්මාණය, කැටයම් පිළිබඳ සිසු අවධානය යොමු කරවන්න.
- ශ්‍රී දළදා මාළිගාවට අදාළ තොරතුරු එක්රැස් කරවීමට සිසුන් යොමු කරවන්න.
- එම කලා නිර්මාණ පිළිබඳ ව සිසුන්ගේ පෙර දැනුම විමසන්න.

(මිනිත්තු 10 යි)

**පියවර 7.2.1.2** :

- ඇමුණුම 7.2.2.1 ඇතුළත් කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- ඇමුණුම 7.2.2.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව සිසුන්ට ලබාදෙන්න.
- කියවීම් පත්‍රිකාව ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සිසුන්ට උපදෙස් දෙන්න.

(මිනිත්තු 20 යි)

පියවර 7.2.1.3 : 

- සිසුන් කිහිපදෙනෙකුගේ පිළිතුරු පත් ඇගයීමට ලක් කරන්න.
- සමස්ත ක්‍රියාකාරකම පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 7.2.1.1 හා ඇමුණුම 7.2.1.2 පදනම් කර කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- මහනුවර යුගයේ විශිෂ්ට වාස්තු විද්‍යාත්මක නිර්මාණයක් ලෙස දළදා මාළිගාවේ ඓතිහාසික තොරතුරු සොයා බැලීම
- දළදා මාළිගාවේ වාස්තු විද්‍යාත්මක සැලසුම විස්තර කිරීම
- නිර්මාණාත්මක ශෛලිය සඳහා පදනම් වූ ආභාස, මාධ්‍ය හා ශිල්ප ක්‍රම මෙන් ම නිර්මාණ ශිල්පින් සොයා බැලීම
- දළදා මාළිගාවේ බිතු සිතුවම් හා ගෘහ නිර්මාණ ලක්ෂණ ඇගයීමට ලක් කිරීම

**ඇමුණුම 7.2.1.1**

## කාර්ය පත්‍රිකාව

- ප්‍රදර්ශනය කර ඇති දළදා මාළිගාවේ නිර්මාණ හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- දළදා මාළිගාවේ නිර්මාණවල පවතින සුවිශේෂී ලක්ෂණ හඳුනාගන්න.

- පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  1. දළදා මාළිගාවේ ඓතිහාසික පසුබිම කෙටියෙන් පැහැදිලි කරන්න.
     - යුගය/ කාලය
     - අනුග්‍රහය
     - ශිල්පියා
  2. දළදා මාළිගාවේ දැකිය හැකි වාස්තු විද්‍යා අංග නම් කරන්න.
  3. වාස්තු විද්‍යා නිර්මාණවල කලාත්මක ශෛලිය සඳහා පදනම් වූ පහත අංග විස්තර කරන්න.
     - සම්ප්‍රදාය
     - වාස්තු විද්‍යාත්මක ප්‍රවේශ/සැලසුම්/ ආකෘති
     - මාධ්‍ය හා ශිල්ප ක්‍රම
  4. දළදා මාළිගාවේ සඳකඩ පහණෙහි හැඩය හා එහි රූප භාවිතය ඇසුරින් කලා ලක්ෂණ ඇගයීමට ලක් කරන්න.
- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

# කියවීම් පත්‍රිකාව

- ශ්‍රී ලාංකික ජනතාවගේ මුදුන් මල්කඩක් බඳු වූ ශ්‍රී දළදා මාළිගාව විවිධ ප්‍රතිසංස්කරණයන්ට භාජනය කරමින්, දෙවන විමලධර්මසූරිය රජතුමා විසින් (ක්‍රි.ව. 1687 - 1707) විසින් ගොඩනගා ඇති බව සඳහන් වේ.
- දළදා මාළිගාවයට අයත් ගොඩනැගිලි සංකීර්ණය දළදා මැදුර, මගුල් මඩුව, පත්තිරිප්පුව, උල්පැන් ගෙය, දියතිලක මණ්ඩපය, මුලාදෑනි මන්දිරය ආදී වශයෙන් නම් කළ වාස්තු විද්‍යාත්මක නිර්මාණ රැසකින් යුක්ත ය.
- මෙම ආගමික සංකීර්ණයේ ඇති සුවිශේෂී ම ගෘහ නිර්මාණ අංගය/ගොඩනැගිල්ල වන්නේ පත්තිරිප්පුවයි.
- මෙම ගොඩනැගිල්ල අටපට්ටම් හැඩයෙන් යුක්ත ය.
- ගොඩනැගිල්ල වටා පේශාවන් දැක්වෙන අතර කවළු, කුලුනු හා ගරාදි වැටවල් ක්‍රමානුකූලව නිර්මාණය කර ඇත.
- පත්තිරිප්පුව නිර්මාණයේ ගෞරවය හිමිවන්නේ දේවේන්ද්‍ර මූලාචාරීන්ට ය.
- ශ්‍රී දළදා මාලිගාවේ මහනුවර සම්ප්‍රදායට අයත් සිතුවම් රැසක් දක්නට ලැබෙන අතර ලියකම්, මල්කම්, කල්පිත රූප සුවිශේෂී වේ.
- මහනුවර යුගයේ දක්නට ලැබෙන හොඳ ම සඳකඩ පහණ දළදා මාළිගාවෙන් හමුවේ.
- ත්‍රිකෝණාකාර හැඩයක් ගන්නා මෙම සඳකඩ පහණ මධ්‍යයේ මඳක් උස් වූ පද්මයක් හා දෙපස මල් ලියකම් දැකිය හැකි ය.



ශ්‍රී දළදා මාලිගය



මහනුවර යුගයේ සඳකඩ පහණ

**නිපුණතාව 7.0** : **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලාවන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.2** : **මහනුවර යුගයේ උඩරට සම්ප්‍රදායේ ගෘහ නිර්මාණ, චිත්‍ර, මූර්ති හා කැටයම් අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.2.2** : ''මැදවල ටැම්පිට විහාරය''

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි

**ඉගෙනුම් පල** :
- මැදවල විහාරයේ ගෘහ නිර්මාණ අංග හා සිතුවම් නම් කරයි.
- මැදවල විහාරයේ කලා නිර්මාණවල ඓතිහාසික පසුබිම සොයා බලයි.
- නිර්මාණාත්මක ශෛලිය සඳහා පදනම් වූ මාධ්‍ය හා ශිල්ප ක්‍රම විස්තර කරයි.
- මැදවල ටැම්පිට විහාර සිතුවම් පිළිබඳ තොරතුරු එක්රැස් කරයි.
- මැදවල විහාරයේ ගෘහ නිර්මාණය හා සිතුවම් අගයයි, රස විඳියි.

**ගුණාත්මක යෙදවුම්** :
- මැදවල විහාරය හා සබැඳි ගෘහ නිර්මාණවල ඡායාරූප, සිතුවම්වල ඡායාරූප
- ඇමුණුම 7.2.2.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 7.2.2.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 7.2.2.1** :
- මැදවල විහාරයේ ගෘහ නිර්මාණය සහ බිතු සිතුවම් පිළිබඳ සිසු අවධානය යොමු කරවන්න.
- එම සිතුවම්වල වස්තු විෂය ශෛලිය, සම්ප්‍රදාය පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
- මැදවල විහාරයේ වාස්තු විද්‍යාත්මක ලක්ෂණ පිළිබඳ තොරතුරු විමසන්න.
- මැදවල විහාරයේ කලා නිර්මාණ පිළිබඳ තොරතුරු එක්රැස් කිරීමට සිසුන් යොමු කරවන්න.

(මිනිත්තු 15 යි)

**පියවර 7.2.2.2** :
- ඇමුණුම 7.2.2.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබාදෙන්න.
- ඇමුණුම 7.2.2.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව සිසුන්ට ලබාදෙන්න.
- කියවීම් පත්‍රිකාව ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සිසුන්ට උපදෙස් දෙන්න.

(මිනිත්තු 50 යි)

පියවර 7.2.2.3 : 
- පන්තියේ සිසුන් කිහිපදෙනෙකුගේ පිළිතුරු ඇගයීමට ලක් කරන්න.
- සමස්ත ක්‍රියාකාරකම පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 15 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 7.2.2.1 හා ඇමුණුම 7.2.2.2 පදනම් කර කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- මැදවල විහාරයයේ ඓතිහාසික තොරතුරු සොයා බැලීම
- ටැම්පිට විහාරයක ඇති මූලික ලක්ෂණ විමසා බැලීම
- මැදවල විහාරයේ සිතුවම්වල නිර්මාණාත්මක ශෛලිය සඳහා පදනම් වූ මාධ්‍ය හා ශිල්ප ක්‍රම විස්තර කිරීම
- මැදවල චිත්‍ර නිර්මාණ පිළිබඳ කලාත්මක ලක්ෂණ ඇගයීම හා රසවිඳීම

**ඇමුණුම 7.2.2.1**

## කාර්ය පත්‍රිකාව

- ප්‍රදර්ශනය කර ඇති මැදවල ටැම්පිට විහාරයේ නිර්මාණ හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  1. මැදවල විහාරයේ දැකිය හැකි වාස්තු විද්‍යා ලක්ෂණ විස්තර කරන්න.
  2. මැදවල විහාරයේ ඓතිහාසික පසුබිම කෙටියෙන් පැහැදිලි කරන්න.
     - යුගය/ කාලය
     - අනුග්‍රහය
     - ශිල්පියා
  3. මැදවල විහාර සිතුවම් අතර දක්නට ලැබෙන සුවිශේෂී සිතුවම් පිළිබඳ පහත කරුණු යටතේ කලාත්මක ඇගයීමක් කරන්න.
     - වස්තු විෂය
     - ශෛලිය
     - ශිල්ප ක්‍රමය
     - වර්ණ භාවිතය
     - රේඛාකරණය
     - භාව ප්‍රකාශන

- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

ඇමුණුම 7.2.2.2

## කියවීම් පත්‍රිකාව

- ගල් කණු මත ඉදිකළ විහාරයක් වන හෙයින් ටැම්පිට විහාරයක් ලෙස හඳුන්වන මැදවල විහාරය මහනුවරට නුදුරු මැදවල ග්‍රාමයේ පිහිටා ඇත.
- මැදවල ටැම්පිට විහාරය අඩි 01 යි අඟල් 08ක් උස් වූ ගල් කණු 34ක් මත ඉදිකර ඇත.
- මැද මහනුවර සම්ප්‍රදායට අයත් ඉතා සියුම් හා විශිෂ්ට නිමාවන්ගෙන් යුතු චිත්‍ර නිර්මාණ මෙම විහාරයේ දැකිය හැකි ය.
- මැදවල විහාරය තුළ දක්නට ලැබෙන කුඩා තීරු සංරචන සිතුවම් අතර ජාතක කතා, සත් සතිය වැනි මාතෘකා විශේෂ වේ. ජාතක කතා අතර වෙස්සන්තර ජාතකය හා උරග ජාතකය ප්‍රධාන තැනක් ගනියි.
- සිතුවම් නිර්මාණ ආශ්‍රිත දැකිය හැකි ප්‍රධාන ලක්ෂණ
  - පාර්ශ්ව දර්ශී රූප
  - තිරු චිත්‍ර සංරචනවල අඛණ්ඩ කථන ක්‍රමය
  - ද්විමාන ලක්ෂණ සහිත පැතලි වර්ණ භාවිතය
  - වර්ණ සඳහා කහ, කොළ, රතු, කළු, සුදු ආදී වර්ණ භාවිතය
  - ප්‍රෙස්කෝ සිකෝ ශිල්ප ක්‍රමය
  - රූප වටා නිමාව දක්වන ප්‍රශස්ත මට්ටමින් යුතු සියුම් රේඛාකරණය
  - පසුබිම සඳහා ගුරු වර්ණය
  - පසුබිම අවකාශය පිරවීම සඳහා විවිධ සැරසිලි මෝස්තර භාවිතය
  - සමස්ත සංරචනය තුළ පරිමාණය හා පර්යාලෝක රීතීන් නොසැලකීම



මැදවල ටැම්පිට විහාරය

වෙස්සන්තර ජාතකය



**නිපුණතාව 7.0** : **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලාවන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.2** : **මහනුවර යුගයේ උඩරට සම්ප්‍රදායේ ගෘහ නිර්මාණ, චිත්‍ර, මූර්ති හා කැටයම් අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.2.3** : ''දෙගල්දොරුව රජ මහා විහාරය''

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි

**ඉගෙනුම් පල** :
- දෙගල්දොරුව විහාරයේ කලා නිර්මාණවල ඓතිහාසික පසුබිම සොයා බලයි.
- දෙගල්දොරුව විහාරයේ සිතුවම් නම් කරයි.
- චිත්‍ර නිර්මාණ සඳහා පදනම් වූ ශෛලිය ලක්ෂණ හා ශිල්ප ක්‍රම විස්තර කරයි.
- දෙගල්දොරුව විහාර සිතුවම් පිළිබඳ තොරතුරු එක්රැස් කරයි.
- දෙගල්දොරුව විහාර සිතුවම්වල කලා ලක්ෂණ අගයයි, රස විඳියි.

**ගුණාත්මක යෙදවුම්** :
- දෙගල්දොරුව විහාරය හා එහි සිතුවම්වල ඡායාරූප
- ඇමුණුම 7.2.3.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 7.2.3.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 7.2.3.1** :
- දෙගල්දොරුව විහාරය සහ එහි ඇති බිතු සිතුවම් පිළිබඳ සිසු අවධානය යොමු කරවන්න.
- දෙගල්දොරුව විහාරයේ නිර්මාණ පිළිබඳ සිසුන්ගේ දැනුම පිරික්සමින් එම සිතුවම්වල වස්තු විෂය, ශෛලිය, සම්ප්‍රදාය පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
- දෙගල්දොරුව විහාරය පිළිබඳ තොරතුරු එක් රැස් කිරීමට සිසුන් යොමුකරවන්න.

(මිනිත්තු 15 යි)

**පියවර 7.2.3.2** :
- ඇමුණුම 7.2.3.1 කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- ඇමුණුම 7.2.3.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- කියවීම් පත්‍රිකාවේ තොරතුරු ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සිසුන්ට උපදෙස් දෙන්න.

(මිනිත්තු 50 යි)

**පියවර 7.2.3.3** :

- අභ්‍යාසයේ ලෙස තෝරාගත් සිසුන් කිහිප දෙනෙකුගේ පිළිතුරු පිළිබඳ ඇගයීමක් කරන්න.
- සමස්ත ක්‍රියාකාරකම පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 15 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 7.2.3.1 හා ඇමුණුම 7.2.3.2 පදනම් කර කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- දෙගල්දොරුව විහාරයේ කලා නිර්මාණවල ඓතිහාසික පසුබිම සොයා බැලීම
- දෙගල්දොරුව විහාරයේ සිතුවම් නම් කිරීම
- චිත්‍ර නිර්මාණ සඳහා පදනම් වූ ශෛලිය, මාධ්‍ය හා ශිල්ප ක්‍රම විස්තර කිරීම
- දෙගල්දොරුව විහාර සිතුවම්වල කලා ලක්ෂණ ඇගයීම හා රසවිඳීම

**ඇමුණුම 7.2.3.1**

## කාර්ය පත්‍රිකාව

- ප්‍රදර්ශනය කර ඇති දෙගල්දොරුව විහාරයේ නිර්මාණ හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. දෙගල්දොරුව විහාරයේ ඓතිහාසික පසුබිම කෙටියෙන් පැහැදිලි කරන්න.
   - යුගය/ කාලය
   - අනුග්‍රහය
   - ශිල්පියා
2. දෙගල්දොරුව විහාර සිතුවම් අතර දක්නට ලැබෙන සුවිශේෂී සිතුවම් නම් කරමින් ඒවා පිළිබඳ ඇගයීමක් කරන්න.
   - ශෛලිය
   - ශිල්ප ක්‍රමය
   - වර්ණ භාවිතය
   - රේඛාකරණය
   - භාව ප්‍රකාශන
   - තලය භාවිතය

- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

ඇමුණුම 7.2.3.2

## කියවීම් පත්‍රිකාව


- ලෙන් විහාර වර්ගයට අයත්, මහනුවර යුගයේ සිතුවම් හමුවන සුවිශේෂී ස්ථානයකි.
- කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා (ක්‍රි.ව. 1747 - 1782) විසින් මෙම ලෙන් විහාරය ගොඩනගන ලදී.
- දෙවරගම්පල සිල්වත්තැන මෙහි සිතුවම් ඇඳ ඇති අතර, කොස්වත්තේ සිත්තර නයිදේ හා නීලගම පටබැන්දා මොහුට සහාය වී ඇති බව පොත පතෙහි සඳහන් වේ.
- ගර්භගෘහයට ඇතුළුවන දොරටුව දෙපස ඇති තීරු චිත්‍ර සංරචන අතර වෙස්සන්තර ජාතකය හා සුතසෝම ජාතකය සුවිශේෂී නිර්මාණ වශයෙන් දැක්වේ.
- විශේෂයෙන් වෙස්සන්තර ජාතක කතාව තුළ ගැබ් ව ඇති ඇලි ඇතු දන්දීම දැක්වෙන චිත්‍රය විශිෂ්ට නිර්මාණයක් වශයෙන් සැලකේ. ඇතුන්ගේ සජීවී චලනය හා රිද්මය නිරූපණය ඊට හේතු වේ.
- සිතුවම් නිර්මාණ ආශ්‍රිත දැකිය හැකි ප්‍රධාන ලක්ෂණ
  - තීරු චිත්‍ර සංරචනවල අඛණ්ඩ කථන ක්‍රමය හා පාර්ශව දර්ශී රූප
  - ද්විමාන ලක්ෂණ සහිත පැතලි වර්ණ භාවිතය හා පසුබිම සඳහා අඳුරු රතු වර්ණය භාවිතය
  - වර්ණ සඳහා කහ, කොළ, රතු, කළු, සුදු ආදී වර්ණ භාවිතය
  - ප්‍රෙස්කෝ සිකෝ හෙවත් වියළි බදාම මත සිතුවම් ඇඳීමේ ශිල්ප ක්‍රමය
  - රූප වටා නිමාව දක්වන ප්‍රශස්ත මට්ටමින් යුතු සියුම් රේඛාකරණය
  - පසුබිම අවකාශය පිරවීම සඳහා විවිධ සැරසිලි මෝස්තර භාවිතය
  - සමස්ත සංරචනය තුළ පරිමාණය හා පර්යාලෝක රීතීන් නොසැලකීම
- විහාර වියන් තලයේ විශාල චිත්‍ර සංරචනයක් ලෙස නිරූපණය කර ඇති මාර පරාජය සිතුවම සුවිශේෂී සමාජ ප්‍රකාශනයක් සහිත නිර්මාණයක් වශයෙන් සැලකේ.
- මාර පරාජය සිතුවමින් තුවක්කුවක් අතින් ගත් මාරයකු දක්වා තිබීමෙන් මෙම සිතුවම් තුළ සමකාලීන අත්දැකීම් හා ද්‍රව්‍ය නිරූපණය කිරීමට ශිල්පියා ගත් උත්සාහය හඳුනාගත හැකි ය.
- සිතුවම්වලට අමතරව පිහිටි ගලෙහි නෙලා ඇති සඳකඩ පහණ මහනුවර යුගයේ සුවිශේෂී නිර්මාණයක් වන අතර එහි ප්‍රධාන මෝස්තරය ලෙස තිරිඟිතලය යොදා ඇත.



දෙගල්දොරුව රජ මහා විහාරය



වෙස්සන්තර රජු අලි ඇතුන් දන් දීම



මාර පරාජය

**නිපුණතාව 7.0** : **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලාවන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.2** : **මහනුවර යුගයේ උඩරට සම්ප්‍රදායේ ගෘහ නිර්මාණ, චිත්‍ර, මූර්ති හා කැටයම් අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.2.4** : "දඹුලු ගලේ රූ වරුණා"

**කාලච්ඡේද සංඛ්‍යාව** : **02 යි**

**ඉගෙනුම් පල** :
- දඹුලු විහාරයේ චිත්‍ර සඳහා පාදක වූ වස්තු විෂයයන් හා සිතුවම් නම් කරයි.
- දඹුලු විහාරයේ නිර්මාණවල ඓතිහාසික පසුබිම සොයා බලයි.
- චිත්‍ර නිර්මාණ සඳහා පදනම් වූ ශෛලිය හා ශිල්ප ක්‍රම විස්තර කරයි.
- දඹුලු විහාරයේ චිත්‍රවල කලා ලක්ෂණ අගයමින් විස්තර කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- දඹුලු ලෙන් විහාරයේ සිතුවම් සහ මූර්තිවල ඡායාරූප
- ඇමුණුම 7.2.4.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 7.2.4.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 7.2.4.1** :
- දඹුලු විහාරයේ ගෘහ නිර්මාණ, බිතු සිතුවම් හා මූර්ති පිළිබඳව සිසු අවධාන යොමු කරවන්න.
- එම කලා නිර්මාණවල ආභාසය, ශෛලිය, වස්තු විෂය පිළිබඳව සිසුන්ගෙන් විමසන්න.
- දඹුලු විහාරයේ නිර්මාණවලට අදාළ තොරතුරු එක්රැස් කිරීමට සිසුන් යොමු කරවන්න.

(මිනිත්තු 15 යි)

**පියවර 7.2.4.2** :
- ඇමුණුම 7.2.4.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- ඇමුණුම 7.2.4.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව සිසුන්ට ලබාදෙන්න.
- කියවීම් පත්‍රිකාව තොරතුරු ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සිසුන්ට උපදෙස් දෙන්න.

(මිනිත්තු 50 යි)

**පියවර 7.2.4.3** :
- සිසුන්ගේ පිළිතුරු සුදුසු පරිදි ඇගයීමට ලක් කරන්න.
- සමස්ත ක්‍රියාකාරකම පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 15 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 7.2.4.1 හා ඇමුණුම 7.2.4.2 පදනම් කර කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- දඹුලු විහාරයේ නිර්මාණවල ඓතිහාසික පසුබිම සොයා බැලීම
- දඹුලු විහාරයේ සිතුවම්වල වස්තු විෂයයන් හා විශිෂ්ට සිතුවම් නම් කිරීම
- චිත්‍ර නිර්මාණ සඳහා පදනම් වූ ශෛලීය ලක්ෂණ හා ශිල්ප ක්‍රමය විස්තර කිරීම
- දඹුලු විහාරයේ චිත්‍රවල කලා ලක්ෂණ අගයමින් විස්තර කිරීම

**ඇමුණුම 7.2.4.1**

## කාර්ය පත්‍රිකාව

- ප්‍රදර්ශනය කර ඇති දඹුලු විහාරයේ නිර්මාණ හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  1. දඹුලු විහාරයේ ඓතිහාසික පසුබිම කෙටියෙන් පැහැදිලි කරන්න.
     - යුගය/ කාලය
     - අනුග්‍රහය
     - ශිල්පියා
  2. දඹුලු විහාර සිතුවම් අතර දක්නට ලැබෙන සුවිශේෂී සිතුවම් නම් කරමින් ඒවා පිළිබඳ ඇගයීමක් කරන්න.
     - ශෛලිය
     - ශිල්ප ක්‍රමය
     - වර්ණ භාවිතය
     - රේඛාකරණය
     - තලය භාවිතය
     - භාව ප්‍රකාශන
- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

**ඇමුණුම 7.2.4.2**

## කියවීම් පත්‍රිකාව

- ක්‍රි.ව. 1 වන සියවසේ දී පමණ වලගම්බා රජු විසින් (වට්ටගාමිණී අභය) මෙම ලෙන් විහාරය කරවා ඇත. ප්‍රධාන වශයෙන් ලෙන් 05කින් සමන්විත ය.
    - දේව රාජ ලෙන
    - මහා රාජ ලෙන
    - මහා අලුත් විහාරය
    - පශ්චිම විහාරය
    - දෙවන අලුත් විහාරය
- දඹුලු විහාර ලෙන් සංකීර්ණයේ විශිෂ්ට සිතුවම් සහ මූර්ති රැසක් හමුවේ.
- මහා රාජ ලෙන යනුවෙන් නම් කර ඇති ලෙනේ සැතපෙන බුද්ධ ප්‍රතිමා ඇතුළු බෝධිසත්ව හා රජවරුන්ගේ ප්‍රතිමා රැසක් දැකිය හැකි ය.
- දඹුලු විහාර සිතුවම් මහනුවර යුගයට අයත් වන අතර අනුරාධපුර යුගයට අයත් යැයි සැලකෙන සිතුවම් කොටසක් ද දැකගත හැකි ය.
- දඹුලු විහාරයේ බිතු සිතුවම් ඇඳීමේ ගෞරවය හිමිවන්නේ නීලගම සිත්තර පරම්පරාවට ය.
- මහනුවර යුගයට අයත් දඹුලු සිතුවම් පහත ලෙස වර්ග කළ හැකි වේ.
    - බෝධිසත්ව චරිත අවස්ථා
      සූවිසි විවරණය
      ජාතක කතා
    - බුද්ධ චරිතයේ විවිධ අවස්ථා
      මාරපරාජය
      රන්කාසි අතුරා ජේතවනය පූජා කිරීම
    - ඓතිහාසික සිදුවීම්
      විජයාගමන
      මහින්දාගමනය
      ශ්‍රී මහා බෝධිය වැඩම කරවීම
      එළාර දුටුගැමුණු යුද්ධය
- සිතුවම් නිර්මාණවල සුවිශේෂ ලක්ෂණ
    - පාර්ශව දර්ශී රූප
    - තීරු චිත්‍ර සංරචනවල අඛණ්ඩ කථන ක්‍රමය
    - ද්විමාන ලක්ෂණ සහිත පැතලි වර්ණ භාවිතය
    - වර්ණ සඳහා කහ, කොළ, රතු, කළු, සුදු වර්ණ භාවිතය හා පසුබිම සඳහා රතු වර්ණය
    - වියළි බදාමය මත බිතු සිතුවම් ඇඳීමේ, ප්‍රෙස්කෝ සිකෝ ශිල්ප ක්‍රමය
    - රූප වටා නිමාව දක්වන ප්‍රශස්ත මට්ටමින් යුතු සියුම් රේඛාකරණය
    - පසුබිම අවකාශය පිරවීම සඳහා නෙළුම් මල්, පිච්ච මල්, සපු මල්, වැටකේ මල් ආදිය යොදා ගැනීම
    - සමස්ත සංරචනය තුළ පරිමාණය හා පර්යාලෝක රීතීන් නොසැලකීම

* වියන්තලයේ විශාල ප්‍රදේශයක් ආවරණය වන පරිදි සිතුවම් කර ඇති මාර පරාජය සිතුවම ක්‍රියාකාරි ඉරියව්වලින් යුතු වූ ප්‍රකාශනයක් සහිත සුවිශේෂී නිර්මාණයක් වශයෙන් සැලකේ.

* මාර පරාජය සිතුවමින් බුදුන් වහන්සේ භූමි ස්පර්ශ මුද්‍රාවෙන් නිරූපිත ය. මෙම අවස්ථාවේ මහී කාන්තාව බුද්ධත්වය සනාථ කිරීමට සාක්ෂිවෙමින් පොළොවෙන් නැගී සිටින අයුරු දක්වා ඇත. පසෙකින් මාර දූවරුන් තිදෙනා හා මාර සේනාව ද දක්වා ඇති මෙම නිර්මාණය ප්‍රකාශනාත්මක බවින් ඉහළ ය.



දඹුලු ලෙන් විහාර සංකීර්ණය



බුද්ධ ප්‍රතිමා හා දේව ප්‍රතිමාවක් (සුමන සමන් දෙවියන්)



බුද්ධත්වයෙන් පස්වන සතිය-මාර දූවරු පරාජය කිරීම



මාර පරාජය සිතුවමේ කොටසක්



දහසක් බුදුවරුන්ගේ රූප



අනෝතප්ත විල

| | | |
|---|---|---|
| **නිපුණතාව 7.0** | : | **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලාවන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.** |
| **නිපුණතා මට්ටම 7.3** | : | **ඉන්දීය ඓතිහාසික කලා නිර්මාණ පිළිබඳ දැනුම හා අවබෝධය ලබයි.** |
| **ක්‍රියාකාරකම 7.3.1** | : | **''ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ නිර්මාණ අගයමු.''** |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | : | **01 යි** |

**ඉගෙනුම් පල** :

- ඉන්දු නිම්න ශිෂ්ඨාචාරයෙන් හමු වී ඇති සුවිශේෂී කලා කෘති සොයා බලයි.
- ඉන්දු නිම්න මූර්ති හා කැටයම් නම් කරයි.
- ඉන්දු නිම්න කලා නිර්මාණවල ඓතිහාසික පසුබිම විස්තර කරයි.
- නිර්මාණාත්මක ශෛලිය සඳහා පදනම් වූ මාධ්‍ය හා ශිල්ප ක්‍රම විස්තර කරයි.
- ඉන්දු නිම්න කලා නිර්මාණවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කරයි.

**ගුණාත්මක යෙදවුම්** :

- ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් සොයාගත් කලා කෘතිවල ඡායාරූප
  - මූර්ති
    - පූජක රුව
    - නළඟන
    - රතු වැලි ගලින් කළ කවන්ද මිනිස් රුව
    - අළු වැලි ගලින් කළ කවන්ද මිනිස් රුව
  - මුද්‍රා
    - මොල්ලිය සහිත ගව රූපය
    - පශුපති
  - වාස්තු විද්‍යා නිර්මාණ
- ඇමුණුම් 7.3.1.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකා
- ඇමුණුම 7.3.1.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකා

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 7.3.1.1 :

- ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් කලා නිර්මාණ සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- එම නිර්මාණ පිළිබඳ සිසුන්ගෙන් අදහස් විමසන්න.

(මිනිත්තු 10 යි)

පියවර 7.3.1.2 :

- ඇමුණුම් 7.3.1.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- ඇමුණුම් 7.3.1.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකා සිසුන්ට බෙදා දෙන්න.
- සිසුන් අදාළ ක්‍රියාකාරකමෙහි යොදවන්න.

(මිනිත්තු 20යි)

පියවර 7.3.1.3 :
- සිසු අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- එම අනාවරණ පිළිබඳ සිසුන්ගේ සංවර්ධනාත්මක අදහස් විමසන්න.
- ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් කලා නිර්මාණ පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 7.3.1.1 හා ඇමුණුම 7.3.1.2 පදනම් කර කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- ඉන්දු නිම්න ශිෂ්ඨාචාරයෙන් හමු වී ඇති සුවිශේෂී කලා කෘති සොයා බැලීම
- ඉන්දු නිම්න මූර්ති හා කැටයම් නම් කිරීම
- ඉන්දු නිම්න කලා නිර්මාණවල ඓතිහාසික පසුබිම සොයා බැලීම
- නිර්මාණාත්මක ශෛලිය සඳහා පදනම් වූ මාධ්‍ය හා ශිල්ප ක්‍රම විස්තර කිරීම
- ඉන්දු නිම්න කලා නිර්මාණවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කිරීම

**ඇමුණුම 7.3.1.1**

## කාර්ය පත්‍රිකාව

- ප්‍රදර්ශනය කර ඇති ඉන්දු නිම්න කලා නිර්මාණ හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- ඉන්දු නිම්න කලා නිර්මාණවල පවතින සුවිශේෂී ලක්ෂණ හඳුනාගන්න.
- පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
    1. ඉන්දු නිම්න ශිෂ්ටාචාරය පිළිබඳ ඓතිහාසික පසුබිම හා භූගෝලීය පිහිටීම කෙටියෙන් පැහැදිලි කරන්න.
    2. ඉන්දු නිම්න මූර්ති හා කැටයම් නම් කර එක් එක් නිර්මාණ පිළිබඳ පහත කරුණු ඔස්සේ ඇගයීමක් කරන්න.
        - යුගය සහ කාලය
        - හමුවන ස්ථානය
        - මාධ්‍යය
        - ශිල්ප ක්‍රමය
        - කලාත්මක ලක්ෂණ
            - රූප භාවිතය හා ස්වභාවය
            - භාව ප්‍රකාශනය

- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

ඇමුණුම 7.3.1.2

# කියවීම් පත්‍රිකාව

- ඉන්දු නිම්න ශිෂ්ටාචාරය මෙසපොටේමියානු, මිසර වැනි පූර්ව ඓතිහාසික උසස් ශිෂ්ටාචාර හා සම තත්ත්වයේ ලා සැලකිය හැකි ය. පුරා විද්‍යාඥ ශ්‍රීමත් ජෝන් මාෂල්ගේ විශ්වාසය වූයේ මෙම ශිෂ්ටාචාරය ක්‍රි.පූ. 3250 - 2750 අතර කාල වකවානුවට අයත් බව ය. එම ශිෂ්ටාචාරයේ ස්වර්ණමය කාලය ක්‍රි.පූ. 2500 - 1500 අතර වශයෙන් ඉන්දියානු පුරා විද්‍යාඥයින් විසින් දක්වයි.
- මෙම ශිෂ්ටාචාරය මොහෙන්ජොදාරෝ හරප්පා ශිෂ්ටාචාර වශයෙන් ද හඳුන්වනු ලබයි.
- හින්දි භාෂාවෙන් "මෙහොන් - ජො දාරෝ" යනු මළවුන්ගේ ගොඩැල්ලයි. එය වර්තමාන පකිස්ථානයට අයත් සින්ධ්හි ලර්කානා දිස්ත්‍රික්කයේ පිහිටා ඇත.
- හරප්පාව වර්තමාන පකිස්ථානයේ බටහිර පන්ජාබ් ප්‍රදේශයේ මොන්ට්ගෝමරි දිස්ත්‍රික්කයේ රවි නදී ඉවුරේ පිහිටා ඇත.
- ඉන්දු නිම්න ශිෂ්ටාචාරය විශාල භූමි ප්‍රදේශයක පැතිරී පවතින අතර මෙම සභ්‍යත්වයට අයත් ස්ථාන 70 ක් පමණ සොයාගෙන ඇත.
- මොහෙන්ජොදාරෝ හා හරප්පා ශිෂ්ටාචාරයට අයත් නගර වැසියන් උසස් කලා කෞශලයෙන් යුක්ත ජන කොටසක් බව කැණීම්වලදී හමු වූ ද්‍රව්‍ය හා මෙවලම්වලින් පැහැදිලි වේ. මෙම කලා නිර්මාණ පහත පරිදි හඳුනාගත හැකි ය.
  - ගල් හා ලෝහ ප්‍රතිමා
  - ආභරණ හා මෙවලම්
  - මුද්‍රා
  - සෙල්ලම් බඩු
  - වාස්තු විද්‍යා නිර්මාණ

## ඉන්දු නිම්න ශිෂ්ඨාචාරයේ මූර්ති

පූජක රුව



- පූජක රුව සොයාගෙන ඇත්තේ මොහෙන්ජොදාරෝ නගරයෙනි.
- මෙයින් පුරුෂයකුගේ උඩුකය දැක්වේ.
- ජීවමාන කෙනෙකු නිරූපණය කිරීමට ගත් උත්සාහයක් ලෙස පෙනේ.
- සෙ.මී. 19 ක් උස ය. සුදු හුණු ගලින් නිමවා ඇත.
- මෙයින් පූජකවරයකු නිරූපණය වන බව සාමාන්‍ය පිළිගැනීමයි.
- ඒකාංශ කරන ලද සළුව, අඩවන් දෙනෙත් හා හිස අඩක් මුඩු කොට තිබීම මෙම රූපය භාවනානුයෝගී පූජක රුවක් ලෙස හැඳින්වීමට හේතු වී ඇත.
- ඒකාංශ කරන ලද සළුවෙහි පෙති තුනක මලක හෝ කොළයක හැඩය ගත් රටාවකින් සරසා ඇත.
- නළල මත ගාංචුව සහිත නලල් පටියකි.
- තත්ත්වාකාර නිරූපණ ස්වරූපයට වෙසසින් වෙනස් වූ ශෛලීගත සම්ප්‍රදායක් අනුව නිරූපණය කරන හැඩතල මෙහි දක්නට ඇත.

නළඟන



- කලා විචාරකයින්ගේ සැලකිල්ල යොමු වූ නිර්මාණ අතර හරප්පාවෙන් හමු වූ ලෝකඩ නළඟනගේ රුව ද ප්‍රධාන තැනක් ගනියි.
- ඉන්දු නිම්න වැසියෝ ලෝහ වාත්තු කිරීමේ තාක්ෂණයෙන් පරිණතව සිටි බවට මෙම ලෝහයෙන් කරන ලද නළඟන රුව හොඳ ම සාධකයකි.
- ලෝහ වාත්තු කිරීමේ ශිල්ප ක්‍රමයෙන් පූර්ණ උන්නතව නිමවා ඇති මෙහි උස අඟල් 4 1/2 කි.
- කාන්තා නාරි දේහයේ ලාලිත්‍ය මනාව මතු කොට දක්වා ඇත.
- ඇස් අඩවන් ය. ප්‍රකෝපකාර ඉරියව්වකින් සිට ගෙන එක් අතක් ඉනෙහි තබාගෙන එක් කකුලක් අඩක් නැමී සිටින ආකාරයෙන් නිමවා ඇත.
- කෙසඟ නග්න රුවක් වූ මෙම කාන්තා රුව කලාත්මක ය.
- ගෙල බැඳි මාලයත්, දෙඅත්හි ඇති වළලුත් මෙහි දැකිය හැකි ආභරණයන් ය. එය එකල ඉන්දු නිම්න වැසියන් ආභරණ පැළඳීම පිළිබඳ ප්‍රබල සාක්ෂියකි.
- මෙයින් දෙවොලක රඟන ස්ත්‍රියක් නිරූපණය වේ යැයි මතයකි. දැනට නවදිල්ලි ජාතික කෞතුකාගාරයේ තැන්පත් කොට ඇත.

**රතු වැලි ගලින් කළ කවන්ධ මිනිස් රුව**




- මානව දේහයේ සුන්දරත්වය ඉතා සියුම් ලෙස හා මට සිලිටු ලෙස දක්වා ඇති කවන්ධ මිනිස් රුව ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් හමු වූ උසස් කලා කෘතියකි.
- ග්‍රීක සම්භාව්‍ය කෘතිවල මූර්තිමය ලක්ෂණ දක්නට ඇත. මූර්තිය මනාව ඔපමට්ටම් කිරීමෙන් මස් පිඬුවල ස්වභාවිකත්වය පෙන්නුම් කර ඇත.
- අඟල් 4 (සෙ.මී.10) පමණ උස ය. රතු පැහැති හුණු ගලින් නිමවා ඇති මෙය පූර්ණ උන්නත මූර්තියකි. මෙය සොයා ගෙන ඇත්තේ හරප්පාවෙනි.
- මෙම මූර්තියෙන් අරෝහ පරිනාහ පුරුෂයකුගේ ලක්ෂණ නිරූපණය කරයි. නග්න රුවක් වන මෙය ශිවගේ මූලාදර්ශ නිර්මාණයක් වශයෙන් හඳුන්වයි. ඊට හේතු වශයෙන් මූර්තියේ අත් හතරක සාධක දක්වයි.
- හිස අත් පා නොමැත. හිස සහ අත් පා වෙන ම කොටස් වශයෙන් තනා තිබෙන්නට ඇති බව පෙනේ. මෙම කොටස් සවිකිරීම සඳහා සිදුරු භාවිත කොට ඇති බව දැකිය හැකි ය.

**අළු වැලි ගලින් කළ කවන්ධ මිනිස් රුව**




- හරප්පාවෙන් හමුවන මෙම කවන්ධ මිනිස් රුව පූර්ණ උන්නත ශිල්ප ක්‍රමයට අළු වැලි ගලින් නිර්මාණය කර ඇත.
- උස සෙ.මී. 10 කි. වම් කකුල ඉහළට ඔසවාගෙන සිටින නර්තන විලාශයක් පෙන්නුම් කෙරේ.
- මෙයින් ශිව දෙවියන්ගේ එක් වේෂයක් වන නටරාජ නර්තන ස්වරූපය පෙන්නුම් කරන බව විචාරක අදහසයි.
- ග්‍රීක, රෝම, සම්භවය මූර්ති නිර්මාණවල දක්නට ලැබෙන ස්වභාවික තාත්වික ලක්ෂණ මෙම කවන්ධ රූපයෙන් ප්‍රකට කෙරේ.

**ඉන්දු නිම්න ශිෂ්ඨාචාරයේ මුද්‍රා**

- ඉන්දු නිම්න ශිෂ්ටාචාරය ආශ්‍රිතව මුද්‍රා 2000 කට අධික සංඛ්‍යාවක් හමු වී ඇත.
- වෙළෙඳ භාණ්ඩවල ඇසුරුම් සලකුණු වශයෙන් යෙදීමට මෙම මුද්‍රා භාවිත කළ බව අනුමාන කරයි.
- මෙම මුද්‍රා දිගටි, අටපට්ටම් හා සතරැස් ආදී හැඩවලින් යුක්ත වේ.
- මෙම මුද්‍රා මත රූපවලට අමතරව අක්ෂර දක්නට ඇති අතර මේ අක්ෂර මේ වන තෙක් කියවීමට හඳුනාගෙන ඇත.
- මුද්‍රා මගින් ඉන්දු නිම්න වැසියන්ගේ ආගමික ඇදහිලි, විශ්වාස පිලබිඹු කරන අතර ඔවුන්ගේ ජීවන විලාසය, සංස්කෘතික ලක්ෂණ කලා කෞශල්‍යය හා තාක්ෂණික හැකියාව පිළිබඳ තොරතුරු අනාවරණය වේ.

**මොල්ලිය සහිත ගව රූපය**



- ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් හමු වූ ගව රූප සහිත මුද්‍රා විසි පහකටත් වැඩි ප්‍රමාණය අතරින් කලාත්මක ප්‍රකාශනයක් සහිත මුද්‍රාවකි.
- මෙහි ගවයාගේ ගති ස්වභාවය ඉතාමත් තාත්වික ලෙස නිරූපණය කර තිබේ.
- පාර්ශවදර්ශී ස්වරූපයෙන් යුතු ගව රූපයේ ශරීරාංග තුළින් ශක්තිය, තේජස හා ජව සම්පන්න බව හොඳින් ඉස්මතු වී පෙනේ.
- ශිව දෙවියන්ගේ වාහනය වූ නන්දි ගවයා මින් සංකේතවත් කරන බව අදහස් කෙරේ.
- බෙල්ලේ රැළි ශෛලීගත රටාවෙන් නිරූපණය කර ඇත. ගෙල වටා දමා ඇති තැල්ල මගින් මෙම මුද්‍රාව විසිතුරු වී ඇත.
- ඇතැම් මුද්‍රාවල ගව රූප අභියස සුවඳ දුම්, වැනි වස්තු දක්නට තිබූ නිසා මෙම ගව රූප අති පූජනීය වස්තු ලෙස සලකා පුද පූජා තබන්නට ඇතැයි සිතිය හැකි ය.
- මෙම මුද්‍රාවට අමතරව එක් අඟක් සහිත ගවයා, කොට අං සහිත ගව රූප ආදී ගව සංකේත සහිත මුද්‍රා විශාල සංඛ්‍යාවක් හමු වී ඇති බවට වාර්තා වේ.

**පශුපති (ශිව)**



- මෙම මුද්‍රාව අං සහිත දෙවියා ලෙස හඳුන්වයි.
- ඔහුගේ හිස මත අං යුගලක් සහිත ශිර්ෂාභරණයකි. එමෙන් ම ගෙළ හා දෙඅත් වස්ත්‍රාභරණවලින් සරසා ඇත.
- ආසනයට පහළින් මුවෝ දෙදෙනෙකි. එසේම දේව රූපය වටා රයිනෝ, වෘෂභ, හස්ති සහ කොටි රූප දැකගත හැකි ය.
- මෙම මුද්‍රාවෙන් නිරූපිත දෙවියන් ශිවගේ මූලාදර්ශයක් බව සර් ජෝන් මාෂල් මහතා පවසා ඇත. එනම් ශිවගේ එක් වේශයක් වන පශුපති (කෘෂි කර්මාන්තයට අධිපති) මින් නිරූපිත බවයි.
- දේවරූපය ඉදිරි පෙනුමෙන් යුතු වන අතර සෙසු සියලු සත්ව රූප පාර්ශවදර්ශී ස්වරූපයෙන් දක්වා ඇත.

**නිපුණතාව 7.0** : **දේශීය හා විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති කැටයම් හා ගෘහ නිර්මාණ කලාවන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ ස්වතන්ත්‍ර නිර්මාණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.4** : **ඊජිප්තු හා ග්‍රීක කලාකෘති අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.4.1** : **''ඊජිප්තු මූර්ති හා චිත්‍ර නිර්මාණ''**

**කාලච්ඡේද සංඛ්‍යාව** : **02 යි**

**ඉගෙනුම් පල** :
- ඊජිප්තු මූර්ති හා සිතුවම් නම් කරයි.
- ඊජිප්තු කලා නිර්මාණවල ඓතිහාසික පසුබිම සොයා බලයි.
- නිර්මාණාත්මක ශෛලිය සඳහා පදනම් වූ මාධ්‍ය හා ශිල්ප ක්‍රම විස්තර කරයි.
- ඊජිප්තු කලා නිර්මාණවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඊජිප්තු චිත්‍ර හා මූර්තිවල වර්ණ ඡායාරූප
  මූර්ති - ස්පින්ක්ස් (Sphinx)
  ලියන්නා (Scribe )
  නෙෆර්ටිටි ( Nefertiti )
  චිත්‍ර - මීඩම්හි පාත්තයෝ (Geese of Meidum )
  කුරුලු දඩයම (Fowling Scene)
- ඇමුණුම් 7.4.1.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම් 7.4.1.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 7.4.1.1** :
- ඊජිප්තු චිත්‍ර, මූර්ති පිළිබඳව සිසු අවධානය යොමු කරවන්න.
- එම කලා නිර්මාණ පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
- ඊජිප්තු චිත්‍ර, මූර්ති නිර්මාණයන්ට අදාළ තොරතුරු එක්රැස් කිරීමට සිසුන් යොමු කරවන්න.

(මිනිත්තු 15 යි)

**පියවර 7.4.1.2** :
- ඇමුණුම 7.4.1.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- ඇමුණුම 7.4.1.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- කියවීම් පත්‍රිකාව ඇසුරින් පිළිතුරු සැපයීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- පිළිතුරු සැපයීමට සිසුන්ට සහාය වන්න.

(මිනිත්තු 50 යි)

**පියවර 7.4.1.3** :
- අහඹු ලෙස තෝරාගත් සිසුන් කිහිප දෙනෙකුගේ පිළිතුරු පත් ඇගයීමට ලක් කරන්න.
- සමස්ත පාඩම පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 15 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 7.4.1.1 හා ඇමුණුම 7.4.1.2 පදනම් කර කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- ඊජිප්තු මූර්ති හා සිතුවම්වල වස්තු විෂයයන් හා එම නිර්මාණ නම් කිරීම
- ඊජිප්තු කලා නිර්මාණවල ඓතිහාසික පසුබිම සොයා බැලීම
- නිර්මාණාත්මක ශෛලිය සඳහා පදනම් වූ මාධ්‍ය හා ශිල්ප ක්‍රම විස්තර කිරීම
- ඊජිප්තු කලා නිර්මාණවල සුවිශේෂී කලා ලක්ෂණ ඇගයීම

**ඇමුණුම 7.4.1.1**

## කාර්ය පත්‍රිකාව

- ප්‍රදර්ශනය කර ඇති ඊජිප්තු කලා නිර්මාණ හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- ඊජිප්තු කලා නිර්මාණවල පවතින සුවිශේෂී ලක්ෂණ හඳුනාගන්න.
- පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
    1. ඊජිප්තු ශිෂ්ටාචාරය පිළිබඳ ඓතිහාසික පසුබිම කෙටියෙන් පැහැදිලි කරන්න.
    2. ඊජිප්තු මූර්ති නම් කර, එක් එක් මූර්ති නිර්මාණ පිළිබඳ පහත කරුණු ඔස්සේ ඇගයීමක් කරන්න.
        - යුගය සහ කාලය
        - හමුවන ස්ථානය
        - නිර්මාණ ශිල්පියා
        - ශෛලිය
        - මාධ්‍යය
        - ශිල්ප ක්‍රමය
        - කලාත්මක ලක්ෂණ
            - රූප භාවිතය හා ස්වභාවය
            - බාව ප්‍රකාශනය

    5. ඊජිප්තු සිතුවම් නම් කර, එම නිර්මාණ පිළිබඳ පහත කරුණු යටතේ ඇගයීමක් කරන්න.
        - යුගය සහ කාලය
        - හමුවන ස්ථානය
        - ශෛලිය
        - ශිල්ප ක්‍රමය
        - වර්ණ භාවිතය
        - රේඛාකරණය
        - තලය මත රූප භාවිතය
        - ප්‍රකාශනය
- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

**ඇමුණුම 7.3.1.2**

## කියවීම් පත්‍රිකාව

- නයිල් ගංගාධාරය පදනම් ව ව්‍යාප්ත වූ ලෝකයේ ඉපැරණි ම ශිෂ්ටාචාරයක් වන ඊජිප්තු ශිෂ්ටාචාරය ක්‍රි. පූ. 3000 - 30 අතර කාල පරාසයට අයත් වේ.
- ඊජිප්තුව පාරාවරුන්ගේ බල පරාක්‍රමය ලොවට කියාපාන සුවිශාල පිරමීඩ, ගෘහ නිර්මාණ, චිත්‍ර මූර්ති ආදී කලා නිර්මාණ සඳහා පදනම වූයේ ඔවුන් දැඩි ලෙස විශ්වාස කළ මරණින් මතු ආත්මය පිළිබඳ සංකල්පය යි.
- අමර්ණා, ගීසා සහ තීබ්ස් යන නගර ආශ්‍රිතව ඊජිප්තු නිර්මාණ රැසක් හමුවේ.

**ඊජිප්තු මූර්ති**

- ස්පින්ක්ස් (Sphinx)
- ලියන්නා හෙවත් ලේඛකයා (Scribe)
- නෙෆර්ටිටි (Nefertiti )

**ඊජිප්තු චිත්‍ර**

- මීඩම්හි පාත්තයෝ (Geese of Meidum)
- කුරුලු දඩයම (Fowling scene)

## ඊජිප්තු මූර්ති නිර්මාණ


**ස්පින්ක්ස්** (SPHINX )





- ක්‍රි.පූ. 2440 ට පමණ අයත් ස්පින්ක්ස් මූර්තිය කුෆු පිරමීඩය ඉදිරිපිට පිහිටි උසින් අඩි 66ක් හා පළලින් අඩි 240ක් වන ඉපැරණි මූර්තියක් ලෙස හඳුන්වා දිය හැකි ය.
- ඊජිප්තු කලාවේ ස්පින්ක්ස් මූර්ති රැසක් හමුවූවත් ප්‍රධාන පිරමීඩය අසල හමුවන මහා ස්පින්ක්ස් (GREAT SPHINX ) නම් මූර්තිය සුවිශේෂී ය. මිනිස් මුහුණ සමග සත්ත්ව ශරීරය (සිංහ) එකට බද්ධ කිරීමෙන් සැකසුණු මෙම නිර්මාණය ඊජිප්තු කලාවේ කල්පිත මූර්ති සඳහා දිය හැකි කදිම නිදසුනකි.
- ස්පින්ක්ස් නිර්මාණය පාරාවරුන්ගේ තෙදබලපරාක්‍රමය මෙන් ම ආරක්ෂාව පිළිබඳ සංකල්පය නිරූපණය කරන බව විචාරක මතය යි.

## ලියන්නා හෙවත් ස්ක්‍රයිබ් (SCRIBE)





- ලියන්නා හෙවත් ස්ක්‍රයිබ් (Scribe) මූර්තිය ඊජිප්තු මූර්ති කලාවේ පැරණි යුගයට අයත් නිර්මාණයකි.
- ස්ක්‍රයිබ් නමින් හඳුන්වන මූර්ති කිහිපයක් ම ඊජිප්තු කලාවෙන් හමු වී ඇතත්, දැනට ප්‍රංශයේ ලූවර් කෞතුකාගාරයේ තැන්පත් කර ඇති මෙම ස්ක්‍රයිබ් රුව ඊජිප්තු මූර්ති කලාවේ විශිෂ්ට නිර්මාණයකි.
- හුණු ගලින් කළ, අඩි 2 ක් පමණ උස් වූ මෙය ත්‍රිකෝණාකාර ආකෘතියකින් යුතු වුවකි.
- දැව මාධ්‍යයෙන් පූර්ණ උන්නත ශිල්පක්‍රමය නිර්මාණය කර ඇත. ක්‍රිස්ටල් වර්ගයේ ගලින් ඇස්වල කුහර පුරවා ඇත.
- ක්‍රි.පූ. 2600ත් 2350ත් අතර කාලයට අයත් මෙම මූර්තිය වර්ණ ගැන්වූ නිර්මාණයකි.
- සක්කාරා ප්‍රදේශයේ සොහොන් ගෙයකින් හමු වු ස්ක්‍රයිබ් මූර්තිය තම ස්වාමියා පවසන යමක් ලිවීමට සැරසී සිටින ආකාරය නිරූපිත ය.

## නෙෆර්ටිටි (NEFERTITI)







- ඊජිප්තුවේ අමර්ණා යුගය හෙවත් නව රාජධානි සමයේ නිර්මාණය වූ නෙෆර්ටිටි අධිරාජිනියගේ රුව දැනට බර්ලින් කෞතුකාගාරයේ තැන්පත් කර ඇත.
- මෙය පූර්ණ උන්නත ශිල්ප ක්‍රමයට නිර්මාණය කරන ලද කාන්තා උඩුකය පිළිරුවකි.
- ඊජිප්තු කලා නිර්මාණවල දැකිය හැකි ශෛලිගත සම්ප්‍රදායෙන් මිදී ස්වභාවික ශෛලීය ලක්ෂණ මෙම මූර්තියෙන් දැකිය හැකි ය.
- උස අඟල් 20 ක් වන මෙම මූර්තිය හුණු ගල් මාධ්‍යයෙන් නිර්මාණය කර වර්ණ ගන්වා ඇත.
- ඊජිප්තු පාරා රජෙකු වූ නව රාජධානි යුගයේ අක්නේටන් (Akhenaten) රජුගේ බිසව ලෙසට සැලකෙන නෙෆර්ටිටි මූර්තිය ක්‍රි. පූ. 1375 පමණ කාලයට අයත් ය.
- මූර්තියට අලංකාරයක් ගෙන දෙන හිසෙහි පැළඳි විසිතුරු දිගැටි ඔටුන්න හා ගෙලෙහි පැළඳි මාලයේ අධිරාජිනියක සතු තේජෝබලපරාක්‍රමය පෙන්වයි.

**ඊජිප්තු චිත්‍ර නිර්මාණ**

- ඊජිප්තු චිත්‍ර නිර්මාණ සොහොන් ගෙවල් වන පිරමීඩ හා දේවස්ථාන තුළ ද දැකිය හැකි ය.
- ද්විමාන බව, පාර්ශවගත බව මෙම චිත්‍ර නිර්මාණයන්ගේ දැකිය හැකි විශේෂ ලක්ෂණ ය.
- වර්ණ යෙදීමේ දී ද බොහෝ විට පැතලි ක්‍රමයට වර්ණ යොදා ඇත.
- කල්පිත සංකල්ප මෙන්ම, ජන ජීවිතයේ විවිධ සිද්ධි, රජවරුන්, බිසෝවරුන්, හා සැබෑ සිද්ධි මිසර ගෘහ නිර්මාණ තුළ දැකිය හැකි විය.
- ඊජිප්තු සිතුවම් අතර සටහන් කර ඇති හයරොග්ලිපික්ස් (Hieroglyphics) හෙවත් රූපාක්ෂර ලේඛනකරණයේ පළමු අවස්ථාව වශයෙන් අදටත් පුරාවිද්‍යාඥයින්ගේ ගවේෂණයට හා නිරීක්ෂණයට ලක් වූවකි.

**මීඩම් හි පාත්තයෝ** (GEESE OF MEDIUM)



- මෙම සිතුවම ක්‍රි.පූ. 2630 ට පමණ අයත් ඊජිප්තු පැරණි රාජධානි යුගයට අයත් චිත්‍ර නිර්මාණයකි.
- මීඩම් හි මස්ටාබා වර්ගයකට අයත් සොහොන් ගෙයකින් හමු වී ඇති මෙම සිතුවමින් නිරූපණය වන්නේ එකා පසු පස එකා ගමන් කරන පාත්තයන් සමූහයකි. එම පාත්තයන් හය දෙනා තිදෙනා බැගින් දෙපැත්තට එකා පසුපස ගමන් කරන අයුරක් පෙන්වයි.
- රූප තලය මත සම්පිණ්ඩනය කිරීමේ දී ඉදිරියේම සිටින පාත්තයාගේ හිස බිමට නැඹුරු කරගත් ආකාරයට ඇඳ ඇති අතර ක්‍රියාකාරී බවක් ද, සතුන්ගේ ඉරියව් ක්‍රමිකව දැක්වීමට ද ශිල්පියා උනන්දු වී ඇත.
- වර්ණ යෙදීමේ දී කළු, සුදු, දුඹුරු වර්ණවල විවිධ ප්‍රභේද මතුවන ලෙස යොදා ඇති අතර රේඛාකරණය මගින් සියුම් ලෙස විස්තරාත්මක හැඩ දක්වා ඇත. මෙම ලක්ෂණ ඊජිප්තු මානව රූප චිත්‍ර සඳහා අනුගමනය නොකරන ලද ලක්ෂණයකි. එනම් එය ස්වභාවික ලක්ෂණ සඳහා වර්ණ හා රේඛාකරණය මගින් ත්‍රිමාන ලක්ෂණ මතුකිරීමක් වශයෙන් හඳුනාගත හැකි ය.


## කුරුලු දඩයම ( FOWLING SCENE )











- කුරුලු දඩයම චිත්‍රය ක්‍රි.පූ. 1580ත් 1350ත් අතර කාලයේ නව රාජධානි යුගයට අයත් යයි සැලකේ.
- මෙය තීබ්ස්වල නෙබාමුන් (Nebamun) සොහොන් ගැබෙන් හමු වී ඇති වර්ණ කළ සිතුවමක් වේ.
- සිතුවමෙන් දැක්වෙන්නේ ඊජිප්තු වංශාධිපතියෙකු වූ නෙබාමුන් නයිල් නදියේ ඔරුවක නැගී තම අත ඇති හුමරංගය භාවිත කරමින් කුරුල්ලන් දඩයම් කරන ආකාරයයි. ඔහුගේ එක් අතක අල්ලාගත් පක්ෂීන් තිදෙනෙකි. සිතුවමෙහි දක්වෙන කාන්තා රූප ඔහුගේ දියණිය හා භාර්යාව ලෙසට අදහස් කෙරේ.
- පැපිරස් පඳුරු අතර පක්ෂීන් දැක්වෙන අතර ඒ අසළ වූ දඩයම් බළලා පාදවලින් පක්ෂීන් දෙදෙනෙකු ද කටින් තවත් පක්ෂියෙකු ද අල්ලාගෙන සිටින ආකාරය දක්වා ඇත.
- මානව රූප ශෛලීගත හා පාර්ශවදර්ශී ස්වරූපයෙන් හා සතුන් සහ ශාක පත්‍ර ඉතා ස්වභාවිකව චිත්‍රණය කර ඇත.
- තිරු චිත්‍ර සංරචනයක් වන මෙම නම් කරන චිත්‍ර රාමුව තුළ සිද්ධි ගණනාවක එකතුවකින් සමන්විත වන අතර එමගින් චිත්‍රයේ ක්‍රියාකාරී බව නිරූපණය කරවයි.
- වියළි බදාමයක් මත වන ප්‍රස්කෝ සිකෝ ශිල්ප ක්‍රමයට අඳින ලද බිතු සිතුවමකි.
- රූප වර්ණ ගැන්වීම සඳහා අඳුරු කහ, රතු. සුදු, කළු ආදී වර්ණ භාවිත කර ඇති අතර මෙම වර්ණ ද්විමාන ලක්ෂණ සහිත ය.
- චිත්‍රයේ පසුබිමේ හයරොග්ලිපික්ස් (Hieroglyphics) හෙවත් රූපාක්ෂර දැකිය හැකි ය.
- දැනට මෙය ලන්ඩනයේ බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තැන්පත් කර ඇත.

**නිපුණතාව 7.0** : **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලාවන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.4** : **ඊජිප්තු හා ග්‍රීක කලාකෘති අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.4.2** : **ග්‍රීක මූර්ති නිර්මාණ**

**කාලච්ඡේද සංඛ්‍යාව** : **02 යි**

**ඉගෙනුම් පල** :
- ග්‍රීක මූර්ති නිර්මාණ නම් කරයි.
- ග්‍රීක කලා නිර්මාණවල ඓතිහාසික පසුබිම සොයා බලයි.
- නිර්මාණාත්මක ශෛලිය සඳහා පදනම් වූ මාධ්‍ය හා ශිල්ප ක්‍රම විස්තර කරයි.
- ග්‍රීක කලා නිර්මාණවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- ග්‍රීක මූර්තිවල වර්ණ රූප
  - විනස් ඩි මෙලෝ (Venus de Milo)
  - කවපෙත්ත විසිකරන්නා (Discobolus)
  - හර්මීස් සහ ඩයොනීසස් (Hermes and Dionysus)
  - ඇතීනා දෙවඟන (Athena Parthenon)
  - ලැඔකූන් (Laocoon)
- ඇමුණුම් 7.4.2.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම් 7.4.2.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 7.4.2.1** :
- ග්‍රීක මූර්ති නිර්මාණවලට අදාළ පින්තූර ප්‍රදර්ශනය කරමින් සිසුන්ගේ අවධානය ලබා ගන්න.
- එම කලා නිර්මාණ පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- ග්‍රීක මූර්ති නිර්මාණයන්ට අදාළ තොරතුරු එක්රැස් කරවීමට සිසුන් යොමු කරවන්න.

(මිනිත්තු 15 යි)

**පියවර 7.4.2.2** :
- ඇමුණුම 74.2.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- ඇමුණුම 7.4.2.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව කියවීමට අවස්ථාව සිසුන්ට ලබා දෙන්න.
- කියවීම් පත්‍රිකාව ඇසුරින් පිළිතුරු සැපයීමට සිසුන්ට උපදෙස් දෙන්න.

(මිනිත්තු 50 යි)

**පියවර 7.4.2.3** : 
- සුදුසු ක්‍රමවේදයන් භාවිත කර පිළිතුරු පරීක්ෂාවට ලක් කරන්න
- සමස්ත ක්‍රියාකාරකම පිළිබඳ සමාලෝචනයක නිරතවන්න.

(මිනිත්තු 15යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 7.4.2.1 හා ඇමුණුම 7.4.2.2 පදනම් කර කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- ග්‍රීක මූර්ති නිර්මාණවල වස්තු විෂය හා එම නිර්මාණ නම් කිරීම
- ග්‍රීක කලා නිර්මාණවල ඓතිහාසික පසුබිම සොයා බැලීම
- නිර්මාණාත්මක ශෛලිය සඳහා පදනම් වූ මාධ්‍ය හා ශිල්ප ක්‍රම විස්තර කිරීම
- ග්‍රීක කලා නිර්මාණවල සුවිශේෂී කලා ලක්ෂණ ඇගයීම

**ඇමුණුම 7.4.2.1**

## කාර්ය පත්‍රිකාව

- ප්‍රදර්ශනය කර ඇති ග්‍රීක කලා නිර්මාණ හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- ග්‍රීක කලා නිර්මාණවල පවතින සුවිශේෂී ලක්ෂණ හඳුනාගන්න.
- පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  1. ග්‍රීක කලා නිර්මාණවල ඓතිහාසික පසුබිම කෙටියෙන් පැහැදිලි කරන්න.
  2. ග්‍රීක මූර්ති නිර්මාණ නම් කරන්න.
  3. මෙම එක් එක් නිර්මාණ පිළිබඳ හැඳින්වීමක් කරන්න.
     - යුගය සහ කාලය
     - නිර්මාණ ශිල්පියා
  4. මූර්ති නිර්මාණවල කලාත්මක ශෛලිය සඳහා පදනම් වූ පහත අංග විස්තර කරන්න.
     - සම්ප්‍රදාය
     - මාධ්‍ය
     - ශිල්ප ක්‍රම
     - කලාත්මක ලක්ෂණ
       - රූප භාවිතය හා ස්වභාවය
       - භාව ප්‍රකාශනය
- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

**ඇමුණුම 7.4.2.2**

## කියවීම් පත්‍රිකාව

**වීනස් දී මෙලෝ** (Venus de Milo)







- ප්‍රංශයේ ලූවර් කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා ඇති වීනස් ඩි මෙලෝ ප්‍රතිමාව ග්‍රීක සම්භාව්‍ය යුගයට අයත් කලා ලක්ෂණ සහිත නිර්මාණයකි.
- දෙඅත් කැඩී බිඳී ඇති මෙම කිරිගරුඬ ප්‍රතිමාව, ක්‍රි. ව. 1820 දී මේලෝ දිවයිනෙන් සොයා ගත්තකි.
- වමතට ගත් කැඩපතින් සිය රූසපුව නරඹන කාන්තාවක නිරූපණය වන බව විචාරක අදහසයි.
- කාන්තාවකගේ සුන්දරත්වය මෙන් ම නාරිදේහයේ ලාලිත්‍ය ස්වභාවය මැනවින් දක්වා ඇති මෙම මූර්තිය ග්‍රීක මූර්ති නිර්මාණ අතර අග්‍රගන්‍ය නිර්මාණයක් ලෙස සැලකෙයි.
- රූපයේ බඳ වටා ඇති වස්ත්‍රයේ රැළි කඩා හැලෙන අයුරු ඉතා ස්වභාවික ලෙස නිරූපණය කර පෙන්වයි.
- "ඇන්ටිසොච්" නම් ශිල්පියා මෙම මූර්තිය නිර්මාණය කර ඇත.

## කවපෙත්ත විසිකරන්නා (Discobolus)









- කවපෙත්ත විසිකරන්නා මූර්තිය ග්‍රීක සම්භාව්‍ය යුගයට අයත් කලා ලක්ෂණයන් සහිත කෘතියකි.
- මෙම මූර්තියෙන් නිරූපණය වන්නේ කව පෙත්ත විසිකිරීමට සූදානම් වන ක්‍රීඩකයකුගේ ඉරියව්වකි.
- ක්‍රීඩා ඉරියව්වට අනුකූල ව පිරිමියකු සතු කායික ජවය, ශක්තිය, චලනය මෙන් ම සිරුරේ සමබරතාව හා රිද්මය ඉතා විශිෂ්ට ලෙස පෙන්නුම් කරන නිර්මාණයකි.
- මාංශ පේශී ක්‍රියාකාරත්වය සහිත ක්‍රීඩක ඉරියව්ව මැනවින් නිරූපණය කර ඇති මෙම මූර්තිය කිරිගරුඬ මාධ්‍යයෙන් නිර්මාණය කර ඇත.
- ක්‍රි. පූ. 450 ට පමණ අයත් කවපෙත්ත විසිකරන්නා මූර්තියෙහි මුල් කෘතිය ලෝකඩ මාධ්‍යයෙන් නිර්මාණය කර තිබෙන්නට ඇතැයි විශ්වාස කෙරෙන අතර එය මූර්ති ශිල්පි "මයිරන් (Myron)" ගේ නිර්මාණයකි.

**හර්මිස් සහ ඩයොනීසස් (Hermes and Dionysus)**







- ක්‍රි. පූ. 330-320 කාලයට අයත් මෙය ග්‍රීසියේ ඔලිම්පියාවෙන් හමු වූ පූර්ණ උන්නත විශිෂ්ට ග්‍රීක මූර්තියකි.
- ග්‍රීක සම්භාව්‍ය යුගයට අයත් කලා ලක්ෂණයන්ගෙන් යුතු මෙය ප්‍රැක්සිටෙල්ස් (Praxiteles) නැමති මූර්ති ශිල්පියා විසින් නිර්මාණය කරන ලද්දකි.
- මෙම මූර්තිය අඩි 7 අඟල් 1 ක් උසින් යුක්ත වන අතර කිරි ගරුඬ මාධ්‍යයෙන් නිමවා ඇත.
- හර්මිස් තම දකුණු පාදයට බරදී වම් පාදය දණහිසින් නවා සිටින අතර ඔහු විසින් ඩයොනීසස් නම් දරුවා වමතින් වඩාගෙන සිටියි.
- හර්මීස්ගේ රුවෙහි දකුණු අත බිඳ ඇති අතර ඉතිරි වූ කොටසින් එය ඉහළට ඔසවා සිටි අයුරක් නිරූපණය වේ.
- එම අතෙහි මිදි පොකුරක් තිබෙන්නට ඇතැයි විචාරකයින් විශ්වාස කරයි.
- මෙම මූර්තියෙන් පුරුෂ ශරීරයක දැකිය හැකි මාංශ පේෂීවල ස්වභාවය හා පෞරුෂ ලක්ෂණ පරිමාණ ලක්ෂණ සහිතව මැනවින් පෙන්නුම් කර ඇත.
- වම් අතින් දරා සිටින සළුව නිසා මූර්තියේ සමබරතාව සුරැකී ඇත.
- මෙහි දැක්වෙන ළදරුවාගේ රුවෙහි මුදු මොළොක් ස්වභාවය හා සුරතල් බව දැක්වීමට ශිල්පියා සමත් වී නැති බවක් පෙනී යයි.
- මෙම මූර්තිය දැනට ග්‍රීසියේ ඔලිම්පියාහි පුරාවිද්‍යා කෞතුකාගාරයේ තැන්පත් කොට ඇත.

ඇතීනා දෙවඟනගේ රුව (Athena Parthenon)







- මෙම ප්‍රතිමාව ක්‍රි. පූ. 5 සියවසේ විසූ පීඩියස් (Phidias) නම් ශිල්පියා විසින් නිර්මාණය කර ඇත.
- සම්භාව්‍ය යුගයට අයත් මෙම ප්‍රතිමාව අඩි 48 ක් පමණ උසින් යුතු ය.
- දැවයෙන් නිමවා රනින් හා ඇත් දළින් ආවරණය කරන ලද ඇතීනා දෙවඟනගේ රුව විශිෂ්ට නිර්මාණයකි.
- වම් අතින් හෙල්ලක් ද, පලිහක් ද දරයි.
- දකුණු අත්ලේ නයික් (Nike) හෙවත් ජයග්‍රහණය සංකේතවත් කරන ඉපැරණි ග්‍රීක දේවතාවියගේ රුවකි.
- පලිහ, පාදම, හිස් වැස්ම, පාවහන් සියල්ල ග්‍රීක පැරණි ජනප්‍රවාද දර්ශනවලින් අලංකාර කර ඇත.
- සිනිඳු ඇඳුමට අයත් රැළි සියුම් ලෙස මතු කිරීමට ශිල්පියා සමත් වී ඇත.
- ප්‍රතාපවත් බව, රණ ශූරත්වය, එඩිතර බව, ඍජු බව යන ලක්ෂණ සහිතව කාන්තා සුන්දරත්වය මෙම ඇතීනා රුවෙන් මනාව නිරූපණය කර පෙන්වයි.

### ලැඔකූන් මූර්තිය (Laocoon)







- ලැඔකූන් මූර්තිය ග්‍රීක හෙලනිස්තික් යුගයට අයත් කලා ලක්ෂණ සහිත නිර්මාණයක් ලෙස සැලකේ.
- මෙය කිරිගරුඬ මාධ්‍යයෙන් නිම කළ කලා කෘතියකි.
- දැවැන්ත මුහුදු සර්පයෙකුගෙන් බේරීම සඳහා පියෙකු හා පුතුන් දෙදෙනෙකු ගන්නා උත්සාහය මෙමඟින් නිරූපණය වෙයි.
- පියාගේ මහලු බවත්, පුතුන්ගේ තාරුණ්‍යයත් මතුකොට දක්වා ඇති මෙම මූර්තියෙන් මහලු පියාගේ ධෛර්ය සම්පන්න බවත්, ශක්තියත්, සර්පයාගෙන් ගැළවීමට ගන්නා උත්සාහයත් මැනවින් නිරූපණය කොට ඇත.
- යථාර්ථවාදී ශෛලියට අනුගත ව මුහුණේ වේදනාව, භය, ත්‍රාසය හා උත්සාහවන්ත බව මැනවින් ප්‍රකාශිත ය.
- උස අඩි 8 ක් වන මෙම මූර්තිය දැනට රෝමයේ වතිකානු කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා ඇත.